# 1 පරිච්ඡේදය

# සාර්ව ආර්ථික ප්‍රවණතා

## සාරාංශය

ශ්‍රී ලංකාව, විවිධ අංශ කරා ව්‍යාප්ත වූ පුළුල් ආර්ථික ප්‍රගතියක් 2024 වසරේ දී වාර්තා කළේය. නිදහසින් පසු ඉතිහාසයේ වාර්තා වූ දරුණුතම ආර්ථික අර්බුදයෙන් වසර දෙකකට පසු මෙම යථා තත්ත්වයට පත්වීම වාර්තා විය. 2022 වසරේ මැද භාගයේ සිට ක්‍රියාත්මක කරන ලද ඵලදායී සහ නිවැරදි කිරීමේ රාජ්‍ය මූල්‍ය මෙන්ම මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග වඩාත් ස්ථායි ආර්ථික පරිසරයක් ඇති කිරීමට හේතු වූ අතර තිරසාර වර්ධනයක් සඳහා මග පෑදීය. දැනට ක්‍රියාත්මකවන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජා.මූ. අරමුදලේ) විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන, අවසාන අදියරේ පවතින විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සහ ආයෝජක විශ්වාසය වැඩිදියුණු වෙමින් පැවතීම මෙම ආර්ථික ප්‍රගතිය සඳහා සහාය විය. මෙම නිවැරදි කිරීමේ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල ධනාත්මක බලපෑම දැනටමත් ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශවල ප්‍රවණතා මගින් පෙන්නුම් කෙරේ. දේශීය මිල ස්ථායිතාව පවත්වා ගැනීමේ ප්‍රධාන අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා මහ බැංකුව දැරූ උත්සාහයේ ප්‍රතිඵල පැහැදිලිව දැකගත හැකිය. අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ සිදු වූ පෙර නොවූ ආකාරයේ මිල ගණන් ඉහළ යෑම් මගින් මහජනතාව, ව්‍යාපාර මෙන්ම සමස්ත ආර්ථිකය මත අහිතකර බලපෑම් ඇති කළේය. කෙසේ වෙතත්, මෙම තත්ත්වය නිවැරදි කිරීම සඳහා වූ මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මෙන්ම දැඩි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය සහ හිතකර ගෝලීය මිල ප්‍රවණතා සමඟ උද්ධමනය 2023 වසරේ සිට සැලකිය යුතු නිර්-උද්ධමන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. පරිපාලිත සහ පිරිවැය පිළිබිඹු කරන බලශක්ති මිල ගණන් සැලකිය යුතු ලෙස පහළ දැමීම 2024 සැප්තැම්බර් මාසයේ සිට උද්ධමනය සෘණ අගයක් ගැනීම සඳහා හේතු විය. දැනට තාවකාලිකව පවතින අවධමන තත්ත්වය, ජීවන වියදම මෙන්ම නිෂ්පාදන පිරිවැය යම් ප්‍රමාණයකට අඩු කිරීමට සහාය වනු ඇත. ලිහිල් මුදල් ප්‍රතිපත්තිය වෙළඳපොළ පොලී අනුපාතික පුළුල් ලෙස අඩු කිරීමට හේතු වූ අතර, ව්‍යාපාර සහ කුටුම්භවල පරිභෝජනය සඳහා ණය මෙන්ම ආයෝජන ද දිරිගැන්වීය. එහි ප්‍රතිඵලයක් ලෙස, විශේෂයෙන් 2024 වසරේ දෙවන භාගයේ දී, මූල්‍ය ආයතන විසින් පෞද්ගලික අංශයට ණය ලබා දීම ඉහළ ගියේය. අභියෝගාත්මක ගෝලීය වාතාවරණය මධ්‍යයේ විදේශීය අංශය සැලකිය යුතු ලෙස ස්ථාවරවීමක් පෙන්නුම් කළේය. මේ අතර, අවසාන අදියරේ පවතින විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන සාර්ථක ලෙස අඛණ්ඩව පවත්වාගෙන යෑම විදේශීය අංශය ශක්තිමත් වීමට සහාය විය. වෙළඳ භාණ්ඩ ආනයන යථා තත්ත්වයට පත්වීමත් සමඟ වෙළඳ ගිණුමේ හිඟය පුළුල් වුවද, 2024 වසර තුළ දී සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවෙන් අඛණ්ඩව දෙවන වසරටත් විදේශීය ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා කිරීමට හැකි විය. විදේශ විනිමය සැලකිය යුතු ලෙස රට තුළට ගලා ඒම, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ද්‍රවශීලතාව වර්ධනය වීම සඳහා සහාය විය. මෙම වර්ධනයන් හේතුවෙන් 2024 වසර තුළ දී ඉතිහාසයේ ඉහළම විදේශ විනිමය ප්‍රමාණයක් මිලදී ගැනීමට මහ බැංකුවට හැකි වීමත් සමඟ දළ නිල සංචිත ප්‍රමාණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, විනිමය අනුපාතිකය අඛණ්ඩව දෙවන වසරටත් අතිප්‍රමාණය විය. මේ අතර, 2024 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික ස්ථාවරත්වය ශක්තිමත් කිරීම සඳහා රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය. රාජ්‍ය ආදායම ඉහළ ගිය අතර, ප්‍රාථමික ශේෂයේ අතිරික්තයක් ද 2024 වසර තුළ දී වාර්තා විය. පුළුල් සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ සමස්ත ආර්ථිකයේ ප්‍රගතිය මෙන්ම ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ සාර්ථකත්වය මගින් රටේ ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම සඳහා ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ආයතන පෙළඹවූ අතර, එමගින් ආයෝජකයින් සහ ජාත්‍යන්තර ණය හිමියන් අතර රට කෙරෙහි විශ්වාසය යළි ස්ථාපිත කිරීම සඳහා සහාය සැලසිණි.

1

## 1.1 උද්ධමනය සහ මිල ප්‍රවණතා

### 1.1.1 උද්ධමනය[1]

**2024 වසර තුළ උද්ධමනය, වසර ආරම්භයේ දී ඉහළ යෑමකින් අනතුරුව සමස්තයක් ලෙස අඩුවීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, සැප්තැම්බර් මාසයේ සිට අවධමන මට්ටම් කරා ළඟා විය.** 2024 වසරේ මුල් කාලයේ දී උද්ධමනය ඉහළ යෑමට එකතු කළ අගය මත බදු වැඩිවීම, පාරිභෝගික පැසෙහි ඇති වියදම් අයිතම කිහිපයකින් එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම සහ සැලකිය යුතු ලෙස ආහාර උද්ධමනය ඉහළ යෑම හේතු විය. කෙසේ වෙතත්, 2024 වසරේ මාර්තු මාසයේ දී විදුලි ගාස්තු අඩු කිරීම සහ සංඛ්‍යානමය පදනම් බලපෑම හේතුවෙන් උද්ධමනය ඉහළ යෑම අඛණ්ඩව නොපැවතුණි. තවද, පැවති අඩු ඉල්ලුම් තත්ත්ව මධ්‍යයේ, එකතු කළ අගය මත බදුවල වූ වෙනස්කම් හේතුවෙන් ඇති වූ මිල ඉහළ යෑමෙන් කොටසක් ව්‍යාපාර විසින් අවශෝෂණය කර ගෙන තිබීමේ හැකියාවක් ද ඇත. ඒ අනුව, 2024 වසරේ මාර්තු මාසයේ සිට මතුපිට උද්ධමනය, 5%ක ඉලක්කයට වඩා අඩු, ධනාත්මක තනි අගය මට්ටම්වල පැවතුණි. පසුව, 2024 වසරේ ජූලි මාසයේ දී විදුලි ගාස්තු තවදුරටත් අඩු කිරීම ද මිල මට්ටම් පහළ යෑමට දායක වූ අතර, 2024 වසරේ මාර්තු සහ අගෝස්තු මාසවල වාර්තා වූ විශාල ඍණාත්මක මාසික ලක්ෂ්‍යමය උද්ධමනය මගින් මෙම පරිපාලන මිල වෙනස්වීම්වල බලපෑම උද්ධමනය තුළ පිළිබිඹු විය. තවද, ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් පහළ යෑම සහ ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම ද උද්ධමනය පහළ යෑමට දායක විය. අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ කුටුම්බ මුහුණ දුන් ඉහළ ජීවන වියදම ලිහිල් වීමට, මිල පීඩන මෙසේ අඩු වීම යම් තරමකට උපකාරී විය. මෙම තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය 0.5%ක අවධමනයක් වාර්තා කරමින් අවධමනකාරී මට්ටමකට ළඟා වූ අතර, පසුව අවධමනය තවදුරටත් ඉහළ ගියේය.[2] සමස්තයක් ලෙස, 2024 වසරේ දී ආහාර, බලශක්ති සහ ප්‍රවාහන අංශවල මිල ගණන් ඉහළ යෑම් අඩු මට්ටම්වල පැවතුණි. විශේෂයෙන් ම, 2024 වසරේ මාස කිහිපයක දී ම, ප්‍රධාන වශයෙන් ඉහත සඳහන් කළ විශාල විදුලි ගාස්තු අඩු කිරීම්, ගෝලීය බොරතෙල් මිල සාමාන්‍යකරණය වීම මධ්‍යයේ පිරිවැය පිළිබිඹු කරන ඉන්ධන මිල අඩු කිරීම් සහ ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම හේතුවෙන්, නිවාස, ජලය, විදුලිය, ගෑස් සහ අනෙකුත් ඉන්ධන කාණ්ඩය සහ ප්‍රවාහන කාණ්ඩය අවධමන වාර්තා කරන ලදී. ඒ අනුව, කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද., 2021=100)[3] මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය, 2023 වසර අවසානයේ වාර්තා වූ 4.0%ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට -1.7%ක් ලෙස වාර්තා වූ අතර, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2023 වසරේ දී වාර්තා වූ 17.4% සිට 2024 වසරේ දී 1.2%ක් දක්වා පහළ ගියේය. ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද., 2021=100)[4] මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය ද මීට සමාන හැසිරීමක් පෙන්නුම් කරමින්, 2023 වසර අවසානයේ වාර්තා වූ 4.2%ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට -2.0%ක් දක්වා පහළ ගිය අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මතුපිට උද්ධමනය 2023 වසරේ දී වාර්තා වූ 16.5% සිට 2024 වසරේ දී 1.6%ක් දක්වා පහළ ගියේය. මේ අතර, 2025 වසරේ පළමු කාර්තුවේ අවධමනය තවදුරටත් ඉහළ යෑමට 2025 වසරේ ජනවාරි මාසයේ දී විදුලි ගාස්තු පහළ දැමීම හේතු විය. 2025 වසරේ මුල් කාලයේ දී සමස්ත වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය පහළ යෑමට 2024 වසරේ මුල් කාලයේ දී සිදු කරන ලද එකතු කළ අගය මත බදු සංශෝධන හේතුවෙන් මිල ඉහළ යෑම් සහ කැපී පෙනෙන ආහාර උද්ධමනය හේතුවෙන් ඇති වූ සංඛ්‍යානමය පදනම් බලපෑම ද දායක විය. ඒ අනුව, 2025 වසරේ මාර්තු මාසයේ දී කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය -2.6%ක් ලෙස වාර්තා වූ අතර, 2025 වසරේ පෙබරවාරි මාසය වන විට ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මතුපිට උද්ධමනය -3.9%ක් විය.

**මූලික උද්ධමනය 2024 වසරේ පළමු භාගයේ දී, මතුපිට උද්ධමනය සඳහා වන ඉලක්කයට අනුකූල වෙමින්, ක්‍රමයෙන් ඉහළ ගිය අතර, ඉන් අනතුරුව පහළ ගියේය.** එසේ නමුත්, වසර පුරා මූලික උද්ධමනය මතුපිට උද්ධමනය සඳහා වන ඉලක්කයට වඩා පහළින් පැවතුණි. 2024 වසරේ මුල් කාලයේ දී සිදු කරන ලද එකතු කළ අගය මත බදු සංශෝධන හේතුවෙන් ආහාර නොවන කාණ්ඩවල මිල ගණන් ඉහළ යෑම් වාර්තා විය. කෙසේ වෙතත්, මූලික උද්ධමනය ගණනය කිරීමේ දී සලකනු ලබන පාරිභෝගික පැසට ඇතුළත් කර ඇති ආහාර මිල ගණන්හි විශාල වැඩිවීමක් වාර්තා නොවීම හේතුවෙන් මූලික උද්ධමනය ඉහළ යෑම සුළු වශයෙන් සිදු විය. තවද, මතුපිට උද්ධමනයේ වාර්තා වූ සැලකිය යුතු පහළ යෑම් සඳහා විශාල වශයෙන් හේතු වූ බලශක්ති ආශ්‍රිත මිල අඩු කිරීම්, මූලික උද්ධමනය ගණනය කිරීමේ දී සලකනු ලබන පාරිභෝගික පැසෙන් බැහැර කර ඇති බැවින්, මූලික උද්ධමනයේ එවැනි සැලකිය යුතු පහළ යෑමක්

1 උද්ධමනයේ මෑත කාලීන ප්‍රවණතා පිළිබඳ වැඩි විස්තර මහ බැංකුව විසින් අර්ධ වාර්ෂිකව ප්‍රකාශයට පත් කරන ලද මුදල් ප්‍රතිපත්ති වාර්තාවේ සාකච්ඡා කෙරේ.

2 උද්ධමන ඉලක්කයෙන් උද්ධමනය අපගමනය වීම පිළිබඳ වැඩිදුර විස්තර සඳහා කරුණාකර මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදය බලන්න.

3 කොළඹ පාරිභෝගික මිල දර්ශකය (කො.පා.මි.ද.) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මාසිකව සම්පාදනය කරනු ලැබේ. කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික කුටුම්බයන් භාවිතා කරන පාරිභෝගික අයිතම පැසෙහි මිල හැසිරීම් කො.පා.මි.ද. මගින් නිරූපණය කෙරේ.


4 ජාතික පාරිභෝගික මිල දර්ශකය (ජා.පා.මි.ද.) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් මාසිකව සම්පාදනය කරනු ලැබේ. ජාතික මට්ටමින් භාවිතා කරන පාරිභෝගික අයිතම පැසෙහි මිල හැසිරීම් ජා.පා.මි.ද. මගින් නිරූපණය කෙරේ.

# ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම


1

ශ්‍රී ලංකා මහ බැංකුව


## උද්ධමනය
(කො.පා.මි.ද., වාර්ෂික සාමාන්‍ය, %)





## පොලී අනුපාතිකය
(වසර අවසානයට,
ප්‍රමුඛ ණය අනුපාතිකය, %)




## විනිමය අනුපාතිකය
(වසර අවසානයට,
එ.ජ. ඩොලරයට රුපියල්)




## අක්‍රීය ණය අනුපාතය/තුන්වන අදියරේ ණය අනුපාතය*
(වසර අවසානයට, %)




*2020 වසරෙන් පසු දත්ත ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති මත පදනම් වූ වාර්තාකරණයට අනුකූල වේ

අර්බුදයේ උච්චතම අවස්ථාව සහ 2024

**උද්ධමනය** (කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය, %)
69.8 සැප්. 2022 | -1.7 වසර අවසානයට

**ද.දේ.නි.යේ වර්ධනය** (වාර්ෂික ලක්ෂ්‍යමය, %)
-7.3 2022 | 5.0

**ඒක පුද්ගල ද.දේ.නි.** (එ.ජ. ඩොලර්)
3,464 2022 | 4,516

**පොලී අනුපාතිකය** (ප්‍රමුඛ ණය අනුපාතිකය, %)
29.7 4 වන සතිය, නොවැ. 2022 | 8.9 වසර අවසානයට

**පෞද්ගලික අංශයේ ණය වර්ධනය** (වාර්ෂික ලක්ෂ්‍යමය, %)
-9.7 මැයි 2023 | 10.7 වසර අවසානයට

**විනිමය අනුපාතිකය** (එ.ජ. ඩොලරයට රුපියල්)
365 2 වන සතිය, මැයි 2022 | 293 වසර අවසානයට

**දළ නිල සංචිත** (චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළත්ව, එ.ජ. ඩොලර් බිලියන)
1.7 අගෝ. 2022 | 6.1 වසර අවසානයට


**අක්‍රීය ණය අනුපාතය/තුන්වන අදියරේ ණය අනුපාතය*** (%)
13.6 සැප්. 2023 | 12.3 වසර අවසානයට

**මධ්‍යම රජයේ ණය**** (ද.දේ.නි.යෙහි % ලෙස)
114.2 2022 | 96.1 වසර අවසානයට


**රජයේ මුළු ආදායම සහ ප්‍රදාන** (ද.දේ.නි.යෙහි % ලෙස)
8.3 2021 | 13.7

**සමස්ත රාජ්‍ය අයවැය ශේෂය** (ද.දේ.නි.යෙහි % ලෙස)
-11.7 2021 | -6.8


## මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය (වාර්ෂික ලක්ෂ්‍යමය, %)





## ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය
(එ.ජ. ඩොලර්)





## පෞද්ගලික අංශයේ ණය වර්ධනය
(වසර අවසානයට, වාර්ෂික ලක්ෂ්‍යමය, %)




## දළ නිල සංචිත
(වසර අවසානයට, එ.ජ. ඩොලර් බිලියන)





## මධ්‍යම රජයේ ණය**
(වසර අවසානයට, ද.දේ.නි.යෙහි % ලෙස)





**2024 වාර්ෂික ආර්ථික විවරණයෙහි 1.21 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පාද සටහන වෙත යොමුවන්න

## රජයේ මුළු ආදායම සහ ප්‍රදාන
(ද.දේ.නි.යෙහි % ලෙස)





## සමස්ත රාජ්‍ය අයවැය ශේෂය
(ද.දේ.නි.යෙහි % ලෙස)



1


## 1.1 රූප සටහන: ශ්‍රී ලංකාවේ උද්ධමනයේ හැසිරීම

මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම
(කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

මතුපිට සහ මූලික උද්ධමනයේ හැසිරීම
(ජා.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආහාර සහ ආහාර නොවන උද්ධමනයේ හැසිරීම
(කො.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ආහාර සහ ආහාර නොවන උද්ධමනයේ හැසිරීම
(ජා.පා.මි.ද., වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)





මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

කො.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය සඳහා
දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)




ජා.පා.මි.ද. මත පදනම් වූ මතුපිට උද්ධමනය සඳහා
දායකත්වය (වාර්ෂික ලක්ෂ්‍යමය) (අ)




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකු කාර්යමණ්ඩල ගණනය කිරීම්

(අ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. නව පදනම් වර්ෂය වන (2021=100) යටතේ ප්‍රකාශයට පත් කිරීම, පිළිවෙළින්, 2023 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දත්ත නිකුත් කිරීමේ සිට ආරම්භ කරන ලද අතර, පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී. ඒ අනුව 2023 වසරේ ජනවාරි මාසයේ සිට රූප සටහනේ දක්වා ඇති දත්ත නව පදනම් වර්ෂය වන 2021=100 මත පදනම් වේ.

**1.1 සංඛ්‍යා සටහන: උද්ධමනයේ හැසිරීම (වාර්ෂික ලක්ෂ්‍යමය)**

%

| | | 2013=100 | | | 2021=100 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | දෙසැ-20 | දෙසැ-21 | දෙසැ-22 | දෙසැ-23 | දෙසැ-24 | ජන-25 | පෙබ-25 | මාර්-25 |
| මතුපිට උද්ධමනය | කො.පා.මි.ද. | 4.2 | 12.1 | 57.2 | 4.0 | **-1.7** | -4.0 | -4.2 | **-2.6** |
| | ජා.පා.මි.ද. | 4.6 | 14.0 | 59.2 | 4.2 | **-2.0** | -4.0 | -3.9 | |
| මූලික උද්ධමනය | කො.පා.මි.ද. | 3.5 | 8.3 | 47.7 | 0.6 | **2.7** | 1.2 | 0.7 | **0.7** |
| | ජා.පා.මි.ද. | 4.7 | 10.8 | 57.5 | 0.9 | **1.3** | -0.2 | -0.6 | |
| ආහාර උද්ධමනය | කො.පා.මි.ද. | 9.2 | 22.1 | 64.4 | 0.3 | **0.8** | -2.6 | -0.2 | **0.6** |
| | ජා.පා.මි.ද. | 7.5 | 21.5 | 59.3 | 1.6 | **-1.0** | -2.5 | -1.1 | |
| ආහාර නොවන උද්ධමනය | කො.පා.මි.ද. | 2.0 | 7.5 | 53.4 | 5.8 | **-3.0** | -4.7 | -6.1 | **-4.1** |
| | ජා.පා.මි.ද. | 2.2 | 7.6 | 59.0 | 6.3 | **-2.9** | -5.2 | -6.0 | |

සටහන: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. නව පදනම් වර්ෂය වන 2021=100 යටතේ ප්‍රකාශයට පත් කිරීම, පිළිවෙළින්, 2023 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දත්ත නිකුත් කිරීමේ සිට ආරම්භ කරන ලද අතර, පැරණි පදනම් වර්ෂය වන 2013=100 යටතේ ජා.පා.මි.ද. සහ කො.පා.මි.ද. ප්‍රකාශයට පත් කිරීම අත්හිටුවන ලදී.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දක්නට නොලැබුණි. වසරේ අවසාන භාගයේ දී, ප්‍රධාන වශයෙන් මූලික උද්ධමනය සඳහා වන පාරිභෝගික පැසෙහි ඇතුළත් ආහාර කාණ්ඩයේ අවධමනය සහ ජල ගාස්තු පහළ දැමීම හේතුවෙන් මූලික උද්ධමනයේ ක්‍රමානුකූල පහළ යෑමක් වාර්තා කළේය. ඒ සමඟම, මූලික උද්ධමනය පහළ යෑමට ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම යම්තාක් දුරකට හේතු විය හැකි අතර, බලශක්ති ආශ්‍රිත මිල අඩු කිරීම් මගින් ඇති වූ යම් වක්‍ර බලපෑම් ද එය තුළින් පිළිබිඹු කෙරේ. ඒ අනුව, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය, 2023 වසර අවසානය වන විට පැවති 0.6%ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට 2.7%ක් ලෙස වාර්තා වූ අතර, කො.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2023 වසරේ දී වාර්තා වූ 14.5%ට සාපේක්ෂව 2024 වසරේ 3.3%ක් ලෙස වාර්තා විය. මේ අතර, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික ලක්ෂ්‍යමය මූලික උද්ධමනය 2023 වසර අවසානයේ වාර්තා වූ 0.9%ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට 1.3%ක් ලෙස පැවතුණි. ඒ හා සැසඳීමේ දී, ජා.පා.මි.ද. මත පදනම් වූ වාර්ෂික සාමාන්‍ය මූලික උද්ධමනය 2023 වසරේ දී වාර්තා වූ 15.8% සිට 2024 වසරේ දී 2.5%ක් දක්වා පහළ ගියේය. මේ අතර, 2025 වසරේ මුල් කාලයේ දී වූ සංඛ්‍යානමය පදනම් බලපෑම මගින් ඇති කරන ලද හැසිරීම මූලික උද්ධමනයෙහි ද දැක ගත හැකි විය.

## 1.1.2 මිල

**කො.පා.මි.ද. සහ ජා.පා.මි.ද. යන දර්ශක ද්විත්වය මගින් මනිනු ලබන පොදු මිල මට්ටම, ආහාර සහ ආහාර නොවන අයිතමවල දක්නට ලැබුණු සමස්ත මිල පහළ යෑමත් සමඟ, 2024 වසරේ දී පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** පොදු මිල මට්ටම මෙසේ පහළ යෑම සඳහා, වැය කළ හැකි ආදායම අඩුවීම හේතුවෙන් ඉල්ලුම පහළ යෑම, බලශක්ති සහ ප්‍රවාහන ආශ්‍රිත මිල ගණන් සැලකිය යුතු ලෙස පහළ යෑම සහ ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම ආදී විවිධ සාධක හේතු විය.

**ආහාර අයිතමවල මිල ගණන් 2024 වසර තුළ දී සමස්තයක් ලෙස පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, අස්වනු හිඟ කාල සීමාවල දී සහ ඉතා අයහපත් කාලගුණ තත්ත්වයන් පැවති කාල සීමාවන්හි දී ආහාර අයිතමවල මිල ගණන් වරින් වර ඉහළ ගියේය.** ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් 2024 වසරේ ජනවාරි මාසයේ දී ඉහළ යෑම සඳහා අහිතකර කාලගුණ තත්ත්ව මත සැපයුම සීමිත වීම සහ උත්සව සමයේ පැවති ඉහළ ඉල්ලුම හේතුකොටගෙන නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතමවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම හේතුවිය. ඊට අමතරව, එකතු කළ අගය මත බද්ද සඳහා සිදුකරන ලද සංශෝධන හේතුවෙන් නිතර මිල උච්චාවචනය නොවන ආහාර අයිතමවල මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යෑම ද ඒ සඳහා දායක විය. ඉන් අනතුරුව, 2024 වසරේ මැයි මාසය දක්වා කාලය තුළ දී මහ කන්නයේ අස්වැන්න වෙළඳපොළට ලැබීමත් සමඟ නිතර මිල උච්චාවචනය වන ආහාර අයිතමවල මිල ගණන් පහත වැටීම, ආහාර කාණ්ඩයේ අයිතමවල මිල ගණන් පහළ යෑම සඳහා බලපෑවේය. ඉන් පසු 2024 වසරේ ජූනි සහ ජූලි මාසවල දී ආහාර අයිතමවල මිල ගණන් ඉහළ යෑම සඳහා, එම කාල සීමාවේ දී අස්වනු අවාරය වීම මෙන්ම එවකට පැවති අහිතකර කාලගුණ තත්ත්ව හේතුවෙන් අස්වනු හිඟ වීම ද බලපාන ලදී. කෙසේ වුවද, යල කන්නයේ අස්වැන්න වෙළඳපොළට ලැබීමත් සමඟ එළවළු මිල පහළ යෑම හේතුවෙන් 2024 වසරේ අගෝස්තු මස සිට නොවැම්බර් මාසය දක්වා කාල සීමාව තුළ දී ආහාර මිල ගණන් නැවතත් පහත වැටුණි. උත්සව සමයේ දී ඇතිවන ඉහළ ඉල්ලුම වැනි සාධක සහ දිවයින පුරා පැවති අයහපත් කාලගුණ තත්ත්ව හේතුවෙන් 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී, ආහාර අයිතමවල මිල ගණන් නැවතත් ඉහළ ගියේය. ආහාර කාණ්ඩයේ සමස්ත මිල පහළ යෑම සඳහා ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම නිසා ආනයනික ආහාර අයිතමවල මිල ගණන් අඩු වීම ද හේතු විය. මීට අමතරව, විදුලි ගාස්තු සහ ඉන්ධන මිල අඩු කිරීමෙන් ඇති වූ වක්‍ර බලපෑම් ද ආහාර අයිතමවල මිල ගණන් පහළ යෑමට දායක විය.


1

**ප්‍රධාන වශයෙන් පරිපාලිත මිල සංශෝධන හේතුකොටගෙන, ආහාර නොවන අයිතමවල මිල ගණන් 2024 වසර තුළ දී සමස්තයක් ලෙස පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** වසර ආරම්භයේ දී එකතු කළ අගය මත බද්ද 15% සිට 18%ක් දක්වා ඉහළ දැමීම සහ ඇතැම් ආහාර නොවන අයිතම සඳහා පැවති එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් කිහිපයක් ඉවත් කිරීම හේතුවෙන් 2024 වසරේ ජනවාරි සහ පෙබරවාරි මාසවල දී ආහාර නොවන කාණ්ඩයේ අයිතමවල මිල ගණන් ඉහළ ගියේය. එසේ වුවද, 2024 වසරේ ඉතිරි මාසවල දී ආහාර නොවන අයිතමවල මිල ගණන් පහළ ගිය අතර, ඒ සඳහා මිල සූත්‍ර මත පදනම්ව ගණනය කරනු ලබන පරිපාලිත මිල ගණන් සැලකිය යුතු ලෙස පහත දැමීම ප්‍රධාන වශයෙන් දායක විය. ඒ අනුව, 2024 වසරේ දී විදුලි ගාස්තුව දෙවරක් සැලකිය යුතු ලෙස පහත දමන ලද අතර, ඒකක 90ක් සඳහා වූ විදුලි ගාස්තුව[5] 2024 වසරේ මාර්තු මස 05 වන දින සහ 2024 වසරේ ජූලි මස 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි, පිළිවෙළින් 29.8%කින් සහ 34.3%කින් පහත දමන ලදී. මෙම විදුලි ගාස්තු පහත දැමීමට සමගාමීව, 2024 වසරේ අගෝස්තු 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ඒකක 22ක් සඳහා වූ ජල ගාස්තුව[6] ද මිල සූත්‍රයට අනුකූලව 8.8%කින් පහත දමන ලදී. මේ අතර, 2024 වසරේ ජනවාරි මාසයේ දී එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීමත් සමඟ ඉහළ ගිය පෙට්‍රල් (ඔක්ටේන් 92) සහ සුදු ඩීසල් මිල ගණන් ඉන් අනතුරුව කිහිපවරක් පහළ දමනු ලැබිණි. තවද, 2024 වසර තුළ මාස කිහිපයක දී භූමිතෙල් මිල ගණන් ද පහළ දමන ලදී. එමෙන්ම, එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම හේතුවෙන් 2024 වසරේ ජනවාරි මාසයේ දී සැලකිය යුතු ලෙස ඉහළ ගිය එල්.පී. ගෑස් මිල, 2024 වසරේ අප්‍රේල් මස සිට ජූලි මස දක්වා කාල සීමාව තුළ දී අඩු කරන ලද අතර, වසරේ ඉතිරි කාලය තුළ දී නොවෙනස්ව පැවතුණි. සුදු ඩීසල් මිල අඩුකිරීමට සමගාමීව, 2024 වසරේ ජූලි මස 02 වන දින සිට 5.07%කින් සහ 2024 වසරේ ඔක්තෝබර් මස 02 වන දින සිට 4.24%කින් බස් ගාස්තු පහත දමන ලදී. කෙසේ වෙතත්, 2024 වසරේ දී දුම්රිය ගාස්තු සංශෝධනයක් සිදු නොවිණි.

### 1.1.3 පාරිභෝගික මිල මට්ටම සහ ජීවන වියදම

**ඉහත සඳහන් කළ පසුබිම තුළ, නිල පාරිභෝගික මිල දර්ශක ද්විත්වයම 2024 වසර තුළ දී සමස්තයක් ලෙස පහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** ඒ අනුව, කො.පා.මි.ද. (2021=100), 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී

1.2 රූප සටහන: කො.පා.මි.ද. සහ මතුපිට උද්ධමනය




(අ) 2022 වසර සඳහා වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය කො.පා.මි.ද. (2013=100) මත පදනම් වේ

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

පැවති දර්ශකාංක 195.1හි සිට එකතු කළ අගය මත බදු සංශෝධන හේතුවෙන් 2024 වසරේ ජනවාරි මාසයේ දී දර්ශකාංක 200.7ක් දක්වා ඉහළ ගොස් ඉන් පසුව 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 191.7ක් දක්වා පහත වැටුණි. පාරිභෝගික මිල දර්ශකවල දක්නට ලැබුණු මෙම පහළ යෑම සඳහා මිල සූත්‍ර පදනම් කරගත් පරිපාලිත මිල ගණන් පහළ යෑම සහ ආහාර අයිතමවල මිල ගණන් පහළ යෑම හේතු විය. එමෙන්ම, ජා.පා.මි. දර්ශකය (2021=100) ද, 2023 වසරේ දෙසැම්බර් මාසයේ දී පැවති දර්ශකාංක 208.8හි සිට 2024 වසරේ ජනවාරි මාසයේ දී දර්ශකාංක 215.0 දක්වා ඉහළ යෑමෙන් පසුව, 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී දර්ශකාංක 204.6 දක්වා පහත වැටුණි.

**පාරිභෝගික මිල දර්ශකවල වාර්ෂික සාමාන්‍ය වෙනස මගින් පෙන්නුම් කරන පරිදි, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ජීවන වියදම,[7] සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය.** කො.පා.මි. දර්ශකයට (2021=100) අනුව, කුටුම්බයක් සඳහා ඇස්තමේන්තුගත සාමාන්‍ය මාසික පරිභෝජන වියදම,[8] 2023 වසරේ දී පැවති රුපියල් 176,253හි සිට 2024 වසරේ දී රුපියල් 178,438ක් දක්වා 1.2%ක සුළු ඉහළ යෑමක් පෙන්නුම් කළේය. මේ අනුව, කො.පා.මි. දර්ශකයට (2021=100) අනුව කුටුම්බයක් සඳහා ඇස්තමේන්තුගත සාමාන්‍ය මාසික පරිභෝජන වියදමේ වර්ධන වේගය, 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී වාර්තා වූ 63.5%ක වැඩිවීමට සහ 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී පෙන්නුම් කළ 17.4%ක වැඩිවීමට සාපේක්ෂව, 2024 වසරේ දී සැලකිය යුතු අඩුවීමක් පිළිබිඹු කරයි. එමෙන්ම, ජා.පා.මි. දර්ශකයට (2021=100) අනුව, කුටුම්බයක් සඳහා ඇස්තමේන්තුගත සාමාන්‍ය මාසික පරිභෝජන

---


5 කො.පා.මි.ද. (2021=100) සහ ජා.පා.මි.ද. (2021=100) ගණනය කිරීමේ දී ගෘහස්ථ කාණ්ඩයේ ඒකක 90ක් සඳහා වූ විදුලි ගාස්තුව සලකා බලනු ලැබේ. 2024 වසරේ මාර්තු මස 05 වන දින සහ 2024 වසරේ ජූලි මස 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි, විදුලි ගාස්තු සමස්තයක් ලෙස පිළිවෙළින් 21.9%කින් සහ 22.5%කින් පහළ දමන ලදී.

6 කො.පා.මි.ද. (2021=100) සහ ජා.පා.මි.ද. (2021=100) ගණනය කිරීමේ දී ගෘහස්ථ කාණ්ඩයේ ඒකක 22ක් සඳහා වූ ජල ගාස්තුව සලකා බලනු ලැබේ. 2024 වසරේ අගෝස්තු මස 21 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ගෘහස්ථ පාරිභෝගිකයන් සඳහා ජල ගාස්තුව සමස්තයක් ලෙස 7.0%කින් පහළ දමන ලදී.

7 පාරිභෝගික මිල දර්ශක, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී සිදු කරනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව හඳුනාගත් ස්ථාවර පරිභෝජන පැස මත පදනම් වේ. එබැවින් කාලයත් සමඟ ගෘහස්ථ පරිභෝජන රටාවල සිදුවන වෙනස්කම් මෙමගින් පිළිබිඹු නොවේ.

8 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී සිදු කරනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව කොළඹ දිස්ත්‍රික්කය තුළ සාමාන්‍ය කුටුම්බයක් පුද්ගලයන් 3.8කින් සමන්විත වේ.

1.3 රූප සටහන: ජීවන වියදම




මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

වියදම,[9] 2023 වසරේ දී පැවති රුපියල් 103,383හි සිට 2024 වසරේ දී රුපියල් 105,063ක් දක්වා 1.6%කින් ඉහළ ගොස් ඇති අතර, එය 2021 වසරට සාපේක්ෂව 2022 වසරේ දී වාර්තා වූ 74.9%ක වැඩිවීමට සහ 2022 වසරට සාපේක්ෂව 2023 වසරේ දී වාර්තා වූ 16.5%ක වැඩිවීමට සාපේක්ෂව කැපී පෙනෙන අඩුවීමක් පෙන්නුම් කරයි. කො.පා.මි. දර්ශකයට (2021=100) සහ ජා.පා.මි. දර්ශකයට (2021=100) අදාළ පරිභෝජන පැස දෙකෙහි ම, කුටුම්බයක සාමාන්‍ය මාසික පරිභෝජන වියදම් බෙදී යෑම සැලකීමේ දී, කුටුම්බයක් විසින් තම වියදමින් වැඩි කොටසක් ආහාර නොවන අයිතම සඳහා යොදවන අතර, ආහාර කාණ්ඩයට යොදවන වියදම් ප්‍රමාණය 2022 වසරේ ඇති වූ ආර්ථික අර්බුදයෙන් පසු ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කරයි.

## 1.1.4 උද්ධමන අපේක්ෂා

**ආයතනික සහ කුටුම්බ යන දෙඅංශයෙහි ම 2024 වසර තුළ දී උද්ධමන අපේක්ෂා සමස්තයක් ලෙස පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, එය ප්‍රකාශිත උද්ධමනයේ හැසිරීමට අනුකූල විය.** ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය මගින් පෙන්නුම් කරන පරිදි, මෙම වසර ආරම්භයේ දී, ආයතනික හා කුටුම්බ දෙඅංශයෙහි ම කෙටි කාලීන, එනම් ඉදිරි මාස 3, ඉදිරි මාස 6 සහ ඉදිරි වසර යන කාලපරිච්ඡේද සඳහා වූ උද්ධමන අපේක්ෂා, ඉලක්කගත 5%ක උද්ධමන මට්ටම ඉක්මවා ගිය අතර, ඒ සඳහා, එකතු කළ අගය මත බදු සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ දැමීම හේතුවෙන් උද්ධමනයේ සිදු වූ ඉහළ යෑම හේතු විය. කෙසේ වෙතත්, ඉන් පසුව උපයෝගිතා මිල ගණන් පහත දමනු ලැබූ බැවින්, කෙටි කාලීන උද්ධමන අපේක්ෂා ක්‍රමයෙන් පහළ ගියේය. කෙටි කාලීන උද්ධමන අපේක්ෂා, 2024 වසරේ ඔක්තෝබර් මාසයේ සිට ඉලක්කගත 5%ක උද්ධමන මට්ටමට වඩා පහළින් පැවතුණ අතර, මේ සඳහා 2024 වසරේ සැප්තැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා කාල සීමාව තුළ පැවති අවධමන තත්ත්වය හේතුවිය. ආයතනික අංශයේ මධ්‍ය කාලීන උද්ධමන අපේක්ෂා 5%ක උද්ධමන ඉලක්කගත මට්ටමේ සිට ±2% පරාසය තුළ පැවතෙමින් සමස්ත පහළ යෑමේ ප්‍රවණතාවක් 2024 වසර පුරා පෙන්නුම් කළ අතර, මේ සඳහා කෙටිකාලීන උද්ධමන අපේක්ෂාවල හැසිරීම මූලික විය. සමස්තයක් ලෙස, 2024 වසරේ දී උද්ධමන අපේක්ෂා පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ ද, වසරේ අග භාගයේ දී ආයතනික සහ කුටුම්බ යන දෙඅංශය ම විසින් ඉදිරි කාලයේ දී ක්‍රමයෙන් උද්ධමනයේ වැඩිවීමක් අපේක්ෂා කරන ලදී.

## 1.1.5 වැටුප්

**පවතින දත්තවලට අනුව,[10] 2024 වසරේ දී පෞද්ගලික සහ රාජ්‍ය යන දෙඅංශයෙහි ම සේවකයන්ගේ නාමික වැටුප් පෙර වසරට සාපේක්ෂව ඉහළ ගොස් ඇති බව පෙන්නුම් කෙරේ.** අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ඉහළ යෑම සඳහා, ප්‍රධාන වශයෙන්, ශ්‍රම හිඟය සහ සේවකයන් සඳහා ඇති ඉල්ලුම ඉහළ යෑම හේතු වූ අතර, රාජ්‍ය අංශයේ නාමික වැටුප් ඉහළ යෑමට මෙම අංශයේ සේවා නියුක්තිකයන්ගේ ජීවන වියදම් දීමනාව ඉහළ දැමීම හේතු විය. වාර්ෂික සාමාන්‍ය පදනම මත, රාජ්‍ය අංශයේ සහ අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී ඉහළ ගිය අතර, විධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප්, පෙර වසරට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවද, 2023 වසරේ දී විධිමත් පෞද්ගලික අංශයේ සහ අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් 2022 වසරට සාපේක්ෂව ඉහළ යෑමක් පෙන්නුම් කළ අතර, රාජ්‍ය අංශයේ නාමික වැටුප් නොවෙනස්ව පැවතුණි.

### පෞද්ගලික අංශයේ වැටුප්


**අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100) මගින් මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, 2024 වසර පුරා ඉහළ යෑමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළේය.** වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන මෙම වැටුප් දර්ශකය, 2023 වසරේ දී වාර්තා වූ 11.4%ක ඉහළ යෑමට සාපේක්ෂව 2024 වසරේ දී

9 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2019 වසරේ දී සිදු කරනු ලැබූ ගෘහ ඒකක ආදායම් සහ වියදම් සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාවේ සාමාන්‍ය කුටුම්බයක් පුද්ගලයන් 3.7කින් සමන්විත වේ.

10 මෙම කොටසෙහි දක්වා ඇති තොරතුරු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සම්පාදනය කරනු ලබන රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) හා අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකය (2018=100), සහ කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මත පදනම් වේ. කෙසේ වෙතත්, පවතින වැටුප් දර්ශකවල තිබෙන්නා වූ යම් යම් සීමාකාරී ස්වභාවයන් හේතුකොටගෙන, ආර්ථිකයේ සියළු අංශවල වැටුප් පිළිබඳ සමස්ත උපනතීන් මෙමගින් ආවරණය නොවිය හැකිය.

1


**1.4 රූප සටහන: අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2018=100) (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

6.0%කින් ඉහළ ගියේය. මෙම වැටුප් දර්ශකයේ ප්‍රධාන ආර්ථික ක්‍රියාකාරකම් ත්‍රිත්වය ම, එනම් කෘෂිකර්මාන්ත, කර්මාන්ත, සහ සේවා ක්‍රියාකාරකම් වර්ධනයන් පෙන්නුම් කළ අතර, ඒ අතරින් සේවා ක්‍රියාකාරකම් ඉහළම වැටුප් වර්ධනය වාර්තා කළේය. වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන උප ක්‍රියාකාරකම් 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී, පිළිවෙළින්, 6.3%කින්, 5.5%කින් සහ 7.2%කින් ඉහළ ගියේය. මේ සඳහා ශ්‍රම ඉල්ලුම ඉහළ යෑම සහ සේවකයන් සොයා ගැනීමේ දුෂ්කරතා හේතු වූ අතර, පළපුරුදු සේවකයන් රඳවා ගනිමින් ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා ඔවුන්ගේ දෛනික වැටුප් වැඩි කිරීමට සේවායෝජකයන්ට සිදුවිය. කෙසේ වෙතත්, 2023 වසරට සාපේක්ෂව 2024 වසර තුළ දී අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, උද්ධමන පීඩනය ලිහිල් වීමට අනුකූලව මන්දගාමී විය. තවද, උද්ධමනය අඛණ්ඩව පහළ යෑමත් සමඟ 2024 වසරේ දී අවිධිමත් පෞද්ගලික අංශයේ මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකයේ වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත වර්ධනය තවදුරටත් ඉහළ ගියේය.

**1.5 රූප සටහන: අවිධිමත් පෞද්ගලික අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2018=100)**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


**කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන, පඩි පාලක සභා මගින් පාලනය වන සේවා නියුක්තිකයන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශකය (1978 දෙසැම්බර්=100) මගින් මනිනු ලබන විධිමත් පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප් 2024 වසරේ දී සුළු ඉහළ යෑමක් වාර්තා කළේය.** ඒ අනුව, විධිමත් පෞද්ගලික අංශයේ අවම නාමික වැටුප් ප්‍රමාණ දර්ශකය, වාර්ෂික සාමාන්‍ය පදනම මත 2023 වසරේ දී වාර්තා වූ 0.4%ක ඉහළ යෑමට සාපේක්ෂව 2024 වසරේ දී 0.1%ක සුළු ඉහළ යෑමක් වාර්තා කළේය. කෙසේ වෙතත්, වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලැබූ අවම මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය, 2024 වසරේ දී 1.1%කින් පහළ ගියේය. මේ සඳහා, මෙම කාලය තුළ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක ඉතා සුළු ප්‍රතිශතාත්මක වැඩිවීම් වාර්තා කිරීම හේතුවිය. මේ අතර, 2025 අයවැය යෝජනා මගින් ප්‍රකාශිත පරිදි පෞද්ගලික අංශයේ සේවා නියුක්තිකයන් සඳහා දැනට පවතින රුපියල් 21,000ක අවම මාසික වැටුප 2025 වසරේ අප්‍රේල් මස සිට රුපියල් 27,000ක් දක්වාත් 2026 වසරේ සිට රුපියල් 30,000ක් දක්වාත් ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. මීට අමතරව, වතු අංශයේ සේවකයන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමේ සහ පවතින වැටුප් හා සම්බන්ධ ගැටලු විසඳීමේ අරමුණින් ඔවුන්ගේ දෛනික වැටුප රුපියල් 1,700ක් දක්වා ඉහළ නැංවීමට රජය විසින් මැදිහත් වීමේ යෝජනාවක් ද 2025 අයවැය මගින් ඉදිරිපත් විය.

## රාජ්‍ය අංශයේ වැටුප්

**රාජ්‍ය අංශයේ සේවක වැටුප් ප්‍රමාණ දර්ශකය (2016=100) මගින් මනිනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, වසර දෙකක් පුරා නොවෙනස්ව පැවතීමෙන් අනතුරුව, 2024 වසරේ දී ඉහළ ගියේය.** 2024 අයවැය මගින් යෝජනා කළ පරිදි රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා වන ජීවන වියදම් දීමනාව 2024 වසරේ ජනවාරි මස සිට රුපියල් 10,000කින් වැඩි කරන ලදී. එසේ වුවද, පැවති රාජ්‍ය මූල්‍ය සීමා හේතුවෙන් 2024 වසරේ මාර්තු මස දක්වා රාජ්‍ය සේවකයන්ට රුපියල් 5,000ක අර්ධ ගෙවීමක් සිදු කළ අතර, 2024 වසරේ අප්‍රේල් මස සිට රුපියල් 10,000ක සම්පූර්ණ වැටුප් වැඩිවීම ලබා දෙන ලදී. මේ අතර, 2024 වසරේ මුල් මාස තුන සඳහා වූ හිඟ මුදල, 2025 වසරේ ජනවාරි මාසයේ සිට සමාන වාරික තුනකින් ලබා දෙන ලදී. ඒ අනුව, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ නාමික වැටුප්, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී 18.5%කින් ඉහළ ගියේය. මේ අතර, 2024 වසරේ දී උද්ධමනය අඛණ්ඩව අඩුවීම හේතුවෙන්, 2023 වසරේ දී සිදු වූ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ මූර්ත වැටුප්හි පහළ යෑම, 2024 වසරේ දී දක්නට නොලැබුණි. රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ අවම මාසික මූලික වැටුප ඉහළ දැමීමෙන් සහ විවිධ දීමනාවන් විධිමත් කිරීම තුළින් රාජ්‍ය සේවක වැටුප් ව්‍යුහය සංශෝධනය කිරීමේ යෝජනා 2025 අයවැය මගින් ඉදිරිපත් කෙරිණි. ඒ අනුව, 2025 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට

1

1.6 රූප සටහන: රාජ්‍ය අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2016=100) (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත)




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ අවම මාසික මූලික වැටුප රුපියල් 24,250හි සිට රුපියල් 40,000ක් දක්වා රුපියල් 15,750කින් ඉහළ දැමීමට යෝජනා විය. මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා දැනට රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්හට ලබා දෙන රුපියල් 2,500ක තාවකාලික අතුරු දීමනාව සහ රුපියල් 5,000ක විශේෂ දීමනාව මූලික වැටුපට එකතු කරනු ලබන අතර, ඒ අනුව රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අවම මූලික වැටුපෙහි රුපියල් 8,250ක ශුද්ධ වැඩිවීමක් සිදුවනු ඇත. මෙම වැටුප් ඉහළ දැමීම අදියර කිහිපයකින් සිදුකිරීමට නියමිත අතර, ඒ අනුව, රුපියල් 5,000ක ශුද්ධ වැඩිවීමක් සහ ඉතුරු මුදලින් 30%ක වැඩිවීමක් 2025 වසරේ අප්‍රේල් මාසයේ දී ලබාදීමට යෝජනා වී ඇත. ඉතිරි 70%ක වැඩිවීම, 2026 වසරේ ජනවාරි මස සහ 2027 වසරේ ජනවාරි මස සිට සමාන වාරික දෙකක් වශයෙන් ලබාදීමට සැලසුම් කර ඇත. මීට අමතරව, 2025 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයන්ගේ වාර්ෂික වැටුප් වර්ධකය 80%කින් ඉහළ නැංවීමට ද යෝජනා විය. ඒ අනුව දැනට රුපියල් 250ක් වශයෙන් පවතින අවම වාර්ෂික වැටුප් වර්ධකය රුපියල් 450ක් දක්වා ඉහළ යනු ඇත.

## 1.2 මූර්ත අංශයේ ප්‍රවණතා

### 1.2.1 ආර්ථික වර්ධනය


**ශ්‍රී ලංකා ආර්ථිකය, අඛණ්ඩව වසර දෙකක් පුරා පැවති සංකෝචනයෙන් පසුව, 2024 වසරේ දී 5.0%ක මූර්ත ආර්ථික වර්ධනයක් වාර්තා කළේය.** මෙම ධනාත්මක ප්‍රවණතාව වසර මුළුල්ලේ ම දක්නට ලැබුණු අතර, 2017 වසරෙන් අනතුරුව ප්‍රථම වතාවට, කාර්තු හතරෙහි ම දළ දේශීය නිෂ්පාදිතයෙහි (ද.දේ.නි.)[11] වර්ධනයන් මෙම වසර තුළ දී වාර්තා විය. මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් කර්මාන්ත අංශයේ දායකත්වය හේතු වූ අතර, එහිදී නිෂ්පාදන කර්මාන්ත සහ ඉදිකිරීම් කටයුතුවල ඉහළ වර්ධනය කැපී පෙනුණි. එසේම, නවාතැන් සැපයීමේ සහ ප්‍රවාහන සේවාවල අඛණ්ඩ වර්ධනය හේතුවෙන් සේවා කටයුතු ද සමස්ත වර්ධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් දැක්වූ අතර, කෘෂිකාර්මික කටයුතු ද ධනාත්මකව දායක විය.

**පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි. 2024 වසරේ දී රුපියල් බිලියන 29,898.6ක් දක්වා ඉහළ ගිය අතර, මේ සඳහා මූර්ත ආර්ථික වර්ධනය මෙන්ම 3.8%ක් වූ ද.දේ.නි. ගම්‍ය අවධමනකය ද හේතු විය.** තවද, ද.දේ.නි. සඳහා ශුද්ධ විදේශීය ප්‍රාථමික ආදායම ගැළපීම මගින් ඇස්තමේන්තු කරනු ලබන දළ ජාතික ආදායම (ද.ජා.ආ.) ද 2024 වසරේ දී පවත්නා වෙළඳපොළ මිල අනුව රුපියල් බිලියන 29,153.9ක් දක්වා ඉහළ ගියේය. එ.ජ. ඩොලර් වටිනාකම අනුව ද.දේ.නි. 2023 වසරේ වාර්තා කළ බිලියන 83.8 සිට 2024 වසර වන විට බිලියන 99.0ක් දක්වා ඉහළ ගියේය.

**පවත්නා වෙළඳපොළ මිල අනුව ද.දේ.නි.හි ඉහළ යෑම සහ මධ්‍ය වාර්ෂික ජනගහනය පහත වැටීම හේතුවෙන් 2023 වසරේ දී රුපියල් 1,244,262ක් වූ ඒක පුද්ගල ද.දේ.නි., 2024 වසරේ දී රුපියල් 1,364,235ක් දක්වා ඉහළ ගියේය.** මේ අතර, 2023 වසරේ දී රුපියල් 1,206,441ක් වූ ඒක පුද්ගල ද.ජා.ආ. 2024 වසරේ දී රුපියල් 1,330,255ක් දක්වා ඉහළ ගියේය. රුපියල් වටිනාකම අනුව නාමික ද.දේ.නි.


11 ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදන, වියදම් සහ ආදායම් යන ප්‍රවේශ තුන යටතේ ද.දේ.නි. ඇස්තමේන්තු කරනු ලබයි.

1.7 රූප සටහන: රාජ්‍ය අංශයේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශකයේ විචලන (2016=100)




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1.8 රූප සටහන: වාර්ෂික මූර්ත ද.දේ.නි. වර්ධන අනුපාතික (අ)




(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

ඉහළ යෑම සහ මධ්‍ය වාර්ෂික ජනගහනයේ පහත වැටීමට අමතරව, 2024 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම හේතුවෙන්, එ.ජ. ඩොලර් වටිනාකම අනුව ඒක පුද්ගල ද.දේ.නි., 2023 වසරේ දී වාර්තා කළ 3,801 සිට 2024 වසරේ දී 4,516ක් දක්වා ඉහළ ගිය අතර, ඒක පුද්ගල ද.ජා.ආ. 2023 වසරේ දී වාර්තා කළ 3,685 සිට 4,404ක් දක්වා 2024 වසරේ දී ඉහළ ගියේය.

### 1.2.2 නිෂ්පාදිතය

#### කෘෂිකර්මාන්තය

**කෘෂිකාර්මික ක්‍රියාකාරකම්, 2023 වසරේ දී වාර්තා කළ 1.6%ක වර්ධනයට සාපේක්ෂව, 2024 වසරේ දී 1.2%කින් වර්ධනය විය.** මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් සත්ත්ව නිෂ්පාදන සහ පළතුරු වගා කටයුතු දායක වූ අතර, පොල් වගා කටයුතුවල අඛණ්ඩ පහත වැටීම හේතුවෙන් සමස්ත වර්ධන වේගය සීමා විය. තවද, විශේෂයෙන්, වසරේ සිව්වන කාර්තුව තුළ පැවති අයහපත් කාලගුණික වාතාවරණය හේතුවෙන් වී සහ අනෙකුත් ධාන්‍ය වගාව මෙන්ම ධීවර කටයුතු ඇතුළු ප්‍රධාන කෘෂිකාර්මික කටයුතුවලට බාධා සිදු වූ අතර, එය කෘෂිකාර්මික කටයුතුවල සමස්ත වර්ධන වේගය අඩාල කිරීමට හේතු විය.

#### කර්මාන්ත

**2024 වසරේ දී කර්මාන්ත කටයුතු, 2023 වසරේ දී වාර්තා කළ 9.2%ක පහත වැටීමට සාපේක්ෂව, දේශීය මෙන්ම විදේශීය ඉල්ලුම ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ 11.0%ක ඉහළ වර්ධනයක් වාර්තා කළේය.** ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදන කටයුතුවල අඛණ්ඩ වර්ධනය මෙන්ම රෙදිපිළි, නිමි ඇඳුම්, සම් සහ සම්භාණ්ඩ නිෂ්පාදන කටයුතු ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම හේතුවෙන් වර්ධනය වූ නිෂ්පාදන කර්මාන්ත කටයුතු, සමස්ත කර්මාන්ත කටයුතුවල වර්ධනයට ප්‍රධාන වශයෙන් දායක විය. මේ අතර, පෙර වසරේ වාර්තා වූ පහත වැටීමට සාපේක්ෂව, හිතකර ආර්ථික තත්ත්වයන් හමුවේ නව ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රමයෙන් ආරම්භ වීම හේතුවෙන් 2024 වසරේ දී ඉදිකිරීම් කටයුතු වර්ධනය විය.

#### සේවා

**2023 වසරේ දී 0.2%කින් පහත වැටුණු සේවා ක්‍රියාකාරකම්, ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමත් සමඟ 2024 වසරේ දී 2.4%කින් වර්ධනය විය.** සංචාරක ක්‍රියාකාරකම්වල සැලකිය යුතු වර්ධනය තුළින් නවාතැන් පහසුකම් සැපයීමේ සේවා, ආහාර හා පාන සැපයීමේ සේවා, ප්‍රවාහන සහ වෙළඳ කටයුතු ආදී අනෙකුත් ක්ෂේත්‍ර රැසකට සිදුකළ යහපත් බලපෑම මෙම වර්ධනයට බෙහෙවින් දායක විය. මේ අතර, පොලී අනුපාතික පහත වැටීමෙන් සහ ණය ලබාදීමට ඇති නැඹුරුව ඉහළ යෑමෙන් ඇති වූ යහපත් ව්‍යාපාරික වාතාවරණය හේතුවෙන් මූල්‍ය සේවා සහ දේපළ වෙළඳාම් කටයුතුවල ද වර්ධනයක් දක්නට ලැබුණි. තවද, පරිගණක වැඩසටහන් සහ විදුලි සංදේශ සේවාවල වර්ධනය ද සේවා කටයුතුවල වර්ධනය කෙරෙහි ධනාත්මකව දායක විය.

**1.2 සංඛ්‍යා සටහන: කර්මාන්ත මූලය අනුව ස්ථාවර මිල (2015) යටතේ දළ ජාතික ආදායම (අ)(ආ)**


| ආර්ථික කටයුතු | වර්ධනය (%) | | වර්ධනය සඳහා දායකත්වය (%) | | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (%) | |
|---|---|---|---|---|---|---|
| | 2023 (ඇ) | 2024 | 2023 (ඇ) | 2024 | 2023 (ඇ) | 2024 |
| **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | 1.6 | 1.2 | 0.1 | 0.1 | 7.8 | 7.5 |
| **කර්මාන්ත** | - 9.2 | 11.0 | - 2.5 | 2.8 | 25.3 | 26.7 |
| නිෂ්පාදන කර්මාන්ත, පතල් සහ කැණීම් සහ අනෙකුත් කර්මාන්ත | - 4.7 | 8.3 | - 0.9 | 1.6 | 19.1 | 19.7 |
| එයින්: නිෂ්පාදන කර්මාන්ත කටයුතු | - 3.2 | 7.6 | - 0.5 | 1.2 | 16.0 | 16.4 |
| ඉදිකිරීම් | - 20.8 | 19.4 | - 1.6 | 1.2 | 6.2 | 7.0 |
| **සේවා** | - 0.2 | 2.4 | - 0.1 | 1.5 | 60.7 | 59.2 |
| තොග හා සිල්ලර වෙළඳාම, ප්‍රවාහන සේවා සහ ගබඩා පහසුකම් සැපයීම සහ නවාතැන් සැපයීම හා ආහාරපාන සැපයීමේ සේවා | 3.2 | 3.9 | 0.9 | 1.1 | 28.0 | 27.7 |
| තොරතුරු සහ සන්නිවේදන කටයුතු පිළිබඳ සේවා | - 13.2 | 5.0 | - 0.5 | 0.2 | 3.0 | 3.0 |
| මූල්‍ය හා රක්ෂණ කටයුතු | - 4.8 | - 1.2 | - 0.2 | - 0.1 | 4.9 | 4.6 |
| නිවාස අයිතිය හා දේපළ වෙළඳාම | - 6.0 | 4.2 | - 0.3 | 0.2 | 4.4 | 4.4 |
| වෘත්තීයමය සේවා | 2.4 | 3.5 | 0.0 | 0.1 | 2.1 | 2.1 |
| රාජ්‍ය පරිපාලනය, ජාතික ආරක්ෂාව, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණ සේවා | - 0.6 | - 1.1 | - 0.1 | - 0.1 | 9.8 | 9.2 |
| වෙනත් පෞද්ගලික සේවා | 0.3 | 1.5 | 0.0 | 0.1 | 8.4 | 8.1 |
| **මූලික මිල ගණන් අනුව සමස්ත එකතු කළ අගය** | - 2.6 | 4.6 | - 2.5 | 4.3 | 93.8 | 93.4 |
| භාණ්ඩ හා සේවා මත අය කෙරෙන බදු-සහනාධාර | 2.6 | 10.6 | 0.2 | 0.7 | 6.2 | 6.6 |
| **වෙළඳපොළ මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය** | - 2.3 | 5.0 | - 2.3 | 5.0 | 100.0 | 100.0 |
| විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම | - 15.9 | 12.1 | | | | |
| **වෙළඳපොළ මිල අනුව දළ ජාතික ආදායම** | - 2.8 | 5.5 | | | | |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1

## 1.9 රූප සටහන: 2024 වසරේ ආර්ථික කටයුතුවල වර්ධනය (අ)




(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

### 1.2.3 වියදම

2024 වසර තුළ දී දේශීය ඉල්ලුම, පවත්නා මිල අනුව 9.5%කින් වර්ධනය වූ අතර, මේ සඳහා පරිභෝජන වියදමෙහි 6.4%ක වර්ධනය සහ ආයෝජන වියදමෙහි 19.6%ක වර්ධනය දායක විය. ප්‍රධාන වශයෙන්, ඉදිකිරීම් වියදම ඉහළ යෑම හේතුවෙන් ආයෝජන වියදමෙහි ප්‍රධාන අංශය වන දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය මෙම කාලපරිච්ඡේදය තුළ දී යළි වර්ධනය විය. මේ අතර, මිල මට්ටම් පහළ යෑමේ බලපෑම පිළිබිඹු කරමින් පෞද්ගලික පරිභෝජන වියදම අඩු වේගයකින් වර්ධනය වීම හේතුවෙන්, සමස්ත පරිභෝජන වියදම පෙර වසර හා සැසඳීමේ දී අඩු

## 1.3 සංඛ්‍යා සටහන : පවත්නා වෙළඳපොළ මිල අනුව සමස්ත ඉල්ලුම සහ ඉතුරුම් (අ)(ආ)

| ආර්ථික කටයුතු | රුපියල් බිලියන | | වර්ධනය (%) | | ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස (%) | |
|---|---|---|---|---|---|---|
| | 2023 (ඇ) | 2024 | 2023 (ඇ) | 2024 | 2023 (ඇ) | 2024 |
| **1. දේශීය ඉල්ලුම** | **28,011.5** | **30,683.4** | **12.4** | **9.5** | **102.2** | **102.6** |
| 1.1 පරිභෝජනය | 21,270.3 | **22,623.0** | 15.9 | **6.4** | 77.6 | **75.7** |
| පෞද්ගලික | 19,412.0 | **20,542.2** | 16.8 | **5.8** | 70.8 | **68.7** |
| රාජ්‍ය | 1,858.4 | **2,080.8** | 6.8 | **12.0** | 6.8 | **7.0** |
| 1.2 ආයෝජන (දළ ප්‍රාග්ධන සම්පාදනය) | 6,741.2 | **8,060.3** | 2.7 | **19.6** | 24.6 | **27.0** |
| දළ ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය | 4,891.8 | **5,618.8** | -15.0 | **14.9** | 17.8 | **18.8** |
| තොග වෙනස්වීම සහ වටිනාදේ අත්පත් කරගැනීම හා අත්හැරීම | 1,849.3 | **2,441.5** | 128.9 | **32.0** | 6.7 | **8.2** |
| **2. ශුද්ධ විදේශීය ඉල්ලුම** | **-591.7** | **-784.8** | **31.0** | **-32.6** | **-2.2** | **-2.6** |
| භාණ්ඩ හා සේවා අපනයන | 5,672.9 | **5,945.7** | 9.3 | **4.8** | 20.7 | **19.9** |
| භාණ්ඩ හා සේවා ආනයන | 6,264.6 | **6,730.5** | 3.6 | **7.4** | 22.8 | **22.5** |
| **3. මුළු ඉල්ලුම (ද.දේ.නි.) (1+2)** | **27,419.8** | **29,898.6** | **13.9** | **9.0** | **100.0** | **100.0** |
| **4. දේශීය ඉතුරුම් (3-1.1)** | **6,149.5** | **7,275.5** | **7.8** | **18.3** | **22.4** | **24.3** |
| පෞද්ගලික | 7,800.3 | **8,584.7** | 7.7 | **10.1** | 28.4 | **28.7** |
| රාජ්‍ය (ඈ) | -1,650.9 | **-1,309.1** | -7.2 | **20.7** | -6.0 | **-4.4** |
| **5. විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම (ඉ)** | **-833.5** | **-744.7** | **-35.1** | **10.6** | **-3.0** | **-2.5** |
| **6. විදේශීය ශුද්ධ ජංගම සංක්‍රාම (ඉ)** | **1,906.8** | **1,942.7** | **64.5** | **1.9** | **7.0** | **6.5** |
| **7. ජාතික ඉතුරුම් (4+5+6)** | **7,222.8** | **8,473.5** | **15.6** | **17.3** | **26.3** | **28.3** |
| **8. ඉතුරුම්-ආයෝජන පරතරය** | | | | | | |
| දේශීය ඉතුරුම්-ආයෝජන (4-1.2) | -591.7 | **-784.8** | | | -2.2 | **-2.6** |
| ජාතික ඉතුරුම්-ආයෝජන (7-1.2) | 481.7 | **413.2** | | | 1.8 | **1.4** |
| **9. විදේශීය ජංගම ගිණුම් ශේෂය (2+5+6) (ඉ)** | **481.7** | **413.2** | | | **1.8** | **1.4** |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
(ඈ) මෙය මධ්‍යම රජයේ වර්තන ගිණුමේ ශේෂය වේ.
(ඉ) මෙම අගය ගෙවුම් ශේෂයෙහි ඇස්තමේන්තුගත අගයෙන් කුමන හෝ වෙනසක් වනුයේ ගණනය කිරීමේ දී ඇතිවන කාල පමාව හේතුවෙනි.

මූලයන්: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

1

වේගයකින් වර්ධනය විය. මේ අතර, ආනයන වියදම වැඩිවීම හේතුවෙන් 2024 වසර තුළ ශුද්ධ විදේශීය ඉල්ලුම පහත වැටුණි.

**ස්ථාවර මිල අනුව සලකන විට, ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් කටයුතුවල ඉහළ යෑමත් සමඟ ආයෝජන වියදමේ ඇතිවූ 21.1%ක වර්ධනය හේතුවෙන් 2024 වසරේ දී දේශීය ඉල්ලුම ඉහළ ගියේය.** තවද, පෞද්ගලික පරිභෝජන වියදම ඉහළ යෑමෙන් වසර තුළ දී පරිභෝජන වියදම 3.2%කින් වර්ධනය විය. කෙසේ වෙතත්, ආනයන ඉහළ යෑම හේතුවෙන් ශුද්ධ විදේශීය ඉල්ලුම මෙම කාලය තුළ දී පහත වැටුණි.

**2024 වසරේ දී, ප්‍රධාන වශයෙන් දේශීය ඉතුරුම්වල 18.3%ක වර්ධනය හේතුවෙන්, පවත්නා මිල අනුව ජාතික ඉතුරුම් 17.3%කින් වර්ධනය විය.** තවද, විදේශීය ශුද්ධ ප්‍රාථමික ආදායම සහ ශුද්ධ ද්විතීයික ආදායම 2024 වසරේ දී යහපත් වර්ධනයක් පෙන්නුම් කරමින් ජාතික ඉතුරුම් ඉහළ යෑමට ධනාත්මක ලෙස දායක විය. ජාතික ඉතුරුම්වල මෙම වර්ධනයත් සමඟ ජාතික ඉතුරුම් සහ ආයෝජන අතර පරතරය 2024 වසරේ දී ද ධන අගයක පැවතුණි.

## 1.2.4 ආදායම

**ආදායම් ප්‍රවේශයේ ඇස්තමේන්තුවලට අනුව, 2024 වසරේ දී විශාලතම ආදායම් සංරචකය වන දළ මිශ්‍ර ආදායම, පවත්නා මිල ගණන් අනුව දළ එකතු කළ අගයෙන් 37.4%කට දායක වෙමින් 6.0%කින් වර්ධනය විය.** තවද, දෙවන ප්‍රධාන ආදායම් සංරචකය වන දළ මෙහෙයුම් අතිරික්තය 2024 වසරේ දී 6.8%කින් වර්ධනය විය. මේ අතර, සේවක ආදායම සහ නිෂ්පාදනය මත සහනාධාර අඩු කරන ලද බදු 2024 වසරේ දී තවදුරටත් ඉහළ යමින්, පිළිවෙළින්, 5.2%කින් සහ 30.4%කින් වර්ධනය විය. දළ එකතු කළ අගය සඳහා දායකත්වය දක්වන ආයතනික අංශ අනුව ආදායම ජනනය කිරීම සැලකීමේ දී, මූල්‍ය නොවන ආයතනික අංශය ප්‍රධානතම දායකත්වය ලබා දුන් අතර, ඉන් අනතුරුව, පිළිවෙළින්, ගෘහ ඒකක හා ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන අංශය, මූල්‍ය ආයතන අංශය සහ රාජ්‍ය අංශය දායක වී ඇත.

## 1.2.5 ජනගහනය, ශ්‍රම බලකාය සහ සේවා නියුක්තිය

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව විසින් ඇස්තමේන්තු කර ඇති පරිදි, ශ්‍රී ලංකාවේ මධ්‍ය වාර්ෂික ජනගහනය 2024 වසරේ දී මිලියන 21.916 දක්වා 0.5%කින් අඩු විය.** මේ සඳහා, උපත් හා මරණ අතර පරතරය වන ස්වභාවික වර්ධනය වසර තුළ දී අඩු වීමත්, ශුද්ධ විදේශ සංක්‍රමණ ඍණ අගයක් ගැනීමත් හේතු විය. මෙම ජනගහනය සහ රටේ සමස්ත භූමි ප්‍රමාණය[12] අතර අනුපාතයක් ලෙස ගණනය කරනු ලබන ජන ඝනත්වය 2024 වසරේ දී වර්ග කිලෝමීටරයකට පුද්ගලයින් 352ක් විය.

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ශ්‍රී ලංකා ශ්‍රම බලකා සමීක්ෂණයෙන් පිළිබිඹු වන පරිදි, 2024 වසරේ දී ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහනය[13] (ශ්‍රම බලකාය), 2023 වසරේ වාර්තා වූ මිලියන 8.408 සිට මිලියන 8.316ක් දක්වා අඩු වී ඇත.** ශ්‍රම බලකාය සහ කුටුම්බ ජනගහනය අතර අනුපාතය වන ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතිකය ද 2023 වසරේ වාර්තා වූ 48.6%ට සාපේක්ෂව 2024 වසරේ දී 47.4%ක් දක්වා අඩු විය.

**විරැකියා අනුපාතිකය 2023 වසරේ වාර්තා කළ 4.7%ට සාපේක්ෂව 2024 වසරේ දී 4.4%ක් දක්වා අඩු විය.** 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී සේවා වියුක්ත[14] සහ සේවා නියුක්ත[15] ජනගහනය ද අඩු විය.

12 ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව 2024 වසරේ දී රටේ ප්‍රමාණය වර්ග කිලෝමීටර 67,240ක් ලෙස (භූමි ප්‍රමාණය: වර්ග කිලෝමීටර 62,302) නැවත ගණනය කරන ලද අතර, එය මෙයට පෙර වර්ග කිලෝමීටර 65,610ක් (භූමි ප්‍රමාණය: වර්ග කිලෝමීටර 62,705) ලෙස වාර්තා විය. (මූලය: https://www.survey.gov.lk/sdweb/pdf/latestpost/Recalculation%20of%20Country%20Extent.pdf)

13 සලකා බලන සතියක කාලසීමාව තුළ වයස අවුරුදු 15 සහ ඊට වැඩි සේවා නියුක්ත සහ සේවා වියුක්ත ජනගහනය අයත් වේ.

14 රැකියාවක් සොයන හා රැකියාවක් නොකළ සහ පසුගිය සති හතරක කාලය තුළ රැකියාවක් සෙවීමට යම් පියවරක් ගත් හා ඉදිරි සති දෙක තුළ රැකියාවක් ලැබුණහොත් භාරගැනීමට හැකියාවක් ඇති පුද්ගලයන් සේවා වියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි.

15 අදාළ යොමු කාලය තුළ සේවකයන්, සේව්‍යයන් සහ තමාගේ ම වැඩ කටයුතු කරන්නන් හෝ ගෙවීම් නොලබන පවුලේ සාමාජිකයන් ලෙස අවම වශයෙන් පැයක්වත් ආර්ථික කටයුත්තක යෙදුන පුද්ගලයන් සේවා නියුක්ත පුද්ගලයන් ලෙස හඳුන්වනු ලබයි. මෙයට අදාළ යොමු කාලය තුළ ආර්ථික කටයුත්තක යෙදී නොසිටියත් එම ආර්ථික කටයුත්ත සමඟ විධිමත් බැඳීමක් ඇති පුද්ගලයන් ද අයත් වේ.

**1.4 සංඛ්‍යා සටහන: පවත්නා වෙළඳපොළ මිල යටතේ ආයතනික අංශ අනුව ආදායම් සංරචක (අ) (ආ)**

ප්‍රතිශත දායකත්වය (%)

| ශීර්ෂය | 2023 (ඇ) | | | | | 2024 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා.තො.ගෘ.සේ.ආ.* අංශය | දළ එකතු කළ අගය | මූල්‍ය නොවන අංශය | මූල්‍ය අංශය | රාජ්‍ය අංශය | ගෘහ ඒකක හා ලා.තො.ගෘ.සේ.ආ.* අංශය | දළ එකතු කළ අගය |
| සේවක ආදායම | 53.3 | 9.3 | 20.1 | 17.3 | 100.0 | **53.8** | **7.7** | **20.9** | **17.7** | **100.0** |
| දළ මෙහෙයුම් අතිරික්තය | 82.2 | 15.5 | 2.3 | - | 100.0 | **81.8** | **16.0** | **2.2** | **-** | **100.0** |
| දළ මිශ්‍ර ආදායම | - | - | - | 100.0 | 100.0 | **-** | **-** | **-** | **100.0** | **100.0** |
| නිෂ්පාදනය මත වෙනත් බදු (අඩු කළා: එම සහනාධාර) | 64.6 | 14.6 | - | 20.8 | 100.0 | **66.2** | **13.9** | **-** | **19.9** | **100.0** |
| මූලික මිල ගණන් අනුව දළ එකතු කළ අගය | 43.1 | 7.9 | 6.4 | 42.5 | 100.0 | **43.2** | **7.7** | **6.6** | **42.5** | **100.0** |

(අ) 2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු මත පදනම් වේ.
(ආ) තාවකාලික
(ඇ) සංශෝධිත
*ලාභ අපේක්ෂාවෙන් තොරව ගෘහ ඒකක සඳහා සේවය සලසන ආයතන

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

1

**1.5 සංඛ්‍යා සටහන: කුටුම්බ ජනගහනය, ශ්‍රම බලකාය සහ ශ්‍රම බලකා සහභාගිත්වය (අ)**

| ශීර්ෂය | 2023 | 2024 (ආ) |
|---|---|---|
| කුටුම්බ ජනගහනය පුද්ගලයන් '000 | 17,306 | **17,551(ඇ)** |
| ශ්‍රම බලකාය පුද්ගලයන් '000 | 8,408 | **8,316** |
| සේවා නියුක්ත | 8,010 | **7,949(ඇ)** |
| සේවා වියුක්ත | 398 | **367(ඇ)** |
| සේවා වියුක්ත අනුපාතිකය | 4.7 | **4.4** |
| පුරුෂ | 3.6 | **ලැ.නො.** |
| ස්ත්‍රී | 7.0 | **ලැ.නො.** |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය (ඈ) | 48.6 | **47.4** |
| පුරුෂ | 68.6 | **ලැ.නො.** |
| ස්ත්‍රී | 31.3 | **ලැ.නො.** |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) වයස අවු. 15 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය
(ආ) කාර්තු හතරෙහි සාමාන්‍යය
(ඇ) මෙම අගයන් 2025.03.28 දිනට පවතින තොරතුරු වලින් ව්‍යුත්පන්න කර ඇති අතර, ඉදිරියේදී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන සංඛ්‍යාලේඛනවලට වඩා වෙනස් විය හැක.
(ඈ) ශ්‍රම බලකාය, කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස
ලැ.නො. - ලැබී නොමැත

**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අනුව, විදේශ රැකියා සඳහා පිටත්වීම් 2023 වසරේ දී වාර්තා කළ 297,656ට සාපේක්ෂව 2024 වසරේ දී 314,828ක් දක්වා 5.8%කින් ඉහළ ගියේය.** වසර තුළ දී විදේශ රැකියා සඳහා පිටත්ව ගිය මුළු සංඛ්‍යාවෙන් 59.3%ක් පුරුෂයින් ද 40.7%ක් කාන්තාවන් ද විය.

## 1.2.6 ආර්ථික යටිතල පහසුකම්

### විදුලිබලය හා බලශක්තිය

#### ඛනිජ තෙල්

**2024 වසර තුළ දී ගෝලීය බොරතෙල් මිල ගණන් නිරන්තරයෙන් විචලනය වෙමින් පැවතුණු අතර, ආරම්භයේ දී මිල ඉහළ යෑමේ ප්‍රවණතාවක් ද, වසරේ අවසාන භාගය වන විට මිල ගණන් ක්‍රමයෙන් පහළ වැටීමක් ද දක්නට ලැබුණි.** මෙම විචලනයට, භූ දේශපාලනික ප්‍රවණතා සහ ඇමරිකා එක්සත් ජනපදයේ හා චීනයේ මන්දගාමී ආර්ථික වර්ධනය හේතුවෙන් ඇති වූ අවිනිශ්චිතතා බොහෝ දුරට හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක මිලෙහි සාමාන්‍යය, 2023 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් 82.22 සිට 2024 වසරේ දී එ.ජ. ඩොලර් 79.79ක් දක්වා 3.0%කින් පහළ ගියේය. මෙම පහළ යෑම 2022 වසර සහ 2023 වසර අතර වාර්තා වූ 17.0%ක පහත වැටීමට සාපේක්ෂව ඉතා අඩු අගයක් විය.

**ගෝලීය බලශක්ති මිල ගණන් පහළ යෑම සහ ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම පිළිබිඹු කරමින්, 2024 වසරේ මුල් භාගයේ සිට ඛනිජ තෙල් නිෂ්පාදිතවල දේශීය මිල ගණන් ක්‍රමයෙන් පහළ ගියේය.** ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (ලං.ඛ.නී.සං.) විසින් ආනයනය කරන ලද බොරතෙල් බැරලයක මිලෙහි වාර්ෂික සාමාන්‍යය, 2023 වසරේ වාර්තා වූ එ.ජ. ඩොලර් 89.60 සිට 2024 වසරේ දී එ.ජ. ඩොලර් 84.69ක් දක්වා 5.5%කින් පහළ ගියේය. 2024 වසර තුළ දී පිරිවැය පිළිබිඹු කෙරෙන ඉන්ධන මිල සංශෝධන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස වසර අවසන් වන විට දේශීය ඛනිජ තෙල් නිෂ්පාදිතවල සිල්ලර මිල ගණන් සමස්තයක් ලෙස පහළ ගියේය. ඒ අනුව, 2023 වසර අවසානයේ පැවති මිල ගණන්වලට සාපේක්ෂව, ලං.ඛ.නී.සං. විසින් අලෙවි කරන ලද පෙට්‍රල් 92, සුදු ඩීසල් සහ භූමිතෙල් නිෂ්පාදිතවල සමස්ත මිල ගණන්, පිළිවෙළින්, 10.7%කින්, 13.1%කින් සහ 23.9%කින් පහළ යෑම් වාර්තා කළේය. මෙය 2022 වසරේ සිට 2023 වසර දක්වා මෙම ඛනිජ තෙල් නිෂ්පාදිත තුනෙහි සිල්ලර මිල ගණන්වල දක්නට ලැබුණු පහළ යෑමේ ප්‍රවණතාවයේ අඛණ්ඩ පැවැත්මක් වන අතර, 2022 වසර අවසානයේ පැවති මිල ගණන්වලට සාපේක්ෂව පෙට්‍රල් 92, සුදු ඩීසල් සහ භූමිතෙල් මිල ගණන්, පිළිවෙළින්, 16.5%කින්, 31.9%කින් සහ 48.5%කින් පහළ යෑම් වාර්තා කර ඇත.


**ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් නැවත පණ ගැන්වීම පිළිබිඹු කරමින් 2024 වසරේ දී ඛනිජ තෙල් නිෂ්පාදිත විකුණුම්වල සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.** 2024 වසරේ දී, ඛනිජ තෙල් නිෂ්පාදිතවල විකුණුම් පරිමාව පෙර වසරට සාපේක්ෂව 11.3%ක වර්ධනයක් වාර්තා කළේය. ආර්ථිකයේ වෙනස් වන අවශ්‍යතා සපුරාලීම සහ කාර්යක්ෂමතාව හා තරගකාරීත්වය වැඩි දියුණු කිරීම සඳහා, ශ්‍රී ලංකාවේ දේශීය ඛනිජ තෙල් වෙළඳපොළ විවෘත කිරීමේ ප්‍රයත්න වසර තුළ දී ක්‍රියාත්මක විය. මෙම සංක්‍රාන්තියේ කොටසක් ලෙස, 2024 වසර අවසානය වන විට, නව පෞද්ගලික සමාගම් තුනක් ක්‍රියාත්මක වෙමින් තිබූ අතර, ඉන් සමාගම් දෙකක් වසර තුළ දී ආරම්භ කරන ලද අතර එක් සමාගමක් 2023 වසරේ දී ආරම්භ කරන ලදී.

**පිරිවැය පාදක මිලකරණය අනුගමනය කිරීමෙන් පසුව, මෑත අතීතයේ සිදු වූ සැලකිය යුතු අලාභ හා සසඳන විට, 2024 වසරේ දී අඛණ්ඩව දෙවන වසරටත් ලං.ඛ.නී.සං. ශක්තිමත් මූල්‍ය කාර්ය සාධනයක් වාර්තා කළේය.** මෙම පසුබිම තුළ, ලං.ඛ.නී.සං., 2022 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 617.6ක සැලකිය යුතු අලාභයෙන් සහ 2023 වසරේ දී වාර්තා කළ රුපියල් බිලියන 120.3ක ලාභයෙන් අනතුරුව, 2024 වසරේ දී රුපියල් බිලියන 33.3ක ලාභයක් වාර්තා කළේය. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ලාභය පහත වැටීමට බොහෝ දුරට හේතු වූයේ පෞද්ගලික අංශයේ තරගකරුවන්ගේ ආගමනයෙන් පසු ලං.ඛ.නී.සං.වේ වෙළඳපොළ කොටස හැකිලීමය. ලං.ඛ.නී.සං.වේ මූල්‍ය ශක්‍යතාව වැඩි දියුණු කිරීමේ පියවරක් ලෙස, 2022 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 2.5ක වටිනාකමක් ඇති රජයේ ඇපකර සහිත විදේශ විනිමය ණය තොගය රජයට පවරා ගැනීමට ගත් තීරණයට අනුව 2024 වසර අවසානයේ දී එම ආයතනයේ නොපියවූ විදේශ විනිමය ණය සහ ආනයන බිල්පත් එ.ජ. ඩොලර් බිලියන 0.3ක් විය. මේ අතර, 2024 වසර අවසන් වන විට රජයේ ආයතනවලින් ලං.ඛ.නී.සං.ට ලැබිය යුතු මුළු හිඟ වෙළඳ ලැබීම් ප්‍රමාණය රුපියල් බිලියන 10.0ක් විය.

# 1

**1.1 විශේෂාංග රූප සටහන**

**දේශීය ඉන්ධන අලෙවියෙහි සහ මිල ගණන්වල ප්‍රවණතා**




මූලය: දේශීය ඉන්ධන අලෙවිකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

2022-2024 කාලය තුළ දී පෙට්‍රල් 90/92 සහ සුදු ඩීසල් විකුණුම් පරිමාව සහ දේශීය සිල්ලර මිල අතර සම්බන්ධතාවය රූප සටහන් මගින් නිරූපණය කෙරේ. 2022 වසරේ මැද භාගයේ දී ඛනිජ තෙල් නිෂ්පාදිතවල ගෝලීය මිල ගණන් ඉහළ යෑමත්, මිල සූත්‍රය පදනම් කරගත් මිල නියම කිරීමේ ක්‍රමවේදය ක්‍රියාවට නැංවීමත් සමඟ ඉන්ධන වර්ග දෙකෙහි ම මිල තියුණු ලෙස ඉහළ ගියේය. ආර්ථික අර්බුදය පැවති කාලපරිච්ඡේදය තුළ දී දේශීය මිල ගණන් ඉහළ යෑම, ඉන්ධන සලාක වශයෙන් නිකුත් කිරීම සහ මන්දගාමී ආර්ථික ක්‍රියාකාරකම් හේතුවෙන් විකුණුම් පරිමාවට බලපෑම් ඇති විය. මෙම වර්ධනයන්හි ඒකාබද්ධ බලපෑම හේතුවෙන්, එම කාලය තුළ දී දේශීය වෙළඳපොළේ ඛනිජ තෙල් නිෂ්පාදිතවල සමස්ත විකුණුම් පරිමාව තියුණු ලෙස පහළ ගියේය.

අර්බුදයෙන් පසුව, ගෝලීය සහ දේශීය මිල ගණන් ස්ථාවර වී, දේශීය ඉන්ධන සැපයුම යථා තත්ත්වයට පත් වුව ද, සමස්ත ප්‍රවණතාවලින් පෙනී යන ආකාරයට ඉහළ ඉන්ධන මිල ගණන් විකුණුම් පහළ යෑමටත්, පහළ ඉන්ධන මිල ගණන් විකුණුම් ඉහළ යෑමටත් හේතු වන අතර, එමගින් මිල උච්චාවචනයන්ට වෙළඳපොළ සංවේදී වන බවත්, පාරිභෝගික ඉල්ලුමෙහි වෙනස්වීම් සිදු විය හැකි බවත් ඉස්මතු කෙරේ. මේ අනුව, අහිතකර ලෙස ගෝලීය භාණ්ඩ මිල වෙනස් වන අවස්ථාවන්හි දී රටට ඇතිවන අයහපත් බලපෑම් අවම කිරීම සඳහා පිරිවැය පාදක මිලකරණය උපකාරී වේ.


## විදුලිබලය

**ආර්ථික කටයුතු යළි යථා තත්ත්වයට පත්වීම මෙන්ම, විදුලි ගාස්තු දෙවරක් පහළ දැමීමත් සමඟ 2024 වසරේ දී විදුලිබල ඉල්ලුම අඛණ්ඩව යථා තත්ත්වයට පත් විය.** 2024 වසරේ දී, සියලුම පාරිභෝගික කාණ්ඩ සඳහා සිදු කළ විකුණුම් ඉහළ ගිය අතර, එය සමස්තයක් වශයෙන් විදුලිබල ඉල්ලුමෙහි 7.3%ක වර්ධනයකට හේතු විය. විශේෂයෙන් ම, ගෘහස්ථ සහ ආගමික අංශ සඳහා විකුණුම් 2024 වසරේ පළමු කාර්තුවේ දී සුළු වශයෙන් පහළ ගිය ද, ඉන් අනතුරුව සිදු වූ විදුලි ගාස්තු අඩු වීම හේතුවෙන් නැවත ඉහළ ගියේය. ඉහළ ගිය විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා වසර තුළ දී විදුලිබල උත්පාදනය ද 7.8%කින් වර්ධනය විය.

**කාලගුණික බලපෑම් හේතුවෙන්, විදුලිබල උත්පාදන සංයුතියෙහි යම් විචලනයන් දක්නට ලැබිණි.** වසරේ පළමු කාර්තුවේ පැවති වියළි කාලගුණික තත්ත්වය සහ අන්තර් මෝසම් වර්ෂාපතනය අඩු වීම හේතුවෙන්, 2024 වසරේ මාර්තු, අප්‍රේල් සහ ඔක්තෝබර් මාසවල දී විදුලිබල අංශය මත ඇති වූ අයහපත් බලපෑම නිසා ද්‍රව ඉන්ධන පදනම් කරගත් තාප විදුලි උත්පාදනය මත වැඩි වශයෙන් යැපීමට සිදු විය. කෙසේ වෙතත්, මැයි මාසයේ මැද භාගයේ දී දක්නට ලැබුණු හිතකර වර්ෂාපතනය සහ නොවැම්බර් මාසයේ අග වන විට ලැබුණු සාමාන්‍ය අගයට වඩා වැඩි වර්ෂාපතනය, ඉහළ ජල විදුලි උත්පාදනයක් සහිතව විදුලි උත්පාදනය සිදු කිරීමට දායක විය. වසර තුළ දී ජලය, ඉන්ධන, ගල් අඟුරු සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභව මගින් සමස්ත බලශක්ති උත්පාදනය සඳහා දැක්වූ දායකත්වය, පිළිවෙළින්, 32.3%ක්, 13.9%ක්, 32.6%ක්, සහ 21.2%ක් විය.

**විදුලි ගාස්තු දෙවරක් අඩු කරනු ලැබුව ද, 2024 වසරේ දී ලංකා විදුලිබල මණ්ඩලය (ලං.වි.ම.) ලාභදායීව ක්‍රියාත්මක විය.** 2024 වසර සඳහා මුළු වාර්ෂික ලාභය රුපියල් බිලියන 148.6ක් ලෙස වාර්තා විය. මෙම ලාභය හේතුවෙන්, ලං.වි.ම.හි කෙටිකාලීන ණය ගැනීම් සහ වගකීම් 2023 වසර අවසානයේ තිබූ රුපියල් බිලියන 292.8ක සිට 2024 වසර අවසානය වන විට රුපියල් බිලියන 123.6ක් දක්වා අඩු වූ අතර, දිගුකාලීන වගකීම්

1.10 රූප සටහන: විදුලිබල හා බලශක්ති අංශයේ ප්‍රවණතා




රුපියල් බිලියන 413.3ක සිට රුපියල් බිලියන 409.0ක් දක්වා අඩු විය. කාර්තුමය පදනමෙන් සංශෝධන ක්‍රියාත්මක කිරීම අක්‍රමවත් වුවද, වසර තුළ දී පිරිවැය පිළිබිඹු කෙරෙන විදුලි ගාස්තු සංශෝධන අඛණ්ඩව සිදු විය. ඒ අනුව, වසර තුළ දී දෙවරක් විදුලි ගාස්තු සංශෝධන සිදු කරන ලද අතර, සාමාන්‍යයක් ලෙස ගත් කල, මාර්තු මාසයේ දී 21.9%ක අඩු කිරීමක් සහ ජූලි මාසයේ දී තවත් 22.5%ක අඩු කිරීමක් සිදු කරන ලදී. අඛණ්ඩව සිදු කරන ලද මෙම සැලකිය යුතු විදුලි ගාස්තු අඩු කිරීම් හේතුවෙන් වසරේ අවසාන භාගයේ දී මාසිකව උපයන ලද ලාභය සැලකිය යුතු පහත වැටීමක් දක්නට ලැබුණි. 2025 වසරේ ජනවාරි මාසයේ දී, විදුලි ගාස්තු 20.0%ක සාමාන්‍යයකින් පහළ දමමින් ගාස්තු සංශෝධනයක් සිදු කරන ලද අතර, එවැනි සංශෝධනයක් කෙතරම් දුරට පිරිවැය පිළිබිඹු කරනුයේ ද යන්න පිළිබඳ අවිනිශ්චිතතා ඇති විය. එබැවින්, පිරිවැය පහළ යෑමක් නොමැතිව තවදුරටත් ගාස්තු අඩු කිරීම මගින් ලං.වි.ම. මූල්‍ය ක්‍රියාකාරිත්වය විශාල ලෙස අඩපණ විය හැකිය.


**වර්ධනය වන විදුලිබල ඉල්ලුම සපුරාලීමට දරන ප්‍රයත්න මධ්‍යයේ, පවතින යටිතල පහසුකම් සම්බන්ධ ගැටලු නිරාකරණය කරමින්, රජය දේශීය විදුලිබල හා බලශක්ති අංශයේ ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අඛණ්ඩව සිදු කළේය.** 2024 වසරේ ජූනි මාසයේ දී, අංශය තුළ අවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් සක්‍රියව සිදු කිරීම සඳහා 2024 අංක 36 දරන විදුලිබල පනත බලාත්මක කරන ලදී. මෙම නීති සම්පාදනය මගින්, විදුලිබල අංශය නියාමනය, වෙළඳපොළ තරගකාරිත්වය, පුනර්ජනනීය බලශක්ති ඒකාබද්ධ කිරීම සහ ආයතනික ප්‍රතිව්‍යුහගත කිරීම්

1

## 1.2 විශේෂාංග රූප සටහන්
## විදුලිය සහ ඉන්ධන වැනි උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණයේ වැදගත්කම

පිරිවැයට වඩා අඩු අගයකින් මිල නියම කිරීම මගින් විදුලිය සහ ඉන්ධන වැනි උපයෝගිතා සඳහා පාරිභෝගිකයන්ගේ ආදායම් මට්ටම පිළිබඳව නොසලකා සැමට එක ලෙස සලකා විවෘත ලෙස සහනාධාර ලබා දීමේ දීර්ඝ ඉතිහාසයක් ශ්‍රී ලංකාව සතුව පවතී. මෙම සහනාධාර, ලං.වි.ම. සහ ලං.ඛ.නී.සං.හි මූල්‍ය කාර්ය සාධනයට සැලකිය යුතු බලපෑමක් ඇති කරන ලදී. මෙම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්ගේ ද්‍රවශීලතා හිඟයන් බැංකු අංශය විසින් මූල්‍යකරණය කරන ලද අතර, එමගින් අනෙකුත් ඵලදායී ආයෝජන සීමා විය. 2022 වසරේ දී, මෙම රාජ්‍ය වාණිජ ව්‍යවසායයන්හි මූල්‍යමය ශක්‍යතාව සුරක්ෂිත කිරීම සඳහා එම ආයතනයන්හි දිගු කාලීන ණයවලින් කොටසක් රජය වෙත පවරා ගැනීමට සිදු වූ අතර, පිරිවැය පිළිබිඹු කෙරෙන මිලකරණ යාන්ත්‍රණයකට අනුකූලව, 2022 සහ 2023 වසරවල දී ඉන්ධන මිල ගණන් සහ විදුලිය ගාස්තුවල සැලකිය යුතු සංශෝධන කිරීමට සිදු විය. ඉන් පසුව, ලං.වි.ම. සහ ලං.ඛ.නී.සං. යන ආයතන දෙකම වාර්ෂිකව ලාභ ලබමින් ඇත. උපයෝගිතා සඳහා වන සහනාධාර මගින් මහජනතාවට සහ ව්‍යාපාරවලට කෙටි කාලීන සහනයක් ලැබුණ ද, අවසානයේ දී, එහි දිගුකාලීන පිරිවැය, ඉහළ බලශක්ති මිල ගණන්, බදු සහ සමස්ත උද්ධමනයේ ඉහළ යෑම හරහා දරා ගැනීමට ඔවුන් හට සිදු වන බව ඉහත අත්දැකීම මගින් අනාවරණය වේ. කෙටි කාලීන වාසි වෙනුවෙන් සාර්ව ආර්ථිකයට දිගු කාලීන අයහපත් බලපෑම් ඇති වන අයුරින් පිරිවැයට වඩා අඩුවෙන් මිල නියම කිරීමේ විෂම චක්‍රය වැළැක්වීම සඳහා පිරිවැය පිළිබිඹු කෙරෙන ආකාරයේ මිල නියම කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය වේ. එබැවින්, උපයෝගිතා සඳහා පිරිවැය පිළිබිඹු වන ආකාරයේ මිල නියම කිරීමේ ක්‍රමවේදයෙන් අපගමනය වීම, රජය හෝ ව්‍යාපාර හෝ මහජනතාව සඳහා දිගු කාලීනව වාසිදායක නොවේ. එබැවින්, උපයෝගිතා සඳහා පිරිවැය පිළිඹිඹු නොවන ආකාරයෙන් මිල නියම කිරීම තුළින් සැමට විවෘත ලෙස සහන ලබා දීම වැනි ක්‍රමවේදයක් අනුගමනය කිරීමට වෙනුවට, ඉලක්කගත ප්‍රතිලාභ යෝජනා ක්‍රම හරහා, ආර්ථිකයේ අවශ්‍යතා ඇති ජන කොටස්වලට අමතර සහන සැපයිය හැකිය. තවද, නිෂ්පාදන පිරිවැය අඩු කරන අතරතුර මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ තරගකාරීත්වය වැඩි දියුණු කිරීමට පියවර ගැනීම තුළින් පාරිභෝගිකයාට ප්‍රතිලාභ ලබා දීමට ක්‍රියාමාර්ග ගත හැකිය.

**ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය (වාර්ෂික ලාභය/අලාභය)**




මූලයන්: ලංකා විදුලිබල මණ්ඩලය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

වැනි ප්‍රධාන ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරන අතර, එමගින් බලශක්ති අංශයට අදාළ නීති සම්පාදන රාමුවේ සැලකිය යුතු පරිදි මූලික පරිවර්තන ඇති කිරීම අරමුණු කර ගෙන ඇත. රජය වෙනස් වීමෙන් අනතුරුව, ආරක්ෂිත, තිරසාර සහ පාරිභෝගික කේන්ද්‍රීය විදුලිබල අංශයකට මෙම පනත ඵලදායී ලෙස සහාය වන බව සහතික කිරීම සඳහා, ඒ පිළිබඳ සමාලෝචනය කර තවදුරටත් සංශෝධන නිර්දේශ කිරීමට 2024 වසර අවසානයේ දී කමිටුවක් පත් කරන ලදී. තවද, සොබාදනව් බලාගාරය සඳහා අපේක්ෂිත මෙහෙයුම් පද්ධති වැඩි දියුණු කිරීම මගින් එය රට තුළ විදුලිය නිෂ්පාදනය සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායු භාවිතා කළ හැකි පළමු විදුලි බලාගාරය බවට පත් වනු ඇත. මෙම වැඩි දියුණු කිරීම් 2025 වසරේ පළමු භාගය වන විට නිම කිරීමට අපේක්ෂා කරන අතර, ද්‍රවීකෘත ස්වභාවික වායු ගබඩා පහසුකම් ඇතුළු අනෙකුත් ආධාරක යටිතල පහසුකම් සංවර්ධනය 2028 වසර වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ. මීට අමතරව, වර්තමාන වෙළඳපොළ තත්ත්වයන්ට සහ රටේ අනාගත බලශක්ති ඉල්ලුමට වඩාත් ගැළපෙන පරිදි 2025-2044 සඳහා විදුලිබල උත්පාදනය කිරීමේ දිගුකාලීන සැලැස්ම යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලියක ලං.වි.ම. නිරතව සිටී.

### ප්‍රවාහන අංශය

**අර්බුදකාරී කාලපරිච්ඡේදය තුළ සිදු වූ සැලකිය යුතු පසුබෑම්වලින් අනතුරුව 2024 වසරේ දී ප්‍රවාහන අංශය මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය.** මාර්ග ප්‍රවාහන දර්ශකවල ක්‍රියාකාරීත්වය, ධාවන කිලෝමීටර ගණන අනුව සුළු වර්ධනයක් වාර්තා කළේය. මේ අතර, ටිකට්පත් ලබාගත් මගීන් සංඛ්‍යාව පදනම්ව ගණනය කෙරෙන ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ (ශ්‍රී ලං.ග.ම.) මගී කිලෝමීටර ගණනෙහි පහළ යෑමක් දක්නට ලැබුණි. තවද, දුම්රිය ප්‍රවාහන ක්‍රියාකාරකම් මිශ්‍ර ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළ අතර, ගුවන් ප්‍රවාහන දර්ශක වර්ධනයක්

පෙන්නුම් කළේ ය. 2023 වසරේ දී පෙන්නුම් කළ වර්ධන ගම්‍යතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, වරාය අංශ ක්‍රියාකාරකම් 2024 වසරේ දී සැලකිය යුතු ලෙස ඉහළ යෑමක් පෙන්නුම් කළේය.

### අනෙකුත් ප්‍රවණතා

**2024 වසර තුළ දී, කොළඹ වරාය නගරය, නාවික වරායන්, මහාමාර්ග, නාගරික සංවර්ධනය සහ නිවාස ඇතුළු ප්‍රධාන යටිතල පහසුකම් ව්‍යාපෘති වැඩි දියුණු කිරීම සඳහා රජය අඛණ්ඩව ප්‍රයත්න දැරුවද, එක් එක් අංශයන්හි ප්‍රගතිය අසමානව පැවතුණි.** කුලුනු මතින් දිවෙන වරාය ප්‍රවේශ අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අවසන් වෙමින් පැවති අතර, මධ්‍යම අධිවේගී මාර්ගයේ පළමු සහ තෙවන අදියර සඳහා ඉඩම් අත්පත් කර ගැනීම සහ සිවිල් වැඩ කටයුතු වසර තුළ සිදු විය. විදේශ රාජ්‍ය ආධාර වැඩසටහනක් යටතේ නිවාස ඒකක 1,996ක් ඉදිකිරීම සඳහා කැබිනට් අනුමැතිය ලබා දුන් අතර, ප්‍රමාණවත් පහසුකම් නොලැබෙන ප්‍රජාවන් සඳහා යෝග්‍ය පහසුකම් සහිත නිවාස සැපයීම කෙරෙහි අවධානය යොමු කරමින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් තවත් අඩු ආදායම්ලාභී සහ මධ්‍යම ආදායම්ලාභී නිවාස වැඩසටහන් කිහිපයක් ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. තවද, නාගරික සංවර්ධන අධිකාරිය විසින් මුලපුරන ලද ප්‍රධාන වැඩසටහන් වන, සියක් නගර සංවර්ධන වැඩසටහන සහ රාජ්‍ය ආයතන සංවර්ධන වැඩසටහන යටතේ නාගරික යටිතල පහසුකම් සහ පොදු පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති කිහිපයක් වසර තුළ නිම කරන ලදී. කොළඹ වරාය නගරයේ සිදුවෙමින් පවතින සංවර්ධන කටයුතුවල කොටසක් ලෙස, කලාපයේ පළමු තීරුබදු රහිත සාප්පු සංකීර්ණය වසර තුළ දී නිම කර විවෘත කරන ලදී. තවද, 2024 වසරේ දී කොළඹ වරාය නගරයට අදාළව නව බැංකු රෙගුලාසි හඳුන්වා දෙන ලද අතර, එමගින් ඉහළ මට්ටමේ නියාමනයක් පවතින බව සහතික කිරීම හරහා ආයෝජන ආකර්ෂණය කර ගැනීමට ඇති සූදානම ඉස්මතු කෙරේ. වරාය යටිතල පහසුකම් සම්බන්ධයෙන් සලකා බලන විට, වසර තුළ දී කොළඹ වරායේ නැගෙනහිර බහාලුම් පර්යන්තයෙහි සහ බටහිර බහාලුම් පර්යන්තය Iහි සංවර්ධන කටයුතුවල ප්‍රගතියක් අත්පත් කර ගත් අතර, නැගෙනහිර බහාලුම් පර්යන්තය හා බටහිර බහාලුම් පර්යන්තය I, පිළිවෙළින්, 2026 සහ 2027 වසරවල දී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ. මෙම සංවර්ධන කටයුතු තුළින් කොළඹ වරායේ තරඟකාරීත්වය තවදුරටත් ඉහළ නැංවෙන අතර, අනාගතයේ දී වරාය කර්මාන්තයේ ඉදිරි අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමෙන් සහ වර්ධනය වන ඉල්ලුම සපුරාලීමෙන් අනෙකුත් අසල්වැසි වරායන් සමඟ වඩාත් දැඩි ලෙස තරඟ කිරීමට හැකියාව ලැබෙනු ඇත.

**1.6 සංඛ්‍යා සටහන: ප්‍රවාහන අංශයේ ක්‍රියාකාරිත්වය**

| අංශය | 2023 (අ) | 2024 (අ) | වෙනස 2023/2024 (%) |
|---|---|---|---|
| **මාර්ගස්ථ ප්‍රවාහනය (ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය)** | | | |
| ධාවන කිලෝමීටර (මිලියන) | 364 | **371.7** | **2.1** |
| මගී කිලෝමීටර (මිලියන) | 14,272 | **13,153** | **-7.8** |
| **දුම්රිය ප්‍රවාහනය (ශ්‍රී ලංකා දුම්රිය සේවය)** | | | |
| මගී කිලෝමීටර (මිලියන) | 7,044 | **6,000** | **-14.8** |
| භාණ්ඩ ටොන් කිලෝමීටර (මිලියන) | 159 | **172** | **8.1** |
| **ගුවන් ප්‍රවාහනය** | | | |
| මගී මෙහෙයුම් (මිලියන) (ආ) | 7.5 | **8.8** | **17.8** |
| ශ්‍රීලංකන් ගුවන් සේවය | 3.7 | **3.5** | **-6.1** |
| භාණ්ඩ (මෙ.ටො. දහස්) | 158.6 | **195.4** | **23.2** |
| ශ්‍රීලංකන් ගුවන් සේවය | 79.3 | **93.0** | **17.2** |
| **මුහුදු ප්‍රවාහනය (කොළඹ වරාය)** | | | |
| බහාලු මෙහෙයුම් (TEUs දහස්) | 6,950 | **7,792** | **12.1** |
| පැමිණි නැව් සංඛ්‍යාව | 4,237 | **3,968** | **-6.3** |

(අ) තාවකාලික
(ආ) සංක්‍රමණික මගීන් ඇතුළත් නොවේ
TEUs = අඩි 20ට සමාන බහාලු ඒකක

මූලයන්: ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
ශ්‍රී ලංකා දුම්රිය සේවය
ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය
ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## 1.2.7 සමාජ යටිතල පහසුකම්

### අධ්‍යාපනය

**කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් ඇති වූ පසුබෑම් මාලාවකින් පසුව, 2024 වසරේ දී අධ්‍යාපන අංශය බොහෝ දුරට යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කළ ද, එම අර්බුදවල දිගුකාලීන අයහපත් බලපෑම් තවදුරටත් දක්නට ලැබේ.** වසර තුළ දී, අදාළ බලධාරීන් විසින් රටෙහි අධ්‍යාපනයේ සාධාරණ ප්‍රවේශය සහ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා පුළුල් පරාසයක පියවර ගන්නා ලදී. එබැවින්, නිදහස් අධ්‍යාපනය සඳහා වූ ප්‍රවේශයේ සමානාත්මතාව තහවුරු කිරීම සඳහා, 2024 වසර තුළ දී රජය ශිෂ්‍ය සුභසාධන වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන ගියේය. මේ අනුව, සිසුන් මිලියන 4.5කට වැඩි පිරිසකට පාසල් නිල ඇඳුම් බෙදා දීම, සිසුන් මිලියන 1.4ක් ආවරණය වන පරිදි පාසල් ආහාර වැඩසටහන දියත් කිරීම සහ නොමිලේ පාසල් පෙළපොත් බෙදා දීම සිදු කරන ලදී. මීට අමතරව, ශිෂ්‍ය සුබසාධනය තවදුරටත් වැඩි දියුණු කිරීමේ අරමුණින්, 2024 වසරේ දී, සුභග, සුජාත දියණි සහ මහත්මා ගාන්ධි යන ශිෂ්‍යත්ව සහ ශිෂ්‍යාධාර වැනි ප්‍රධාන යෝජනා ක්‍රම පාසල් සිසුන් වෙනුවෙන් ක්‍රියාත්මක කරන ලදී. තවද, 2025 අයවැය මගින් වෘත්තීය අධ්‍යාපනය හදාරන සිසුන් සඳහා වන දීමනාව, මහපොළ ශිෂ්‍යත්වය සහ විශ්වවිද්‍යාල සිසුන් සඳහා මාසික ශිෂ්‍යාධාර ගෙවීම් වැඩි කිරීමට රජය විසින් ප්‍රතිපාදන සලසා ඇත. 2023 වසර සඳහා වූ අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග 2024 වසරේ දී පවත්වන ලද අතර, 2024 වසර සඳහා වන සාමාන්‍ය පෙළ විභාගය 2025 වසර දක්වා කල් ගියේය. වසංගතයෙන් හා ආර්ථික අර්බුදයෙන් පසුව විභාග පැවැත්වීම අඛණ්ඩව ප්‍රමාද වීම, අධ්‍යාපනය ලබා දීමේ රටාවට අහිතකර ලෙස බලපා ඇත. තවද, වසංගතය සහ ආර්ථික අර්බුදය හේතුවෙන් පාසල් හැර යෑමේ අනුපාතය සහ දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දෙමාපියන් මත පැටවෙන මූල්‍යමය පීඩනය තීව්‍ර වී ඇත.

## සෞඛ්‍යය

**සීමාසහිත සම්පත් මධ්‍යයේ වුවද, 2024 වසරේ දී සෞඛ්‍ය අංශය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් විය.** ඒ අනුව, සෞඛ්‍ය සේවා පද්ධතිය හා සේවාවන් නගා සිටුවීම සහ වැඩි දියුණු කිරීම සඳහා, රජය ප්‍රධාන පාර්ශ්වකරුවන්ගේ සහාය ඇතිව ක්‍රියාමාර්ග ගන්නා ලදී. වසර තුළ, දිවයිනේ බොහෝ ප්‍රදේශ ආවරණය වන පරිදි සෞඛ්‍ය සේවාවන්හි සාධාරණ සහ සැමට ප්‍රවේශයක් ඇති කිරීම සඳහා යටිතල පහසුකම් සංවර්ධනයේ සැලකිය යුතු සන්ධිස්ථාන සපුරා ගන්නා ලදී. අනෙකුත් සංවර්ධන ව්‍යාපෘති ද ඇතුළුව, ජර්මානු රජයේ අරමුදල් යටතේ කරාපිටිය ජර්මානු-ශ්‍රී ලංකා මිත්‍රත්ව මාතෘ හා ළමා සෞඛ්‍ය රෝහල විවෘත කිරීම සහ කුරුණෑගල ශික්ෂණ රෝහලේ පස් මහල් වාට්ටු සංකීර්ණයක්, ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මහ රෝහලේ හෘද ප්‍රතිකාර සඳහා කැතීටරීකරණ රසායනාගාරයක් සහිත සය මහල් ගොඩනැගිල්ලක් හා යාපනය ශික්ෂණ රෝහලේ ඇටමිදුළු බද්ධ කිරීමේ ඒකකයක් ආරම්භ කිරීම කැපී පෙනෙන සංවර්ධන ව්‍යාපෘති වේ. තවද, 2025 වසරේ මුල් භාගයේ දී, විවිධ පරිත්‍යාගශීලීන්ගේ මූල්‍ය ආධාර ඇතිව, පිළිකා රෝගයෙන් පෙළෙන දරුවන් සඳහා රජයේ රෝහලක, ශ්‍රී ලංකාවේ ප්‍රථම සහ එකම ඇටමිදුළු සහ ජනන සෛල බද්ධ කිරීමේ ඒකකය මහරගම අපේක්ෂා පිළිකා රෝහලේ දී ආරම්භ කරන ලදී.

**ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවා අංශයේ අඛණ්ඩ ප්‍රගතියක් තිබුණ ද, අභියෝගතා රැසක් තවමත් පවතී.** සෞඛ්‍ය සේවා පද්ධතිය නවීකරණය, මානව සම්පත්, අරමුදල් හා සම්පත් බෙදා හැරීම සහ කලාපීය විෂමතා මෙම අභියෝග අතරට අයත් වේ. ප්‍රමාණවත් රසායනාගාර පරීක්ෂණ ධාරිතාවක් සහ ප්‍රවාහන පහසුකම් නොමැතිකම වසර තුළ රෝග නිරීක්ෂණ සහ පාලන කටයුතුවලට අහිතකර ලෙස බලපාන ලදී. කොවිඩ්-19 වසංගතයෙන් හා ආර්ථික අර්බුදයෙන් පසුව, මාතෘ හා ළමා පෝෂණය, නව යොවුන් හා තරුණ ප්‍රජාවගේ මානසික සෞඛ්‍යය සහ වතු හා නාගරික අංශවල අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් අතර සෞඛ්‍ය ගැටලු කෙරෙහි උපායමාර්ගික අවධානය යොමු විය යුතු ක්ෂේත්‍ර වේ. එබැවින්, මෙම ක්ෂේත්‍රවලට අදාළ සෞඛ්‍ය සේවා අංශයේ සිදුවන මූලික පරිවර්තන සහ රටේ වයස්ගත ජනගහනය වැඩිවීම, බෝ නොවන රෝග ශීඝ්‍රයෙන් පැතිරී යාම සහ දේශගුණික විපර්යාස හා සම්බන්ධ සෞඛ්‍ය අවදානම්වලට මුහුණ දීම ආදිය සඳහා ක්‍රියාකාරී උපාය මාර්ග සකස් කළ යුතුය.

## සමාජ ආරක්ෂණ ජාල

**ඉලක්කගත පිරිස් වෙත ආධාර ලබා දීම සහ දිගුකාලීනව ආර්ථිකමය වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව ප්‍රවර්ධනය කිරීම සහතික කරන අතර ම, අවදානමට ලක්විය හැකි ජනකොටස් මුහුණ දෙන අඛණ්ඩ අභියෝග හඳුනා ගනිමින් සමාජ ආරක්ෂණ ජාල පුළුල් කිරීමට සහ වැඩි දියුණු කිරීමට රජය ගන්නා ප්‍රයත්න තවදුරටත් ශක්තිමත් කරන ලදී.** මේ අනුව, සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය යටතේ 2023 වසරේ ජූලි මාසයේ දී ආරම්භ කරන ලද අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය මගින් 'අන්ත දිළිඳු', 'දුප්පත්', 'අවදානමට ලක් වූ' සහ 'සංක්‍රාන්තික' ලෙස වර්ගීකරණය කරන ලද අඩු ආදායම්ලාභී පවුල් සඳහා මූල්‍ය ආධාර සැපයීම අඛණ්ඩව සිදු කළ අතර, වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්, අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන්ට සහ වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් සඳහා තනි පුද්ගල දීමනා ද පිරිනමන ලදී. 2024 වසරේ දී, මෙම වැඩසටහන මගින් ප්‍රතිලාභී පවුල් මිලියන 1.8කට මුදල් ප්‍රතිලාභ ලබා දුන් අතර, හිඟ මුදල් ද ඇතුළුව ලබා දුන් මුළු ප්‍රතිලාභ ප්‍රමාණය රුපියල් බිලියන 145.6කි. මීට අමතරව, වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්ට, අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන්ට සහ වැඩිහිටි ආධාර ලබන තැනැත්තන්ට රුපියල් බිලියන 34.2ක පුද්ගල දීමනා ද ලබා දෙන ලදී. අඩු ආදායම්ලාභී පවුල්වල පාසල් දරුවන් මිලියන 1.1කට පොත්පත් මිලදී ගැනීම සඳහා මූල්‍ය ආධාර ලබා දෙන වැඩසටහනක් ද සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් සාර්ථකව ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා වැය වූ මුළු මුදල රුපියල් බිලියන 6.6කි. මේ අතර, 2024 වසරේ මැයි සහ දෙසැම්බර් මාසවල දී සුභසාධක ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමයට සංශෝධන හඳුන්වා දෙන ලදී. මේ සමඟ ම, අස්වැසුම සුභසාධක ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ තවදුරටත් ප්‍රතිලාභ ඉහළ නැංවීම සහ පුළුල් කිරීමට 2025 වසරේ අයවැය හරහා ද කටයුතු කරන ලදී. 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී නිකුත් කරන ලද අති විශේෂ ගැසට් පත්‍රයට අනුව, මෙම යෝජනා ක්‍රමය යටතේ සිටින ප්‍රතිලාභීන් ගණන මිලියන 2.4ක් දක්වා ඉහළ නැංවීම ඉලක්ක කර ඇති අතර, වෙනස් හැකියාවන් සහිත තැනැත්තන්, අවිනිශ්චිත සම්භවයක් සහිත නිදන්ගත වකුගඩු රෝගයෙන් පෙළෙන රෝගීන් සහ වැඩිහිටි ආධාර ලබන තැනැත්තන් ආවරණය වන පරිදි පුද්ගලයින් මිලියන 1.28කට ද ප්‍රතිලාභ ලබා දීමට අරමුණු කෙරේ. මේ අතර, අවශ්‍යතා සහිත පුද්ගලයන්ට ප්‍රතිලාභ ලබා දීම පුළුල් කිරීමේ අරමුණින්, සුභසාධන ප්‍රතිලාභ මණ්ඩලය විසින් අස්වැසුම දෙවන අදියර 2025 වසරේ මුල් භාගයේ දී ආරම්භ කරන ලදී. ආධාර සඳහා සුදුසුකම් ලත් පවුල් තක්සේරු කර තෝරා ගැනීම දැනට ක්‍රියාත්මක වෙමින් පවතී. කෙසේ වෙතත්, ඇතැම් ප්‍රතිලාභීන්ට බැංකු ගිණුම් සහ ජාතික හැඳුනුම්පත් නොමැති වීම වැනි පරිපාලනමය ගැටලු හේතුවෙන් ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ සමාජ ආරක්ෂණ වියදම් ඉලක්ක පූර්ණ වශයෙන් සපුරා ගැනීමට නොහැකි වී ඇති අතර ම, ඒ හේතුවෙන් තෝරාගත් ප්‍රතිලාභීන්ට ප්‍රතිලාභ ලබා දීම ද මන්දගාමී වී ඇත. ඒ අනුව, ජනගහනයේ අවදානමට ලක්විය හැකි කොටස් ප්‍රමාණවත් ලෙස ආවරණය කිරීමට හැකි වන පරිදි මෙම ගැටලු කඩිනමින් විසඳීමට අවධානය යොමු කර ඇත. ග්‍රාමීය සංවර්ධන,

සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලද ඒකාබද්ධ වැඩසටහනකින් සමන්විත ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය ආරම්භ කිරීම සඳහා 2025 වසරේ පෙබරවාරි මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය ද ලබා දී ඇත. අවදානමට ලක්විය හැකි ජනකොටස් සඳහා තිරසාර සහයෝගයක් ලබා දීම සහතික කරමින්, සමාජ ආරක්ෂණය, ආර්ථික බලගැන්වීම සහ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ මුලපිරීම් ඒකාබද්ධ රාමුවක් යටතට ගෙන ඒම මගින් දරිද්‍රතාවය පිටුදැකීම සඳහා වූ බහුවිධ ප්‍රවේශයන් එකිනෙකට සම්බන්ධ කිරීමට මෙම වැඩසටහන මගින් ප්‍රයත්න දරනු ලැබේ.

**2024 වසරේ දී කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ සහ ජාතික සංවර්ධන වැඩසටහන් කිහිපයක් ආරම්භ කළේය.** සමාජ සුබසාධනය වැඩි දියුණු කිරීම සහ අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සහාය වීම සඳහා අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂණ සහ සහනාධාර වැඩසටහන්වලට සමගාමීව මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, අමාත්‍යාංශය විසින් 2024 අංක 37 දරන කාන්තාවන් සවිබල ගැන්වීමේ පනත ඇතුළු ප්‍රධාන නීතිමය පියවර හඳුන්වා දෙමින් ඒ හරහා ජාතික කාන්තා කොමිසම පිහිටුවීම, කාන්තා අයිතිවාසිකම් සහතික කිරීම සඳහා කාන්තා ඔම්බුඩ්ස්මන්වරියක් පත් කිරීම, කාන්තාවන් සඳහා ජාතික අරමුදලක් පිහිටුවීම සහ ජාතික ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය හා කාන්තා බලගැන්වීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සිදු කරන ලදී. වසර තුළ දී, අමාත්‍යාංශය විසින් පෝෂණ හා උදෑසන ආහාර දීමනා සහ පෙර පාසල් ගුරුවරුන් සඳහා මූල්‍ය ආධාර ඇතුළු කාන්තා හා ළමා සුභසාධන වැඩසටහන් කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී.

## 1.3 මුදල් අංශයේ ප්‍රවණතා

### 1.3.1 වෙළඳපොළ පොලී අනුපාතික


**2023 ජුනි මාසයේ සිට ක්‍රියාත්මක කරන ලද ලිහිල් මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හේතුවෙන් 2024 වසරේ දී වෙළඳපොළ පොලී අනුපාතික පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි.** 2023 ජුනි මාසයේ සිට ප්‍රතිපත්ති පොලී අනුපාතික සමස්තයක් ලෙස පදනම් අංක 775කින් පමණ අඩු කළ අතර, ඉන් පදනම් අංක 125ක් පමණ අඩු කිරීම 2024 වසරේ දී සිදු විය. ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමු වෙමින් 2024 නොවැම්බර් මස අවසාන කාලයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය[16] හඳුන්වාදීමත් සමඟ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය පදනම් අංක 50කින් පමණ අඩු කිරීම ද මෙයට ඇතුළත් වේ. මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කිරීම සහ දේශීය මුදල් වෙළඳපොළ වැඩිදියුණු වූ ද්‍රවශීලතා තත්ත්වයන්ට අනුකූලව, බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය[17] 2024 වසරේ දී පහළ ගියේය. 2024 නොවැම්බර් මාසයේ දී එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වා දීමෙන් පසුව බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය ද ක්‍රමයෙන් අඩු වී, 2024 වසර අවසානය වන විට 8.00% ආසන්නයේ පැවතුණි. මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමට අමතරව උද්ධමනය අඩු වීම, උද්ධමන අපේක්ෂා පහළ මට්ටමක පැවතීම සහ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය අවසන් අදියරේ පැවතීමත් සමඟ අවදානම් අධිමිල අඩුවීම 2024 වසර තුළ දී වෙළඳපොළ පොලී අනුපාතිකවල සමස්ත අඩු වීම සඳහා සහාය විය. 2024 වසරේ පළමු භාගයේ දී වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වුවද, 2024 වසර මැද භාගයේ දී රජයේ සුරැකුම්පත් මත එළඳා අනුපාතිකවල දක්නට ලද තාවකාලික ඉහළ යෑම හේතුවෙන් සමස්ත වෙළඳපොළ පොලී අනුපාතිකවල පහළ යෑමේ වේගය මන්දගාමී විය. කෙසේ වෙතත්, 2024 වසර අවසාන කාලය වන විට වෙළඳපොළ තැන්පතු සහ ණය පොලී අනුපාතික තවදුරටත් අඩු විය. 2024 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතැති පොලී උපයන රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික, එනම් බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය, ප්‍රතිශතාංක 4.1-5.6කින් අඩු විය. බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය වසර මුළුල්ලේ සැලකිය යුතු ලෙස අඛණ්ඩව අඩු වීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ නමුත් 2024 වසර අවසාන භාගයේ දී එම පහත වැටීමේ වේගය තරමක් මන්දගාමී විය. බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය මගින් පිළිබිඹු වන මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පත් කර ඇති පොලී උපයන නව රුපියල් තැන්පතුවලට අදාළ පොලී අනුපාතික 2024 වසරේ දී ප්‍රතිශතාංක 4.5-4.8කින් අඩු විය. මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම හා අනුකූලව 2024 වසරේ මුල් කාලයේ දී බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය සහ බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය සැලකිය යුතු ලෙස අඩු වූ අතර, එම තීව්‍ර ගැළපීම්වල යම් මන්දගාමී වීමක් පිළිබිඹු කරමින් 2024 වසරේ අග භාගයේ දී මිශ්‍ර විචලනයන් පෙන්නුම් කළේය. ණය පොලී අනුපාතික, විශේෂයෙන් ම වෙළඳපොළ පදනම් පොලී අනුපාතිකයක් ලෙස සලකනු ලබන, සතියක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිය ප්‍රධාන ගනුදෙනුකරුවන්ට ලබා දෙන කෙටි කාලීන රුපියල් ණය සහ අත්තිකාරම් සඳහා අදාළ වන පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය) 2024 වසරේ දී ප්‍රතිශතාංක 3.2කින් සැලකිය යුතු ලෙස අඩු විය. මේ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද සියලුම ණය හා අත්තිකාරම්වලට

16 එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීම පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා "තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයකට යොමුවීම" යන විශේෂ සටහන 3 බලන්න.

17 නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ වෙළඳපොළ පොලී අනුපාතික මෙහෙයවීම සඳහා මෙහෙයුම් ඉලක්කය ලෙස මහ බැංකුව විසින් සමීපව නිරීක්ෂණය කරනු ලබන කෙටි කාලීන පොලී අනුපාතිකය වේ.

1

1.11 රූප සටහන: තෝරාගත් වෙළඳපොළ පොලී අනුපාතිකවල හැසිරීම




සටහන: ස්ථම්භ ප්‍රස්ථාරයෙන් 2023 සහ 2024 වසරවලදී පොලී අනුපාතිකවල වාර්ෂික වෙනස්වීම නිරූපණය වේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අදාළ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය) සහ මාසයක් තුළ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සපයන ලද නව ණය හා අත්තිකාරම්වලට අදාළ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය) 2023 වසරේ දී, පිළිවෙළින්, ප්‍රතිශතාංක 4.5කින් සහ ප්‍රතිශතාංක 11.8කින් අඩු වීමට සාපේක්ෂව 2024 වසරේ දී, පිළිවෙළින්, ප්‍රතිශතාංක 2.3කින් සහ ප්‍රතිශතාංක 3.6කින් අඩු විය. පදනම් ණය පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වුවද, ඇතැම් ණය උපකරණ සඳහා අදාළ උපරිම ණය පොලී අනුපාතික ඉහළ මට්ටමක පැවති අතර, එමගින් එවැනි ණය පොලී අනුපාතික තවදුරටත් අඩු වීමේ හැකියාව පෙන්නුම් කෙරේ. මේ අතර, අනෙකුත් වෙළඳපොළ ණය පොලී අනුපාතික අඩු වීම හා සමගාමීව ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ණය පොලී අනුපාතික ද මෙම වසර තුළ දී අඩු විය. ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබා දුන් සියලුම ණය හා අත්තිකාරම් මත පදනම් වූ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය) සහ මාසයක් තුළ බලපත්‍රලාභී බැංකු විසින් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයට ලබා දුන් නව ණය හා අත්තිකාරම් සඳහා වූ ණය පොලී අනුපාතිකය (බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය) 2024 වසරේ දී, පිළිවෙළින්, ප්‍රතිශතාංක 2.9කින් සහ ප්‍රතිශතාංක 3.4කින් අඩු විය. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ණය පොලී අනුපාතිකවල සමස්ත අඩු වීමක් වාර්තා වුවද, ණය ස්වභාවය සහ ඒ ආශ්‍රිත අවදානම් හේතුවෙන් ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ණය ලබා ගන්නන් සඳහා ලබා දෙන ණය සඳහා වූ පොලී අනුපාතික අනෙකුත් වෙළඳපොළ ණය පොලී අනුපාතික හා සැසඳීමේ දී සාපේක්ෂව ඉහළ මට්ටමක පැවතුණි. නාමික වෙළඳපොළ පොලී අනුපාතික අඩු වුවද වාර්තා වූ උද්ධමන අගයන් ගැළපීමෙන් මනිනු ලබන මූර්ත පොලී අනුපාතික අඩු උද්ධමනය සහ 2024 සැප්තැම්බර් මාසයේ සිට පැවති අවධමනකාරී තත්ත්වය හේතුවෙන් 2024 වසරේ දී ඉහළ ධන අගයන් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2025 වසරේ දෙවන භාගයේ දී උද්ධමනය ඉලක්කගත මට්ටම කරා ළඟාවනු ඇතැයි අපේක්ෂා කරන අතර, ඒ හේතුවෙන් මූර්ත පොලී අනුපාතිකවල පහළ යෑමක් අපේක්ෂා කෙරේ. 2024 වසරේ දෙවන භාගයේ දී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් ලිහිල් කිරීමේ පසු බලපෑම පිළිබිඹු කරමින් 2025 වසරේ මුල් කාලයේ දී වෙළඳපොළ ණය පොලී අනුපාතිකවල පහළ යෑමේ ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි.

## රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික

**රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සැලකිය යුතු ලෙස වැඩිදියුණු වීම, මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම සහ අවදානම් අධිමිල ක්‍රමයෙන් අඩු වීම හේතුවෙන් 2024 වසරේ දී රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික පහළ ගියේය.** කෙසේ වෙතත්, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික 2024 වසරේ මැද භාගයේ දී වරින් වර ඉහළ යෑම් වාර්තා කළේය. 2024 වසරේ ජූනි සහ සැප්තැම්බර් අතර කාලය තුළ දී රජයේ සුරැකුම්පත් මත ඵලදා

1

## 1.7 සංඛ්‍යා සටහන: පොලී අනුපාතිකවල හැසිරීම

වාර්ෂිකව %

| පොලී අනුපාතිකය | 2023 අවසානයට | 2024 අවසානයට | ප්‍රතිශතාංක වෙනස |
|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය** | | | |
| එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) (අ) | - | **8.00** | - |
| **නිත්‍ය පහසුකම් අනුපාතික (අ)** | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | 9.00 | **7.50** | -1.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | 10.00 | **8.50** | -1.50 |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය** | 9.24 | **8.00** | -1.24 |
| **රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික** | | | |
| **ප්‍රාථමික වෙළඳපොළ (ආ)** | | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | |
| දින 91 | 14.51 | **8.62** | -5.89 |
| දින 182 | 14.16 | **8.77** | -5.39 |
| දින 364 | 12.93 | **8.96** | -3.97 |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | | |
| වසර 2 | 13.87(ඇ) | **13.83(ඈ)** | -0.04 |
| වසර 3 | 14.07(ඇ) | **11.63(ඈ)** | -2.44 |
| වසර 4 | 14.21(ඇ) | **10.42(ඈ)** | -3.79 |
| වසර 5 | 14.32(ඇ) | **10.75(ඈ)** | -3.57 |
| වසර 10 | - | - | - |
| **ද්විතීයික වෙළඳපොළ** | | | |
| **භාණ්ඩාගාර බිල්පත්** | | | |
| දින 91 | 14.13 | **8.43** | -5.70 |
| දින 182 | 13.86 | **8.61** | -5.25 |
| දින 364 | 12.71 | **8.81** | -3.90 |
| **භාණ්ඩාගාර බැඳුම්කර** | | | |
| වසර 2 | 13.52 | **9.31** | -4.21 |
| වසර 3 | 13.62 | **9.87** | -3.75 |
| වසර 4 | 13.66 | **10.30** | -3.36 |
| වසර 5 | 13.74 | **10.61** | -3.13 |
| වසර 10 | 13.10 | **11.27** | -1.83 |
| **තැන්පතු පොලී අනුපාතික** | | | |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු (ඉ)** | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 0.25-13.00 | **0.25-9.00** | - |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු (ඊ) | 1.00-22.00 | **2.50-18.39** | - |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය | 11.64 | **7.53** | -4.11 |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය | 14.88 | **9.27** | -5.61 |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය | 11.06 | **6.52** | -4.54 |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය | 11.33 | **6.57** | -4.76 |
| **අනෙකුත් මූල්‍ය ආයතන (උ)** | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 3.00 | **3.00** | - |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 8.00 | **7.00** | -1.00 |
| බලපත්‍රලාභී මුදල් සමාගම් (ඌ) | | | |
| ඉතිරිකිරීමේ තැන්පතු | 4.33-6.62 | **3.91 - 6.03** | - |
| එක් අවුරුදු ස්ථාවර තැන්පතු | 11.88-13.56 | **9.23 - 11.00** | - |

වාර්ෂිකව %


| පොලී අනුපාතිකය | 2023 අවසානයට | 2024 අවසානයට | ප්‍රතිශතාංක වෙනස |
|---|---|---|---|
| **ණය පොලී අනුපාතික** | | | |
| **බලපත්‍රලාභී බැංකු (එ)** | | | |
| බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ණය පොලී අනුපාතිකය | 15.33 | **12.48** | -2.85 |
| බරිත සාමාන්‍ය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නව ණය පොලී අනුපාතිකය | 14.96 | **11.59** | -3.37 |
| **බලපත්‍රලාභී වාණිජ බැංකු (ඉ)** | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය පොලී අනුපාතිකය (මාසික) | 12.39 | **8.92** | -3.47 |
| බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය | 14.21 | **11.93** | -2.28 |
| බරිත සාමාන්‍ය නව ණය පොලී අනුපාතිකය | 14.38 | **10.77** | -3.61 |
| **බලපත්‍රලාභී විශේෂිත බැංකු (උ)** | | | |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 15.00-20.00 | **12.75-18.00** | - |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (ඒ) | 9.50-21.00 | **9.00-20.00** | - |
| **බලපත්‍රලාභී මුදල් සමාගම් (ඌ)** | | | |
| මූල්‍ය කල්බදු | 14.98-32.48 | **10.99 - 31.75** | - |
| **සාංගමික ණය වෙළඳපොළ** | | | |
| ණයකර | 13.50-29.50 | **12.00-15.25** | - |
| වාණිජ පත්‍රිකා | 17.00-26.50 | **12.00-13.75** | - |

මූලයන්: ශ්‍රී ලංකා මහ බැංකුව
කොළඹ කොටස් හුවමාරුව
අදාළ මූල්‍ය ආයතන

(අ) 2024 නොවැම්බර් 27 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි, එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ලෙස අර්ථ දැක්වේ. මහ බැංකුව විසින් තීරණය කරන ලද ආන්තික සමඟ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකයට සම්බන්ධ කර ඇත.
(ආ) ආසන්නතම වෙන්දේසියේ දී නිකුත් කළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික
(ඇ) 2023 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය:
වසර 2 - දෙසැ. 28| වසර 3 - දෙසැ.12|
වසර 4 - දෙසැ.28| වසර 5 - දෙසැ.12
(ඈ) 2024 වසරේදී අවසාන ප්‍රාථමික වෙන්දේසිය:
වසර 2 - ජන.11| වසර 3 - නොවැ.12|
වසර 4 - දෙසැ.30| වසර 5 - දෙසැ.12
(ඉ) වාණිජ බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඊ) ඇතැම් වාණිජ බැංකු විසින් සැපයූ විශේෂ පොලී අනුපාතික මෙහි උපරිම පොලී අනුපාතිකය වේ.
(උ) තෝරාගත් අනෙකුත් මූල්‍ය ආයතන විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඌ) පොලී අනුපාතික පරාසයන් බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අදාළ මාසයේදී තැන්පතු ලබා ගැනීම සහ ණය ලබා දීම සඳහා ඉදිරිපත් කරනු ලබන උපරිම සහ අවම සාමාන්‍ය පොලී අනුපාතික මත පදනම් වේ. 2024 වසර සඳහා දත්ත තාවකාලික වේ.
(එ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් සපයන ලද පොලී අනුපාතික මත පදනම් වේ.
(ඒ) නිවාස කටයුතු සඳහා දෙන ලද ණය පමණි.

අනුපාතික ඉහළ යෑම සඳහා වෙළඳපොළ සතු රජයේ සුරැකුම්පත් කල්පිරීම් ඉහළ මට්ටමක පැවතීම මධ්‍යයේ රජයේ අරමුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා රජයේ සුරැකුම්පත් වෙන්දේසිවල ඉදිරිපත් කළ ප්‍රමාණයන් ඉහළ යෑම මෙන්ම, දේශපාලන අවිනිශ්චිතතා හේතුවෙන් ඇති වූ වෙළඳපොළ අපේක්ෂා යනාදී සාධක ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වෙතත්, වෙනස්වන වෙළඳපොළ තත්ත්වයන්ට අනුකූලව මනා හැඩගැස්වීමක් පෙන්නුම් කරමින් 2024 සැප්තැම්බර් මස මැද භාගයේ සිට රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික අඛණ්ඩව පහළ යෑමේ ප්‍රවණතාව නැවත ආරම්භ විය. රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික සමස්තයක් ලෙස අඩු වීම සඳහා විචක්ෂණශීලි රාජ්‍ය මූල්‍ය කළමනාකරණය මෙන්ම, රජය විසින් ප්‍රමාණවත් ස්වාරක්ෂක පවත්වා

1.12 රූප සටහන: රජයේ සුරැකුම්පත් සඳහා ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රය





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගැනීම, රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියේ ප්‍රගතිය සහ මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීම හා වෙළඳපොළ ද්‍රවශීලතාව ඉහළ යෑම මධ්‍යයේ හිතකර උද්ධමන ප්‍රවණතා සහාය විය. මීට අමතරව, රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික පහළ යෑමේ ප්‍රවණතාවය සඳහා 2024 වසර අවසානය වන විට රජයේ සුරැකුම්පත් වෙළඳපොළට ශුද්ධ විදේශ විනිමය ගලා ඒම් වැඩි වීම මෙන්ම උද්ධමනය අඩු වීම සහ හිතකර උද්ධමන අපේක්ෂා තවදුරටත් සහාය විය. 2024 වසර තුළ දී සියලුම කල්පිරීම්වලට අදාළ භාණ්ඩාගාර බිල්පත් ඵලදා අනුපාතික ප්‍රතිශතාංක 4.0-5.9කින් අඩු විය. මෙම ප්‍රවණතාවයට අනුකූලව, භාණ්ඩාගාර බැඳුම්කර ඵලදා අනුපාතික ද පහළ ගියේය. 2024 වසරේ දී භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම්වලින් බොහොමයක් මැදිකාලීන කල්පිරීම් විය. 2024 වසර තුළ දී සිදු වූ විවිධ කල්පිරීම්වලට අදාළ ඵලදා අනුපාතික ආසන්න වශයෙන් ප්‍රතිශතාංක 1.0-4.0කින් පහළ ගියේය. 2023 වසර අවසානයේ දී දක්නට ලැබුණු ද්විතීයික වෙළඳපොළ ඵලදා වක්‍රයේ පැතලි ස්වභාවය හා සැසඳීමේ දී 2024 වසරේ දී ඵලදා වක්‍රය පහළට විතැන් වී ඉහළ-බෑවුම් වක්‍රයක ස්වභාවය ගෙන සාමාන්‍ය තත්ත්වයට පත් විය. එහෙත්, දිගු කාලීන කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කරවල ඵලදා අනුපාතික අඩු වීම මන්දගාමීව පැවතුණි.

## 1.3.2 දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව

**ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම් හරහා රුපියල් ද්‍රවශීලතාව වෙළඳපොළ වෙත සැපයීමෙහි ප්‍රතිඵලයක් ලෙස 2024 වසරේ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** ද්‍රවශීලතා මට්ටම් ඉහළ යෑම සහ දේශීය මුදල් වෙළඳපොළ ක්‍රියාකාරකම් වැඩිදියුණු වීම සැලකිල්ලට ගනිමින් 2023 වසරේ මුල් කාලයේ දී සහභාගීත්ව ආයතන වෙත මහ බැංකුවේ නිත්‍ය පහසුකම් භාවිතය සඳහා පනවන ලද සීමාවන් 2024 පෙබරවාරි මාසයේ දී ලිහිල් කරන ලද අතර, 2024 අප්‍රේල් මාසයේ සිට එම සීමාවන් සම්පූර්ණයෙන් ම ඉවත් කරන ලදී. මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් ආසන්න වශයෙන් රුපියල් බිලියන 858ක ප්‍රමාණයකට සමාන ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම්වලට අමතරව, විශේෂයෙන් ද්විපාර්ශ්වික හවුල්කරුවන් විසින් රජයට ලබා දුන් ශුද්ධ විදේශ ණය ලැබීම් සහ මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු අතර සිදු වූ ශුද්ධ විදේශ විනිමය හුවමාරු ගිවිසුම් හරහා ද දේශීය මුදල් වෙළඳපොළට රුපියල් ද්‍රවශීලතාව සැපයිණි. කෙසේ වෙතත්, මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර සඳහා කූපන් ගෙවීම්, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් කල්පිරීම් සහ ව්‍යවහාර මුදල් බැංකු පද්ධතියෙන් ලබා ගැනීම් මෙන්ම කාලීන ප්‍රතිවිකුණුම් ගනුදෙනු කල්පිරීම් මගින් 2024 වසර තුළ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව යම්තාක් දුරකට අවශෝෂණය කර ගැනුණි. ඒ අනුව, 2023 වසරේ දී සාමාන්‍යයක් ලෙස රුපියල් බිලියන 70ක පමණ පැවති දෛනික ද්‍රවශීලතා හිඟය 2024 වසරේ මැද භාගය වන විට රුපියල් බිලියන 120ක පමණ ද්‍රවශීලතා අතිරික්තයක් දක්වා ඉහළ ගිය අතර, 2024 වසර අවසානය වන විට රුපියල් බිලියන 168ක් පමණ දක්වා තවදුරටත් වර්ධනය විය. සමස්ත ද්‍රවශීලතාව අතිරික්ත මට්ටමික පැවතුණ ද සහභාගීත්ව ආයතන අතර පැවති ද්‍රවශීලතාවයේ අසමමිතික ව්‍යාප්තිය හේතුවෙන් විශේෂයෙන් 2024 වසරේ පළමු භාගයේ දී අන්තර් බැංකු වෙළඳපොළෙහි ක්‍රියාකාරකම් සීමිත විය. ගනුදෙනු සඳහා පවතින ප්‍රතිපාර්ශ්වීය සීමාවන් හේතුවෙන් විදේශීය බැංකුවල පැවති අතිරික්ත ද්‍රවශීලතාව, ද්‍රවශීලතා හිඟ බැංකුවලට බොහෝ දුරට ලබා ගත නොහැකි වූ නමුත් 2024 වසර අවසානය වන විට ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම හේතුවෙන් මෙම තත්ත්වය තරමක් දුරට වෙනස් විය. ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට

1.13 රූප සටහන: ප්‍රධාන කෙටි කාලීන පොලී අනුපාතික සහ වෙළඳපොළ ද්‍රවශීලතාව




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අනුකූලව අවශ්‍යතා පදනම මත ද්‍රවශීලතාව සම්පාදනය කරමින් වෙළඳපොළ සහභාගීත්ව ආයතන අතර පැවති ද්‍රවශීලතා අසමමිතික ව්‍යාප්තිය අවම කිරීම සඳහා දේශීය මුදල් වෙළඳපොළට විවට වෙළඳපොළ කටයුතු ඔස්සේ නිරන්තර මැදිහත් වීම් සිදු කිරීම මහ බැංකුව අඛණ්ඩව සිදු කළේය. කෙසේ වෙතත්, ද්‍රවශීලතාව අඛණ්ඩව සැලකිය යුතු ලෙස අතිරික්ත මට්ටමක පැවතීමත් වෙළඳපොළ සහභාගීත්ව ආයතන අතර ක්‍රියාකාරකම් ඉහළ යෑමත් සමඟ මහ බැංකුව විවට වෙළඳපොළ කටයුතු ක්‍රමයෙන් අඩු කළ අතර, 2024 වසරේ දෙසැම්බර් මස මුල් කාලයේ සිට එක්දින ප්‍රතිවිකුණුම් මෙහෙයුම් නතර කළේය.

### 1.3.3 ණය සමස්ත


**බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2024 වසර තුළ දී සැලකිය යුතු ලෙස වර්ධනය විය.** වෙනස් වෙමින් පවතින ආර්ථික තත්ත්ව මධ්‍යයේ ණය ලබා දීම වඩාත් සුපරීක්ෂාකාරීව සිදු කිරීම සහ ණය සඳහා වූ අඩු ඉල්ලුම පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2024 වසරේ මුල් කාලය තුළ දී අසමාන ප්‍රවණතාවක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, 2024 වසරේ මැද භාගයේ සිට සාධක කිහිපයක බලපෑම හේතුවෙන් පෞද්ගලික අංශයට ලබා දුන් ණය තිරසාර සහ සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීමක් පෙන්නුම් කළේය. මෙහිදී, මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව ලිහිල් කිරීම ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, ප්‍රතිපත්ති පොලී අනුපාතික අඩු කිරීම හේතුවෙන් ද්‍රවශීලතා තත්ත්වයන් වැඩිදියුණු වීම සහ ණය ගැනීමේ පිරිවැය අඩු වීම සිදු වූ අතර, එමගින් ව්‍යාපාර සහ පුද්ගලයින් යන දෙපිරිසට ම මූල්‍යන පහසුකම් ලබා ගැනීම දිරිගන්වන ලදී. මීට අමතරව, වර්ධනය වූ ව්‍යාපාරික විශ්වාසය මෙන්ම දේශීය ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම ද විශේෂයෙන් ම 2024 මැයි මාසයේ සිට ණය වර්ධනය සඳහා දායක විය. ඒ අනුව, 2023 වසර අවසානයේ වාර්තා කළ සංකෝචනය වීමට සාපේක්ෂව 2024 දෙසැම්බර් මාසයේ දී 10.7%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2024 වසර තුළ දී රුපියල් බිලියන 789.6කින් ඉහළ ගියේය. මේ අතර, අඩු පොලී අනුපාතික පරිසරය මධ්‍යයේ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2024 වසර අවසානය වන විට 2.5%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් 2024 වසර තුළ දී රුපියල් බිලියන 27.9කින් පමණ ඉහළ ගියේය. එසේ වුවද, මූල්‍ය අංශය තුළ ද්‍රවශීලතා තත්ත්ව වර්ධනය වීමේ සහාය ද සමඟ පාරිභෝගික ණය විශේෂයෙන් රන් සහ පෞද්ගලික ණය මෙන්ම වාහන ලීසිං සඳහා වූ ණය ඉල්ලුම ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතුකොටගෙන මුදල් සමාගම් විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය 2024 වසර අවසානය වන විට 21.0%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් 2024 වසර තුළ දී රුපියල් බිලියන 277.1කින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

**ව්‍යාපාර විශ්වාසය වැඩිදියුණු වීම මධ්‍යයේ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් ආර්ථිකයේ ප්‍රධාන අංශ වෙත ලබා දුන් ණය[18] 2024 වසර තුළ දී සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** කර්මාන්ත ආශ්‍රිත ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් කර්මාන්ත අංශය වෙත ලබා දුන් ණය (සමස්ත ණය ප්‍රමාණයෙන් 39.7%ක් වන) 2024 වසර අවසානයේ දී 8.4%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. දීර්ඝ කාලයක් මුළුල්ලේ මන්දගාමීව පැවති ඉදිකිරීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, කර්මාන්ත අංශය සඳහා විශාලතම දායකත්වය සපයන ඉදිකිරීම් උප අංශයට ලැබුණු ණය වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් 5.5%ක වර්ධනයක් වාර්තා කළේය. රෙදිපිළි හා ඇඟලුම්; රසායනික, ඛනිජ තෙල්, ඖෂධ හා සෞඛ්‍ය සේවා සහ රබර් හා ප්ලාස්ටික් නිෂ්පාදන; ලෝහ නිමැවුම් නිෂ්පාදන, යන්ත්‍රෝපකරණ සහ ප්‍රවාහන උපකරණ; සහ ආහාර සහ පාන යනාදී උප අංශවලට ලබා දුන් ණය ද ප්‍රසාරණය වීමක් වාර්තා කළේය. 2024 වසර අවසානයේ දී 12.3%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් සේවා අංශය වෙත ලබා දුන් ණය ද (සමස්ත ණය ප්‍රමාණයෙන් 27.4%ක් වන) වසර තුළ දී ඉහළ ගියේය. සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් තොග සහ සිල්ලර වෙළඳාම; මූල්‍ය හා ව්‍යාපාරික සේවා; සන්නිවේදන සහ තොරතුරු තාක්ෂණය; සහ නාවික, ගුවන් සහ භාණ්ඩ නිෂ්කාශන යන උප අංශ වෙත ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. කෘෂිකාර්මික අංශය වෙත ලබා දුන් ණය (සමස්ත ණය ප්‍රමාණයෙන් 9.0%ක් වන) 2024 වසර අවසානය වන විට 12.6%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. මෙම අංශය තුළ, ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදන සහ අපනයන ඉලක්කකරගත් වෙළඳ භාණ්ඩ සඳහා වන ණය වර්ධනය වීම පිළිබිඹු කරමින් තේ, පොල්, වී සහ ධීවර කටයුතු සඳහා ලබා දුන් ණය ඉහළ ගියේය. පෞද්ගලික ණය සහ අත්තිකාරම් ද (සමස්ත ණය ප්‍රමාණයෙන් 23.9%ක් වන) 2024 වසර අවසානය වන විට 11.3%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කළේය. මෑත වසරවල දී අඛණ්ඩ ප්‍රසාරණයක් පෙන්නුම් කළ උකස් ණය 2024 වසරේ දී 20.5%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. රත්‍රන් මිල ඉහළ යෑම මෙන්ම ණය ලබා ගැනීමේ පහසුම සහ කඩිනම් ක්‍රමය රන් භාණ්ඩ උකස් කිරීම වීම මෙම සැලකිය යුතු ණය ප්‍රසාරණයට හේතු විය. තවද, පාරිභෝගිකයන්ගේ වියදම් කිරීමේ හැකියාව සහ මූල්‍ය අංශයේ ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම

18 බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සහ අත්තිකාරම් පිළිබඳ කාර්තුමය සමීක්ෂණය මත මෙම කරුණු පදනම් වී ඇත.

1

**1.14 රූප සටහන: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


පිළිබිඹු කරමින් ණය කාඩ්පත් ආශ්‍රිත ණය ද වසර තුළ දී වර්ධනය විය. මේ අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සඳහා අදාළ පරිණත කාල ආවරණ වර්ගීකරණය සැලකූ විට, දිගු කාලීන ණය වර්ධනයට වඩා කෙටි කාලීන සිට මැදි කාලීන ණය වර්ධනය ඉහළ අගයක පවතින බව පෙන්නුම් කෙරේ. ආර්ථික ක්‍රියාකාරකම් අඛණ්ඩව යථා තත්ත්වයට පත් වීමත් සමඟ මැදි කාලීන සහ දිගු කාලීන ණය ප්‍රසාරණය ඉදිරියේ දී අඛණ්ඩව සිදු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**2023 වසර තුළ දක්නට ලද ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින් 2024 වසර තුළ දී රජය සතු වාණිජ ව්‍යාපාර, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ලබා ගත් ණය ප්‍රමාණය තවදුරටත් පහළ ගියේය.** ප්‍රධාන වශයෙන් පිරිවැය පිළිබිඹු කෙරෙන මිල වෙනස් කිරීම් අඛණ්ඩව සිදු කිරීම සහ රජය සතු වාණිජ ව්‍යාපාරවල මූල්‍ය කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා අඛණ්ඩව සිදු කරන ලද අනෙකුත් ප්‍රතිසංස්කරණ මගින් රජය සතු වාණිජ ව්‍යාපාරවල මූල්‍ය තත්ත්වය වර්ධනය වීම මධ්‍යයේ රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යාපාර සිය ණය වගකීම් ශුද්ධ පදනම මත බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නැවත පියවීම හේතුවෙන් 2024 වසර තුළ දී රජය සතු වාණිජ ව්‍යාපාර බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ලබා ගත් ණය ප්‍රමාණය රුපියල් බිලියන 113.1කින් පහළ ගියේය. ප්‍රධාන රජය සතු වාණිජ ව්‍යාපාර අතුරින්, ලං.ඛ.නී.සං. 2023 වසරේ දී බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත පැවති සිය ණය වගකීම් රජය වෙත පැවරීමෙන් පසු 2024 වසර තුළ දී ශුද්ධ පදනම මත රුපියල් බිලියන 59.4ක් නැවත පියවීම සිදු කළ අතර එමගින් ලං.ඛ.නී.සං. බැංකු අංශය මත රඳා පැවතීම සැලකිය යුතු ලෙස අඩු විය. පිරිවැය පිළිබිඹු කෙරෙන මිල වෙනස් කිරීම් හේතුවෙන් මූල්‍ය තත්ත්වය වර්ධනය වීමෙහි සහාය ලබමින් ලං.වි.ම. ද ආසන්න වශයෙන් රුපියල් බිලියන 27.2ක් ශුද්ධ පදනම මත නැවත පියවීම සිදු කර ඇත. මීට අමතරව, 2024 වසර තුළ දී මාර්ග සංවර්ධන අධිකාරිය සහ කොළඹ කොමර්ෂල් පොහොර සමාගම ද ශුද්ධ පදනම මත ණය නැවත පියවීම සිදු කර ඇත. එසේම, එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම තුළින් ඇතැම් රජය සතු වාණිජ ව්‍යාපාර ලබාගත් විදේශ මුදලින් නාමනය කරන ලද ණයවලට සමාන රුපියල් වටිනාකම අඩු වී ඇත.

**බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ යෑම මධ්‍යයේ ප්‍රධාන වශයෙන් මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය සංකෝචනය වීම හේතුවෙන් 2024 වසර තුළ දී බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය රුපියල් බිලියන 14.9කින් සංකෝචනය විය.** 2023 වසරේ දී දක්නට ලද ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන යමින් 2024 වසර තුළ දී මහ බැංකුව විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය රුපියල් බිලියන 602.7කින් සැලකිය යුතු ලෙස පහළ ගියේය.[19] මේ සඳහා මහ බැංකුව සතු රජයේ භාණ්ඩාගාර බිල්පත් තොගය කල් පිරීම සහ සහභාගීත්ව ආයතන විසින් මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම මත රඳා පැවතීම අඩු වීම ප්‍රධාන වශයෙන් හේතු විය. එසේ වුවද, බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම් පත් මත ආයෝජනය

19 මහ බැංකුව සතු භාණ්ඩාගාර බැඳුම්කර තොගයේ වෙළඳපොළ වටිනාකම ඇස්තමේන්තු කිරීම සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදය වෙනස්වීම 2024 නොවැම්බර් මාසය තුළ බැංකු පද්ධතිය විසින් රජය වෙත සපයන ලද ශුද්ධ ණය සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීමට හේතු විය.

**1.15 රූප සටහන: බැංකු පද්ධතියෙන් රාජ්‍ය අංශයට ලබා දුන් ශුද්ධ ණයෙහි වාර්ෂික වෙනස**




(අ) 2023 ජනවාරි 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී. ඒ අනුව, මෙම ගැළපීම අදියර දෙකකින් ක්‍රියාත්මක කරමින් ප්‍රථමයෙන් 2023 අප්‍රේල් මාසයේදී සහ ඉන් අනතුරුව 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද අතර, එය අදාළ රාජ්‍ය බැංකුවල ශේෂ පත්‍රවල පිළිබිඹු වේ. මේ හේතුවෙන්, රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර, රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කිරීම ඉහළ යෑම පිළිබිඹු කරමින් බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය රුපියල් බිලියන 587.8කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, රජයේ සුරැකුම්පත් මත ආයෝජනය පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී අඩු අගයක් විය. අඩු ඵලදා අනුපාතික හේතුවෙන් එම ආයෝජනවල ආකර්ශණීය බව අඩු වීම මේ සඳහා හේතු විය හැකිය. මේ අතර, 2024 වසරේ දී මූල්‍ය සමීක්ෂණයට ($M_4$)[20] අනුව රජය වෙත ලබා දුන් ශුද්ධ ණය අඩු වීම රුපියල් බිලියන 37.6ක් විය. මේ යටතේ, බලපත්‍රලාභී විශේෂිත බැංකු රජයේ සුරැකුම්පත් මත ආයෝජනය කිරීම ඉහළ යෑමත් සමඟ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය රුපියල් බිලියන 56.3කින් ඉහළ ගිය අතර, මුදල් සමාගම් විසින් රජය වෙත ලබා දුන් ශුද්ධ ණය වසර තුළ දී රුපියල් බිලියන 79.0කින් සංකෝචනය විය.

## 1.3.4 මුදල් සමස්ත

**2024 වසරේ දී සංචිත මුදල් පෙර වසරට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළ අතර, ඒ සඳහා සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ඉහළ යෑම ප්‍රධාන වශයෙන් හේතු විය.** 2024 අප්‍රේල් මාසයේ දී උත්සව සමයේ ඉල්ලුම හේතුවෙන් සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඉන් පසුව බැංකු පද්ධතියට ව්‍යවහාර මුදල් නැවත ලැබීමත් සමඟ 2024 මැයි මස අවසානය වන විට සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ක්‍රමයෙන් අඩු විය. කෙසේ වෙතත්, ඉන්පසුව අඩු උද්ධමන පරිසරයක් මධ්‍යයේ සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය ඉහළ මට්ටමක පැවතුණි. මැතිවරණ ආශ්‍රිත වියදම් මධ්‍යයේ මුදල් සඳහා ඇති ඉල්ලුම වැඩි වීම සහ වසර අවසාන උත්සව සමයේ ඉල්ලුම ද සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ඉහළ මට්ටමක පැවතීමට හේතු විය. මීට අමතරව, ව්‍යවහාර මුදල් පදනම් වූ ගනුදෙනු වෙත ක්‍රමයෙන් යොමු වීම ද දක්නට ලැබුණු අතර, බදු ගෙවීම පැහැර හැරීමේ අරමුණු මේ සඳහා හේතු විය හැකිය. ඒ අනුව, 2024 වසරේ දී සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් රුපියල් බිලියන 172.2කින් ඉහළ ගියේය. මේ අතර, මහ බැංකුවේ නිත්‍ය පහසුකම් වෙත බලපත්‍රලාභී වාණිජ බැංකුවලට ප්‍රවේශ වීම සීමා කිරීම සඳහා මහ බැංකුව ගත් නියාමන ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙන යනු ලැබූ අක්‍රමවත් විශාල අතිරික්ත සංචිත හේතුවෙන් 2024 පළමු කාර්තුවේ දී සංචිත මුදල්වල සැලකිය යුතු විචලන දක්නට ලැබුණි. 2024 අප්‍රේල් මාසයේ සිට බලපැවැත්වෙන පරිදි එම නියාමන සීමා ඉවත් කිරීමත් සමඟ සංචිත මුදල්වල දක්නට ලැබුණු එවැනි විචලන ක්‍රමයෙන් අඩු විය. බලපත්‍රලාභී වාණිජ බැංකුවල රුපියල් තැන්පතු වගකීම් ඉහළ යෑම හේතුවෙන් වාණිජ බැංකු විසින් මහ බැංකුවේ පවත්වාගෙන යන සංචිත තැන්පතු ඉහළ යෑම ද සංචිත මුදල් ප්‍රසාරණයට සහාය විය. ඒ අනුව, 2024 වසර අවසානය වන විට සංචිත මුදල් 15.8%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරමින් රුපියල් බිලියන 1,539.3ක් දක්වා ඉහළ ගියේය.

**මහ බැංකුවේ ශේෂ පත්‍රයේ වත්කම් අංශයෙන් සැලකූ විට, 2024 වසර තුළ සංචිත මුදල් ප්‍රසාරණය වීම සඳහා ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම මුළුමනින්ම හේතු විය.** මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් අඛණ්ඩව ඉහළ ගිය අතර, 2021 ජූලි මාසයෙන් පසු ප්‍රථම වතාවට 2024 ඔක්තෝබර් මාසයේ දී ධන අගයක් වාර්තා කරමින් 2024 වසර තුළ දී රුපියල් බිලියන 1,059.5කින් ඉහළ ගියේය. විදේශීය වත්කම් වැඩිවීමේ සහ විදේශීය වගකීම් අඩුවීමේ ඒකාබද්ධ බලපෑම මේ සඳහා හේතු විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් ශුද්ධ පදනම මත විදේශ විනිමය මිලදී ගැනීම් හරහා විදේශ සංචිත ඉහළ යෑම විදේශීය වත්කම්වල වැඩිදියුණුවීම් සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූ අතර, ඉන්දියානු සංචිත බැංකුව සමඟ පැවති විදේශ විනිමය හුවමාරු පහසුකම නැවත පියවීම ඇතුළු විදේශ ණය සේවාකරණය හේතුවෙන් විදේශීය වගකීම් ක්‍රමයෙන් අඩු විය. මේ අතර, රජයට ලබා දුන් ශුද්ධ ණය සංකෝචනය වීම, විශේෂයෙන් මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් තොගය (ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම්හි ශුද්ධ අගය ගැළපීමෙන් පසු) අඩු වීම මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් සංකෝචනය වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, මහ බැංකුව විසින් සපයන ලද ද්‍රවශීලතා ආධාරක පහසුකම සම්පූර්ණයෙන් පියවීම හේතුවෙන් මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත සපයන ලද ණය හිමිකම් පහළ යෑම ද වසර තුළ

20 මූල්‍ය සමීක්ෂණය මුදල් සැපයුම පිළිබඳ වඩාත් පුළුල් මිනුමක් වන අතර, එමගින් ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී වාණිජ බැංකු මෙන්ම බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ මුදල් සමාගම් ද ඇතුළුව සියලුම තැන්පතු ලබා ගන්නා ආයතන ආවරණය කරනු ලබයි.

1

### 1.8 සංඛ්‍යා සටහන: මුදල් සමස්තවල ප්‍රවණතා

රුපියල් බිලියන

| අයිතමය | 2020 අවසානයට | 2021 අවසානයට | 2022 අවසානයට | 2023 අවසානයට | 2024 අවසානයට (අ) |
|---|---|---|---|---|---|
| **1. සංචිත මුදල්** | **964** | **1,306** | **1,349** | **1,329** | **1,539** |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 3.4 | 35.4 | 3.3 | -1.5 | **15.8** |
| මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් | 527 | -387 | -1,614 | -837 | **222** |
| මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් | 438 | 1,693 | 2,963 | 2,166 | **1,317** |
| **2. පටු මුදල් සැපයුම ($M_1$)** | **1,177** | **1,460** | **1,454** | **1,658** | **1,926** |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 36.0 | 24.0 | -0.4 | 14.1 | **16.1** |
| **3. පුළුල් මුදල් සැපයුම ($M_{2b}$)** | **9,406** | **10,647** | **12,290** | **13,189** | **14,322** |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 23.4 | 13.2 | 15.4 | 7.3 | **8.6** |
| **3.1 ශුද්ධ විදේශීය වත්කම්** | **-209** | **-982** | **-1,767** | **-456** | **573** |
| මුදල් අධිකාරීන් (ආ) | 527 | -387 | -1,614 | -837 | **222** |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | -736 | -595 | -153 | 381 | **351** |
| **3.2 ශුද්ධ දේශීය වත්කම්** | **9,615** | **11,629** | **14,056** | **13,645** | **13,749** |
| දේශීය ණය | 11,721 | 14,002 | 16,632 | 16,421 | **17,083** |
| රජයට ලබා දුන් ශුද්ධ ණය | 4,548 | 5,832 | 7,471 | 8,285(ඇ) | **8,270** |
| මහ බැංකුව | 869 | 2,094 | 3,432 | 2,376 | **1,774** |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 3,679 | 3,738 | 4,039 | 5,909 | **6,497** |
| රාජ්‍ය සංස්ථාවලට / රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය | 1,002 | 1,188 | 1,750 | 770(ඇ) | **657** |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය | 6,171 | 6,981 | 7,411 | 7,366 | **8,156** |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 6.5 | 13.1 | 6.2 | -0.6 | **10.7** |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -2,106 | -2,373 | -2,576 | -2,776 | **-3,334** |
| **4. පුළුල් මුදල් සැපයුම ($M_4$)** | **11,462** | **12,985** | **14,840** | **15,829** | **17,261** |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 21.4 | 13.3 | 14.3 | 6.7 | **9.0** |
| **4.1 ශුද්ධ විදේශීය වත්කම්** | **-217** | **-999** | **-1,767** | **-456** | **552** |
| මුදල් අධිකාරීන් (ආ) | 527 | -387 | -1,614 | -837 | **222** |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | -736 | -595 | -153 | 381 | **351** |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | -8 | -17 | 0 | 0 | **-21** |
| **4.2 ශුද්ධ දේශීය වත්කම්** | **11,679** | **13,984** | **16,607** | **16,285** | **16,709** |
| රජයට ලබා දුන් ශුද්ධ ණය | 5,366 | 6,769 | 8,469 | 9,507(ඇ) | **9,470** |
| මහ බැංකුව | 869 | 2,094 | 3,432 | 2,376 | **1,774** |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 3,679 | 3,738 | 4,039 | 5,909 | **6,497** |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 742 | 845 | 881 | 1,022 | **1,078** |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 75 | 92 | 116 | 200 | **121** |
| රාජ්‍ය සංස්ථාවලට / රජය සතු වාණිජ ව්‍යාපාරවලට ලබා දුන් ණය (බලපත්‍රලාභී වාණිජ බැංකු මගින්) | 1,002 | 1,188 | 1,750 | 770(ඇ) | **657** |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණය | 8,285 | 9,339 | 9,917 | 9,815 | **10,910** |
| (වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය %) | 6.3 | 12.7 | 6.2 | -1.0 | **11.2** |
| බලපත්‍රලාභී වාණිජ බැංකු | 6,171 | 6,981 | 7,411 | 7,366 | **8,156** |
| බලපත්‍රලාභී විශේෂිත බැංකු | 936 | 1,094 | 1,159 | 1,126 | **1,154** |
| බලපත්‍රලාභී මුදල් සමාගම් | 1,177 | 1,264 | 1,347 | 1,323 | **1,600** |
| අනෙකුත් අයිතම (ශුද්ධ) | -2,973 | -3,312 | -3,529 | -3,807 | **-4,327** |
| **විශේෂ සටහන්:** | | | | | |
| මුදල් ගුණකය ($M_{2b}$) | 9.75 | 8.15 | 9.11 | 9.93 | **9.30** |
| සංසරණ ප්‍රවේගය ($M_{2b}$ සාමාන්‍ය) (ඈ) | 1.84 | 1.73 | 2.04 | 2.17(ඉ) | **2.18** |

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් මෙන්ම රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් වාර්තා කරනු ලබන රජයේ රන් පවුම් ශේෂය ද මෙහි අන්තර්ගත වේ.

(ඇ) 2023 ජනවාරි 30 වැනි දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ඇතිව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ඇපකර යටතේ පැවති නොපියවූ විදේශ විනිමය ණය 2022 දෙසැම්බර් මාසයේ සිට මධ්‍යම රජයේ ණය ලෙස සලකන ලදී. ඒ අනුව, මෙම ගැළපීම අදියර දෙකකින් ක්‍රියාත්මක කරමින් ප්‍රථමයෙන් 2023 අප්‍රේල් මාසයේදී සහ ඉන් අනතුරුව 2023 දෙසැම්බර් මාසයේදී සිදු කරන ලද අතර එය අදාළ රාජ්‍ය බැංකුවල ශේෂ පත්‍රවල පිළිබිඹු වේ. මේ හේතුවෙන්, රාජ්‍ය සංස්ථා/රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය අඩු වූ අතර රජය වෙත ලබා දුන් ශුද්ධ ණය ඉහළ ගියේය.

(ඈ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය යටතේ නිකුත් කරන ලද) මත පදනම් වේ.

(ඉ) සංශෝධිත


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ශුද්ධ දේශීය වත්කම් අඩුවීමට දායක විය. ඒ අනුව, 2024 වසරේ දී මහ බැංකුවේ ශුද්ධ දේශීය වත්කම් රුපියල් බිලියන 848.9කින් සංකෝචනය විය.

**මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම් ඉහළ යෑම සහ බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ යෑම 2024 වසරේ දී පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) ප්‍රසාරණය සඳහා ප්‍රධාන වශයෙන් දායක විය.** මහ බැංකුව මෙන්ම බලපත්‍රලාභී වාණිජ බැංකු ද ඇතුළත් බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් රුපියල් බිලියන 1,029.0කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්වල ඉහළ යෑම දායක විය. මේ අතර, ප්‍රධාන වශයෙන් විදේශ මුදලින් නාමනය කරන ලද වත්කම් රුපියල්වලින් ගණනය කිරීමේ දී ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය වීම නිසා වූ සංකෝචනාත්මක බලපෑම මෙන්ම බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශීය වත්කම් අඩු වීම හේතුවෙන් එම බැංකුවල ශුද්ධ විදේශීය වත්කම් 2024 වසරේ දී සංකෝචනය විය. කෙසේ වෙතත්, වසර තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශීය වගකීම් අඩු වීම

1

**1.16 රූප සටහන: පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය සඳහා තුඩු දුන් සාධක**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

මගින් මෙම සංකෝචනය යම්තාක් දුරකට සමනය විය. මෙම ප්‍රවණතාවලට අනුකූලව, $M_{2b}$ හි වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය, 2023 වසරේ දී පැවති 7.3%ට සාපේක්ෂව 2024 වසරේ දී 8.6%ක් දක්වා ඉහළ ගියේය. $M_{2b}$ හි ප්‍රවණතාව හා අනුකූලව, මූල්‍ය සමීක්ෂණය මගින් මනිනු ලබන $M_4$ පුළුල් මුදල් සැපයුමේ වර්ධනය ද සමාන වේගයකින් ඉහළ ගියේය. මේ අතර, $M_{2b}$ සහ සංචිත මුදල් අතර අනුපාතය මගින් පෙන්නුම් කරනු ලබන මුදල් ගුණකය, සංචිත මුදල් සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වීම හේතුවෙන්, 2023 වසරේ දී පැවති 9.93 සිට 2024 වසරේ දී 9.30 දක්වා අඩු විය.

## 1.4 විදේශීය අංශයේ ප්‍රවණතා

### 1.4.1 ගෙවුම් තුලනය

#### ජංගම ගිණුම

**2024 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය සිය ධනාත්මක ප්‍රවණතාවය අඛණ්ඩව පවත්වා ගනිමින් විදේශීය ජංගම ගිණුම සැලකිය යුතු අතිරික්තයක් වාර්තා කළේය.** අපනයන ආදායම් වර්ධනය වීමට වඩා ආනයන වියදම් වැඩි වශයෙන් වර්ධනය වීම හේතුවෙන් 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී වෙළඳ ගිණුමේ හිඟය පුළුල් විය. එහෙත්, ක්‍රය ශක්තිය අඩු වීම නිසා ආනයන සඳහා ඉල්ලුම සීමිත වීම සහ වාහන ආනයන සඳහා ඇති සීමා පැවතීම හේතුවෙන් ආනයන අධික ලෙස ඉහළ යාම වැළකුණි. සේවා වෙළඳාමේ, විශේෂයෙන් ම සංචාරක අංශයේ කැපී පෙනෙන වර්ධනය හමුවේ සහ ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය වැඩිවීම මගින් වෙළඳ ගිණුමේ හිඟය පියවුණි. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය ආසන්න වශයෙන් එකම මට්ටමක පැවතුණි. ඒ අනුව, ජංගම ගිණුමේ අතිරික්තය, 2023 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 1.4ට (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 1.7%ට) සාපේක්ෂව, 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 1.2ක් (ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 1.2%ක්) විය.

#### වෙළඳ භාණ්ඩ ගිණුම

**වෙළඳ භාණ්ඩ ගිණුමේ හිඟය පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී පුළුල් වූ නමුත් මෑත වසරවල වාර්තා කළ සාමාන්‍ය අගයන්ට වඩා අඩු මට්ටමක පැවතුණි.** 2015 වසරේ සිට 2019 වසර දක්වා පූර්ව වසංගත කාලය තුළ වාර්තා වූ ඇමරිකානු ඩොලර් බිලියන 9ක පමණ වාර්ෂික වෙළඳ හිඟයේ සාමාන්‍යයට සාපේක්ෂව 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 6.1ක මධ්‍යස්ථ වෙළඳ හිඟයක් වාර්තා කළේය. අපනයන ආදායම 2024 වසරේ වැඩි කාලයක් තුළ පෙර වසරට සාපේක්ෂව ධනාත්මක වර්ධනයක් වාර්තා කළ අතර ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යෑම මෙයට උපකාරී විය. මේ අතර, ඉහළ ආර්ථික ක්‍රියාකාරකම්, ආනයන සීමා ලිහිල් වීම, ලිහිල් මුදල් තත්ත්වයන් සහ ගෝලීය වෙළඳ භාණ්ඩ මිල මට්ටම් හිතකර ලෙස වෙනස්වීම් හේතුවෙන් 2024 වසරේ දී ආනයන වියදම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, වෙළඳ හිඟය පෙර වසරේ වාර්තා වූ 5.9%ක සිට 2024 වසරේ දී 6.1%ක් දක්වා පුළුල් විය.

**මෙවැනි වර්ධනයන් මධ්‍යයේ වුවද, අපනයන මිල ගණන් හා ආනයන මිල ගණන් අතර අනුපාතය අනුව මනිනු ලබන ශ්‍රී ලංකාවේ වෙළඳ මිල අනුපාතය 2024 වසරේ දී සුළු වශයෙන් වර්ධනය වූ අතර ඒ සඳහා අපනයන මිල ගණන් පහත වැටීමට වඩා තරමක් වැඩි වේගයකින් ආනයන මිල ගණන් පහළ වැටීම හේතු විය.** 2024 වසරේ දී අපනයන ආදායම් සහ ආනයන වියදම් යන දෙඅංශයේ ම ඉහළ යෑමට හේතුව ලෙස ආනයන මෙන්ම අපනයන ප්‍රමාණයන් ඉහළ යෑම දැක්විය හැක. මේ අතර, වැඩිදියුණු වූ දේශීය හා ගෝලීය තත්ත්වයන්ගේ සහාය ඇතිව අපනයන සහ ආනයන යන දෙඅංශය ම ප්‍රසාරණය වීමත් සමඟ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, අපනයන ආදායම සහ ආනයන වියදම ඇතුළත් සමස්ත වෙළඳ අගය, 2024 වසරේ දී 10.1%කින් (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) ඉහළ ගියේය. කෙසේවුවද, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී වෙළඳ විවෘතභාවය පහළ ගිය අතර, 1990 දශකයේ පැවති මට්ටමට සාපේක්ෂව පහළ මට්ටමක පැවතුණි.

#### අපනයන ක්‍රියාකාරීත්වය

**වෙළඳ භාණ්ඩ අපනයන අංශය 2024 වසරේ දී කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළේය.** මෙම වර්ධනය තුළින් රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සහ අභියෝගාත්මක බාහිර පරිසර තත්ත්වයන් මධ්‍යයේ ගොඩනැගුණු ඔරොත්තු දීමේ හැකියාව පිළිබිඹු විය. 2024 වසරේ දී

## 1.9 සංඛ්‍යා සටහන: ජංගම සහ ප්‍රාග්ධන ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| අයිතමය | 2023 (අ) | 2024 (ආ) |
|---|---|---|
| **ජංගම ගිණුම (ශුද්ධ)** | **1,439** | **1,206** |
| ලැබීම් | 23,776 | **26,877** |
| ගෙවීම් | 22,337 | **25,671** |
| | | |
| **වෙළඳ ශේෂය** | **-4,900** | **-6,069** |
| අපනයන | 11,911 | **12,772** |
| කෘෂිකාර්මික | 2,567 | **2,774** |
| කාර්මික | 9,278 | **9,947** |
| ඛනිජ | 38 | **25** |
| වෙනත් | 28 | **26** |
| ආනයන | 16,811 | **18,841** |
| පාරිභෝගික | 3,044 | **3,466** |
| අන්තර් | 11,007 | **11,915** |
| ආයෝජන | 2,745 | **3,448** |
| වෙනත් | 16 | **13** |
| | | |
| **සේවා (ශුද්ධ)** | **3,053** | **3,435** |
| ලැබීම් | 5,416 | **6,910** |
| එයින්; | | |
| ප්‍රවාහන | 1,550 | **1,794** |
| සංචාරක | 2,068 | **3,169** |
| පරිගණක සේවා | 795 | **848** |
| ඉදිකිරීම් | 355 | **212** |
| ගෙවීම් | 2,363 | **3,475** |
| එයින්; | | |
| ප්‍රවාහන | 732 | **1,017** |
| සංචාරක | 503 | **755** |
| පරිගණක සේවා | 198 | **194** |
| ඉදිකිරීම් | 111 | **127** |
| | | |
| **ප්‍රාථමික ආදායම් (ශුද්ධ)** | **-2,548** | **-2,599** |
| ලැබීම් | 460 | **609** |
| සේවක වැටුප් | 53 | **146** |
| ආයෝජන ආදායම් | 407 | **463** |
| සෘජු ආයෝජන | 8 | **73** |
| අනෙකුත් ආයෝජන | 349 | **271** |
| සංචිත වත්කම් | 49 | **119** |
| ගෙවීම් | 3,007 | **3,208** |
| සේවක වැටුප් | 30 | **20** |
| ආයෝජන ආදායම් | 2,977 | **3,188** |
| සෘජු ආයෝජන | 916 | **942** |
| විවිධ ආයෝජන | 854 | **877** |
| අනෙකුත් ආයෝජන | 1,207 | **1,369** |
| | | |
| **ද්විතියික ආදායම් (ශුද්ධ)** | **5,834** | **6,439** |
| ලැබීම් | 5,989 | **6,585** |
| එයින්; | | |
| සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 5,970 | **6,575** |
| ගෙවීම් | 155 | **146** |
| | | |
| **ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **37** | **12** |
| ලැබීම් | 40 | **20** |
| ගෙවීම් | 3 | **8** |
| | | |
| **ජංගම සහ ප්‍රාග්ධන ගිණුම (ශුද්ධ)** | **1,476** | **1,217** |
| | | |
| **ද.දේ.නි.යෙහි % ලෙස** | | |
| වෙළඳ ශේෂය | -5.9 | **-6.1** |
| භාණ්ඩ හා සේවා ශේෂය | -2.2 | **-2.7** |
| ජංගම ගිණුමේ ශේෂය | 1.7 | **1.2** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අපනයන ආදායම එ.ජ. ඩොලර් බිලියන 12.8ක් ලෙස වාර්තා වූ අතර, 2023 වසරට සාපේක්ෂව එය 7.2%ක වර්ධනයකි. කෙසේ වෙතත්, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, අපනයන ආදායම 2023 වසරේ දී වාර්තා වූ 14.2%ක සිට 2024 වසරේ දී 12.9%ක් දක්වා පහළ ගිය ද එය 2015 වසරේ සිට 2019 වසර දක්වා පූර්ව වසංගත කාලය තුළ වාර්තා වූ 12.4%ක සාමාන්‍යයට වඩා ඉහළ අගයකි.

## 1.10 සංඛ්‍යා සටහන: වෙළඳ භාණ්ඩ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය


| කාණ්ඩය | 2023 වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | 2024 වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | වාර්ෂික වෙනස්වීම % |
|---|---|---|---|
| **අපනයන** | **11,910.7** | **12,772.0** | **7.2** |
| කාර්මික | 9,277.7 | **9,946.9** | **7.2** |
| කෘෂිකාර්මික | 2,566.5 | **2,774.5** | **8.1** |
| ඛනිජ | 38.5 | **24.5** | **-36.2** |
| වර්ග නොකළ | 28.0 | **26.1** | **-6.6** |
| **ආනයන** | **16,811.1** | **18,841.4** | **12.1** |
| පාරිභෝගික | 3,043.9 | **3,465.7** | **13.9** |
| ආහාර හා පාන වර්ග | 1,693.0 | **1,914.3** | **13.1** |
| ආහාර නොවන පාරිභෝගික | 1,350.9 | **1,551.4** | **14.8** |
| අන්තර් | 11,006.6 | **11,914.5** | **8.2** |
| ආයෝජන | 2,744.6 | **3,448.2** | **25.6** |
| වර්ග නොකළ | 16.0 | **13.0** | **-18.8** |
| **වෙළඳ ශේෂය** | **-4,900.4** | **-6,069.4** | |
| **මුළු වෙළඳාම** | **28,721.8** | **31,613.4** | **10.1** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
බනිජ තෙල් අපනයනකරුවන් සහ ආනයනකරුවන්
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ශ්‍රී ලංකා මහ බැංකුව

**කාර්මික අපනයනවල ඉහළ යෑම අපනයන ආදායම වර්ධනයට ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළේය.** 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී 97.2%ක වැඩිවීමක් සමඟ ඉතිහාසයේ පළමු වරට ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයනය එ.ජ. ඩොලර් බිලියනයක මට්ටම ඉක්මවා ගියේය. නැව් සහ ගුවන් යානා ඉන්ධන සැපයුම් පරිමාවන් ඉහළ යෑම අපනයන ආදායම වැඩිවීමට ප්‍රධාන හේතුව වූ අතර, එමගින් අගය එකතු කිරීම අඩු වුවද, අපනයනවල සමස්ත වැඩිවීමට ප්‍රධාන දායකත්වයක් ලබා දුන් අංශයක් බවට පත් විය. ඛනිජ තෙල් අපනයන මෙසේ අධික ලෙස ඉහළ යෑමට රතු මුහුද ආශ්‍රිත නැව් ගමනාගමනයට ඇති වූ බාධා යම්තාක් දුරකට හේතු වූ අතර, නැව් සඳහා ඉන්ධන සැපයුම් සේවා සහ බලශක්ති ආශ්‍රිත නිෂ්පාදිත සඳහා ගෝලීය ඉල්លුම ශක්තිමත්ව පවතින බව සහ ප්‍රමාණවත් අගය එකතු කිරීමක් සහතික කිරීම සඳහා රට තුළ පිරිපහදු ධාරිතාව ශක්තිමත් කිරීමට ඇති අපේක්ෂාවන් සැලකීමේ දී, මෙම අංශය තවදුරටත් දියුණු කිරීම තුළින් වාසි ලබා ගැනීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව පෙන්නුම් කරයි. තවද, රෙදිපිළි සහ ඇඟලුම් අපනයන (ප්‍රධාන වශයෙන් ඇඟලුම්) සැලකිය යුතු ඉහළ යෑමක් දක්නට ලැබුණි. 2024 වසරේ දී ආහාර, පාන වර්ග සහ දුම්කොළ අපනයන ආදායම තවදුරටත් ඉහළ යෑම සඳහා අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයනය ප්‍රධාන වශයෙන් හේතු විය. මේ අතර, රබර් ආශ්‍රිත නිෂ්පාදිත අපනයනය ද ඉහළ ගිය

1

**1.3 විශේෂාංග රූප සටහන්**
**මාසික විදේශීය ජංගම ගිණුමේ සංඛ්‍යාන දත්ත**




2024 වසරේ දී මාස දෙකක හැර බොහෝ මාසවල දී ජංගම ගිණුමේ ශේෂය ධන අගයක පැවතීම හේතුවෙන් ජංගම ගිණුමේ වාර්ෂික අතිරික්තයක් වාර්තා විය. සංචාරකයන්ට වීසා පහසුකම් ලබා දීම ආශ්‍රිතව මතු වූ බාධා හේතුවෙන් සංචාරක ව්‍යාපාරයට බලපෑම් එල්ල වීම සහ සංචාරකයන් සාමාන්‍යයෙන් අඩුවෙන් පැමිණෙන කාල වකවානුවක් වීම නිසා 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සේවා ගිණුමේ අතිරික්තය අසාමාන්‍ය ලෙස අඩු විය. 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී, ප්‍රාථමික ආදායම් ගිණුමේ පොලී ගෙවීම් ලෙස සහ සේවා ගිණුමේ රජයේ වියදම් ලෙස සැලකිය යුතු ගෙවීම් සිදු වූ අතර, ඒ දෙක ම ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ විය. 2025 වසරේ මුල් මාස දෙක තුළ දී ද ජංගම ගිණුමේ අතිරික්තයක් වාර්තා වූ අතර, සංචාරක ඉපැයීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල ශක්තිමත් වර්ධනය මේ සඳහා හේතු විය.

අතර ඒ සඳහා අත්වැසුම් අපනයන ප්‍රධාන වශයෙන් හේතුවිය. කෙසේ වෙතත්, 2024 වසරේ දී මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ මෙන්ම යන්ත්‍රසූත්‍ර සහ යාන්ත්‍රික උපකරණ අපනයන ආදායමේ පහළ යෑමක් වාර්තා කළේය.


**2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී කෘෂිකාර්මික අපනයන ආදායමෙහි ද වැඩිවීමක් පෙන්නුම් කළේය.** කෘෂිකාර්මික අපනයන අතරින්, තේ, පොල් ආශ්‍රිත නිෂ්පාදිත සහ කුළුබඩු අපනයන සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කළේය. තේ අපනයන ආදායම ඉහළ යෑම, අපනයන පරිමා සහ මිල ගණන් යන දෙඅංශයේ ම ඉහළ යෑමෙහි ප්‍රතිඵලයක් වූ අතර, එමගින් ශ්‍රී ලංකාවේ තේ සඳහා ඇති නොවෙනස් ගෝලීය ඉල්ලුම ඉස්මතු කරයි. කෙසේ වුවද, තේ අපනයන පරිමාව 2024 වසරේ දී පෙර වසරට සාපේක්ෂව ඉහළ ගියද, එය 2015 වසර සිට 2019 වසර දක්වා පූර්ව වසංගත කාලය තුළ වාර්තා වූ වාර්ෂික සාමාන්‍යයට වඩා සැලකිය යුතු පහළ අගයක් විය. ප්‍රධාන වශයෙන් දිසිඳි පොල් සහ පොල් කෙඳි අපනයන හේතුවෙන්, 2024 වසරේ දී පොල් මද නිෂ්පාදිත සහ පොල් මද නොවන නිෂ්පාදිත යන දෙඅංශයේ ම අපනයන ආදායම ඉහළ ගිය අතර, කාර්මික භාණ්ඩ යටතේ වර්ගීකරණය කර ඇති අගය එකතු කළ පොල් ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ද සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. ප්‍රාථමික සහ අගය එකතු කිරීමක් සහිත නිෂ්පාදිත යන දෙඅංශයේ ම ශක්තිමත් ක්‍රියාකාරීත්වය තුළින් පොල් අපනයන ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කිරීම, පොල් නිෂ්පාදනය ඉලක්කගත අපනයන ප්‍රවර්ධන ක්‍රියාමාර්ගයකට සමගාමීව පුළුල් කිරීමෙන් පොල් ආශ්‍රිත නිෂ්පාදිත මැදි කාලීනව ප්‍රමුඛ අපනයනයක් බවට පත්කිරීමට ඇති හැකියාව පෙන්නුම් කරයි. මේ අතර, මුහුදු ආහාර සහ සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයනය මන්දගාමී ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කළේය. ඛනිජ අපනයන පහළ යෑමේ ප්‍රවණතාවය අඛණ්ඩව පැවති අතර ඇතැම් ඛනිජ අගය එකතු කළ නිෂ්පාදිත අපනයන ලෙස කාර්මික අපනයන යටතේ වර්ගීකරණය වී ඇත.

## ආනයන ක්‍රියාකාරීත්වය

**ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සහ ආනයන සීමාවන් බොහොමයක් ලිහිල් කිරීම පිළිබිඹු කරමින් 2024 වසරේ දී ශ්‍රී ලංකාව වෙළඳ භාණ්ඩ ආනයන වියදම්වල සැලකිය යුතු ඉහළ යෑමක් වාර්තා කළේය.** 2024 වසරේ දී සමස්ත වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් බිලියන 18.8ක් දක්වා පෙර වසරට සාපේක්ෂව 12.1%ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත්, 2015 වසරේ සිට 2019 වසර දක්වා පූර්ව වසංගත කාලපරිච්ඡේදයේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 20.3ක පමණ වූ වාර්ෂික ආනයන වියදමේ සාමාන්‍යයට සාපේක්ෂව 2024 වසරේ ආනයන වියදම සැලකිය යුතු පහළ අගයක් විය. ආර්ථිකය ක්‍රමිකව යථා තත්ත්වයට පත් වීමත් සමඟ, ප්‍රධාන වශයෙන් 2023 වසරේ ජූනි මාසයේ සිට ආනයන සීමා ක්‍රමයෙන් ලිහිල් කිරීම හේතුවෙන් ආනයන සඳහා ඉල්ලුම, විශේෂයෙන් ම පාරිභෝගික සහ ආයෝජන භාණ්ඩ ආනයන සඳහා ඇති ඉල්ලුම, ඉහළ ගියේය. අවසාන කාණ්ඩය වශයෙන් මෝටර් රථ ආනයනය සඳහා වූ ආනයන සීමාවන් ලිහිල් කළ අතර එය අදියර තුනක් යටතේ ක්‍රමානුකූලව සිදු කරන ලදී.

1

**1.17 රූප සටහන: අපනයන සංයුතිය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව


ඒ අනුව පළමුවන අදියර යටතේ පොදු මගී ප්‍රවාහන හා විශේෂ කාර්යයන් සඳහා වන වාහන, දෙවන අදියර යටතේ භාණ්ඩ ප්‍රවාහනය සඳහා වාහන සහ තුන්වන අදියර යටතේ පුද්ගලික පරිහරණය සඳහා වන වාහන ආනයනය ලිහිල් කිරීම සිදු කරන ලදී. පළමු අදියර 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ක්‍රියාත්මක කරන ලද අතර, දෙවන සහ තුන්වන අදියර 2025 වසරේ ජනවාරි මාසය අවසානයේ දී ක්‍රියාත්මක කරන ලදී. ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2023 වසරේ දී 20.1%ක්ව පැවති ආනයන වියදම, 2024 වසරේ දී 19.0%ක් දක්වා පහළ ගිය අතර, 2015 වසරේ සිට 2019 වසර දක්වා පූර්ව වසංගත කාලපරිච්ඡේදයේ දී වාර්තා කළ 22.4%ක සාමාන්‍යයට වඩා තවදුරටත් පහළ මට්ටමක පැවතුණි.

**2024 වසරේ දී ආනයන වියදම් ඉහළ යෑමට ප්‍රධාන ආනයන කාණ්ඩ සියල්ලෙහි ම ඉහළ ඉල්ලුම හේතු විය.** 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී පාරිභෝගික භාණ්ඩ ආනයනයේ වැඩිවීමක් දක්නට ලැබුණු අතර, ප්‍රධාන වශයෙන් තෙල් හා මේදය, එළවළු වැනි අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය මෙන්ම වසර අවසානයේ දී ඇති වූ දේශීය සැපයුම් හිඟයන් පියවා ගැනීම සඳහා සහල් ආනයනය කිරීම ද හේතු විය. එසේම, 2023 වසරේ දී ආනයන සීමාවන් ලිහිල් කිරීම ආරම්භ කිරීමත් සමඟ, ආහාර නොවන කාණ්ඩයේ පාරිභෝගික භාණ්ඩ, විශේෂයෙන් ම ගෘහ උපකරණ, ඇඟලුම් හා උපාංග සහ විදුලි සංදේශ උපකරණ සඳහා වන වියදම ඉහළ ගියේය. 2024 වසරේ දී අන්තර් භාණ්ඩ ආනයනය වියදම ද ඉහළ ගිය අතර, ප්‍රධාන වශයෙන් ඇඟලුම් අපනයන වර්ධනයට සහාය දක්වමින් රෙදිපිළි සහ රෙදිපිළි උපාංග ආනයනය ඉහළ යෑම සහ නිෂ්පාදන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් යෙදවුම් වන රසායනික නිෂ්පාදිත, මූල ලෝහ, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත මෙන්ම රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන ඉහළ යෑම හේතු විය. කෙසේ වෙතත්, ආනයන භාණ්ඩ පැසෙහි විශාලතම අයිතමය වන ඉන්ධන ආනයන වියදම පහළ ගිය අතර බොරතෙල් සහ ගල් අඟුරු ආනයන මිල සහ ආනයන ප්‍රමාණය පහළ යෑම මීට හේතු විය. ආනයනික ඛනිජ තෙල් නිෂ්පාදිත මත සම්පූර්ණයෙන් ම රඳා පවතින ඛනිජ තෙල් අපනයන ඉහළ ගිය ද, බලශක්ති සංයුතිය තුළ ජල විදුලියෙහි පැවති ඉහළ දායකත්වය හේතුවෙන් ඉන්ධන භාවිතයෙන් විදුලිබල උත්පාදනය සඳහා වූ ඉල්ලුම පහළ යෑම ද, ඉන්ධන ආනයන වියදම පහළ යෑමට හේතු විය. ආනයන සීමාවන් ලිහිල් කිරීම් උපකාරී වීමෙන් ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩ තුනෙහි ම, එනම් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ (මූලිකව ඉංජිනේරු උපකරණ), ගොඩනැගිලි ද්‍රව්‍ය (මූලිකව යකඩ හා වානේ සහ පිඟන් මැටි නිෂ්පාදිත) සහ ප්‍රවාහන උපකරණ (වාණිජ කටයුතු සඳහා යොදා ගන්නා රථ වාහන වැනි) සහ ඒවායේ උප කාණ්ඩ බොහෝමයක ආනයන වියදම ඉහළ යෑමෙන් 2024 වසරේ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදමෙහි සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබුණි.

## වෙළඳ මිල අනුපාතය

**අපනයන භාණ්ඩවල මිල ගණන් සහ ආනයන භාණ්ඩවල මිල ගණන් අතර අනුපාතය නිරූපණය කරනු ලබන වෙළඳ මිල අනුපාතය, 2024 වසරේ දී ඉහළ ගියේය.** ඛනිජ අපනයන හැර අනෙකුත් සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩ සඳහා පරිමා දර්ශක ඉහළ ගිය අතර, සියලුම ප්‍රධාන ආනයන කාණ්ඩ සඳහා ද පරිමා දර්ශක ඉහළ ගිය අතර, එමගින්, 2024 වසරේ දී අපනයන ආදායම සහ ආනයන වියදම ඉහළ යෑම සඳහා ඉහළ පරිමාවන් හේතු වූ බව පෙන්නුම්

**1.18 රූප සටහන: ආනයන සංයුතිය**




(අ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව

කරයි. කාර්මික අපනයන මිල දර්ශක අඩු වීම, අපනයන මිල දර්ශකය පහළ යෑමට ප්‍රධාන වශයෙන් දායක වූ අතර, අන්තර් භාණ්ඩ ආනයන මිල ගණන් පහළ යෑම සමස්ත ආනයන මිල දර්ශකයේ පහළ යෑමට දායක විය. මේ අනුව, අපනයන මිල දර්ශක සහ ආනයන මිල දර්ශක, පිළිවෙළින්, 3.7%කින් සහ 4.9%කින් පහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, වෙළඳ මිල අනුපාතය 2023 වසරේ පැවති දර්ශකාංක 85.6කට සාපේක්ෂව 2024 වසරේ දී දර්ශකාංක 86.7ක් දක්වා 1.3%කින් වර්ධනය විය. කෙසේ වෙතත්, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී වෙළඳ මිල අනුපාතය ඉහළ ගිය ද, එය 2010 පාදක වර්ෂයට සාපේක්ෂව පිරිහීමක් වාර්තා කරමින් 2021 වසරේ සිට දර්ශකාංක 100යේ මට්ටමට වඩා අඩුවෙන් පැවති අතර, එයින් පෙන්නුම් කරනුයේ අපනයන ඒකකයකින් මිලදී ගත හැකි ආනයන ප්‍රමාණය කාලයත් සමඟ අඩු වී ඇති බවයි.

## වෙළඳ දිශාව

**ශ්‍රී ලංකාවේ භාණ්ඩ වෙළඳ අංශය 2024 වසරේ දී පෙර වසරට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කළ අතර, ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් සමඟ ද්විපාර්ශ්වික වෙළඳාම වැඩිදියුණු වීම ඇතුළු සාධක රාශියක් මේ සඳහා දායක විය.** වෙළඳ සීමාවන් ලිහිල් කිරීම සහ ආර්ථික තත්ත්වයන් ස්ථායී වීම මධ්‍යයේ අපනයන සහ ආනයන යන දෙඅංශය ම යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින් සමස්ත වෙළඳාම ඉහළ ගියේය. ශ්‍රී ලංකාවේ වෙළඳ හවුල්කරුවන් සලකා බැලීමේ දී, ප්‍රධාන වෙළඳ හවුල්කරු ලෙස ඉන්දියාව අඛණ්ඩව පැවති අතර, ඉන් අනතුරුව චීනය සහ ඇමරිකා එක්සත් ජනපදයත් පසු වූ අතර, 2024 වසරේ දී මෙම ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් තිදෙනා සාමූහිකව ශ්‍රී ලංකාවේ සමස්ත ගනුදෙනු ප්‍රමාණයට ආසන්න වශයෙන් 40%කින් පමණ දායක විය. 2024 වසරේ දී ඉන්දියාව සමඟ සිදු කළ මුළු වෙළඳ ගනුදෙනු ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 4.8කට ආසන්න වූ අතර, ඒ සඳහා ඛනිජ තෙල් නිෂ්පාදිත, රෙදි සහ සහල් ඇතුළුව ඉන්දියාවෙන් සිදුකළ ආනයන ශක්තිමත් වීම දායක විය. චීනය සමඟ සිදු කළ වෙළඳ ගනුදෙනු ප්‍රමාණය ද 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4.6ක් දක්වා ඉහළ ගියේය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ඉහළම වෙළඳ හිඟය චීනය සමඟ වාර්තා කළ අතර, එය 2023 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 2.8ක සිට 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4.1ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. චීනය සමඟ වෙළඳ හිඟය පුළුල් වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ඉංජිනේරු උපකරණ

**1.11 සංඛ්‍යා සටහන: වෙළඳ මිල අනුපාතයෙහි සාරාංශය (2010=100) (අ)(ආ)**

| කාණ්ඩය | වාර්ෂික වෙනස්වීම 2023/2024 (%) | | |
|---|---|---|---|
| | වටිනාකම් දර්ශකය | පරිමා දර්ශකය | ඒකක වටිනාකම් දර්ශකය |
| **මුළු අපනයන** | **7.2** | **11.3** | **-3.7** |
| කෘෂිකාර්මික අපනයන | 8.1 | 3.2 | 4.7 |
| කාර්මික අපනයන | 7.2 | 12.8 | -5.0 |
| ඛනිජ අපනයන | -36.2 | -35.2 | -1.6 |
| **මුළු ආනයන** | **12.1** | **17.9** | **-4.9** |
| පාරිභෝගික භාණ්ඩ | 13.9 | 12.1 | 1.5 |
| අන්තර් භාණ්ඩ | 8.2 | 17.5 | -7.9 |
| ආයෝජන භාණ්ඩ | 25.6 | 21.8 | 3.1 |
| **වෙළඳ මිල අනුපාතය** | | | **1.3** |

(අ) තාවකාලික
(ආ) එ. ජ. ඩොලර් වටිනාකම් අනුව

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සහ ඉදිකිරීම් ද්‍රව්‍ය (යකඩ සහ වානේ) ආනයන ඉහළ යෑම වන අතර, චීනය වෙත සිදු කළ ශ්‍රී ලංකාවේ අපනයන තවදුරටත් සාපේක්ෂව අඩු මට්ටමක පැවතුණි. 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.4ක සමස්ත වෙළඳාමක් සමඟ ශ්‍රී ලංකාවට ඉතා වැදගත් වෙළඳ හවුල්කරුවෙකු ලෙස එක්සත් ජනපදය තවදුරටත් රැඳී සිටියේය. චීනය මෙන් නොව ඇමරිකා එක්සත් ජනපදය සමඟ ශ්‍රී ලංකාව වෙළඳ අතිරික්තයක් පවත්වාගෙන යන අතර, මේ සඳහා ඇඟලුම් අපනයන විශාල වශයෙන් හේතු විය.

**ශ්‍රී ලංකාවේ සිව්වන ද්විපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම තායිලන්තය සමඟ (ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම - SLTFTA) අත්සන් කළ අතර, තවත් නිදහස් වෙළඳ ගිවිසුම් කිහිපයක් පිළිබඳ සාකච්ඡා 2024 වසර තුළ අඛණ්ඩව පැවතුණි.** ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම 2024 වසරේ පෙබරවාරි මාසයේ දී අත්සන් තබන ලද අතර, එය භාණ්ඩ හා සේවා වෙළඳාම මෙන්ම ආයෝජන, රේගු ක්‍රියාපටිපාටි, බුද්ධිමය දේපළ අයිතිවාසිකම් ආදිය ආවරණය වන පුළුල් නිදහස් වෙළඳ ගිවිසුමකි. ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම 2025 වසරේ ජනවාරි 01 වන දින සිට බලාත්මක විය. ඉන්දියාව සමඟ ආර්ථික


**1.12 සංඛ්‍යා සටහන: ශ්‍රී ලංකාව වරණීය සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ සිදු කළ අපනයන**

| වෙළඳ ගිවිසුම | 2023 | 2024 (අ) | | |
|---|---|---|---|---|
| | වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | වටිනාකම (එ.ජ. ඩොලර් මිලියන) | වර්ධනය (%) | දායකත්වය (%) |
| වෙළඳ වරණයන් පිළිබඳ පොදු ක්‍රම | 3,803.5 | 3,985.7 | 4.8 | 80.2 |
| එයින් යුරෝපා සංගමය (ජී.එස්.පී. ප්ලස් සහිතව) | 2,094.5 | 2,108.1 | 0.6 | 42.4 |
| ඇමෙරිකා එක්සත් ජනපදය (ආ) | 663.4 | 741.6 | 11.8 | 14.9 |
| එක්සත් රාජධානිය | 562.4 | 601.9 | 7.0 | 12.1 |
| රුසියානු සමූහාණ්ඩුව (ඇ) | 127.9 | 152.7 | 19.4 | 3.1 |
| ඕස්ට්‍රේලියාව | 93.3 | 108.8 | 16.6 | 2.2 |
| කැනඩාව | 72.9 | 89.9 | 23.3 | 1.8 |
| ජපානය | 68.3 | 71.1 | 4.1 | 1.4 |
| තුර්කිය | 62.6 | 54.5 | -13.0 | 1.1 |
| වෙනත් ජී.එස්.පී. ක්‍රම | 58.2 | 57.2 | -1.7 | 1.2 |
| ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 536.4 | 490.3 | -8.6 | 9.9 |
| ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) (ඈ) | 213.9 | 209.9 | -1.9 | 4.2 |
| ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) | 79.1 | 70.1 | -11.4 | 1.4 |
| පාකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | 46.1 | 46.2 | 0.3 | 0.9 |
| දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) | 93.2 | 169.0 | 81.3 | 3.4 |
| සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම (SAPTA) | 1.1 | 1.3 | 22.0 | 0.0 |
| **වෙළඳ ගිවිසුම් යටතේ මුළු අපනයන** | **4,773.4** | **4,972.5** | **4.2** | **100.0** |
| **ශ්‍රී ලංකාවේ මුළු වෙළඳ භාණ්ඩ අපනයනවලින් ප්‍රතිශතයක් ලෙස** | **40.1** | **38.9** | | |

(අ) තාවකාලික
(ආ) එක්සත් ජනපදය මගින් ලබා දුන් ජී. එස්.පී සහනය 2020 වසරේ දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ බැවින් ජී.එස්.පී.සහනය ලැබීමට සුදුසු අපනයන පෙන්නුම් කරයි.
(ඇ) රුසියාව, බෙලාරුස් සහ කසකස්ථානය ඇතුළත් වේ.
(ඈ) පෙර මෙය බැංකොක් ගිවිසුම (1975) ලෙස හඳුන්වන ලදී.

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
වාණිජ දෙපාර්තමේන්තුව

**1.19 රූප සටහන: ද්විපාර්ශ්වීය වෙළඳ ශේෂයන්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (ETCA) පිළිබඳ සාකච්ඡා අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර 13 වන සහ 14 වන සාකච්ඡා වට පිළිවෙළින් 2024 වසරේ ජනවාරි සහ 2024 වසරේ ජූලි මාසවල දී අවසන් විය. මේ අතර, බංග්ලාදේශය සහ ඉන්දුනීසියාව සමඟ වරණීය වෙළඳ ගිවිසුම් යටතේ සාකච්ඡා අඛණ්ඩව ක්‍රියාත්මක වූ අතර, චීන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සාකච්ඡාවල ප්‍රගතිය මන්දගාමී විය. එපමණක් නොව, දකුණු ආසියානු වෙළඳ වරණය (SAFTA) යටතේ ඉන්දියාව වෙත සිදුකළ අපනයන ඉහළ ගිය ද, ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ සිදුකළ අපනයන පහත වැටුණි. පකිස්ථාන-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ සිදුකළ වෙළඳාම අඩු මට්ටමක පැවති අතර, ගෝලීය වරණීය වෙළඳාම් ක්‍රමය (GSTP) සහ ආසියා පැසිෆික් වෙළඳ ගිවිසුම (APTA) වැනි අනෙකුත් කලාපීය වෙළඳ ගිවිසුම් යටතේ කාර්යසාධනය 2024 වසරේ දී පහත වැටුණි. මේ අතර, බහු-ආංශික තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව පිළිබඳ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල මූලාරම්භයේ (BIMSTEC) ප්‍රඥප්තිය 2024 වසරේ මැයි මාසයේ දී බලාත්මක විය. සාමාජික රටවල් අතර තාක්ෂණික හා ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කරන අතර ම, එහි ප්‍රවේශය සහ බලපෑම පුළුල් කිරීමට මෙම ප්‍රඥප්තිය උපකාරී වනු ඇත. තවද, යුරෝපා සංගමය සහ එක්සත් රාජධානිය වැනි ශ්‍රී ලංකාවේ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් විසින් පිරිනමනු ලබන වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමවලින් (ජී.එස්.පී - GSP) ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබුවේය. යුරෝපා සංගමයේ ජී.එස්.පී යෝජනා ක්‍රමයේ අඛණ්ඩතාව සහතික කිරීම සඳහා 2023 වසරේ සැප්තැම්බර් මාසයේ දී යුරෝපීය කොමිසම විසින් යුරෝපා සංගමයේ ජී.එස්.පී යෝජනා ක්‍රමයේ වලංගු කාලය 2024-2027 කාලය දක්වා දීර්ඝ කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසරේ දී ශ්‍රී ලංකාව යුරෝපා සංගමයේ විශේෂ ප්‍රතිලාභ සහිත වරණීය වෙළඳාම පිළිබඳ පොදු ක්‍රමය (ජී.එස්.පී+) යටතේ අඛණ්ඩව ප්‍රතිලාභ ලබා ගනිමින් මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළේය. එපමණක් නොව, නව ජී.එස්.පී යෝජනා ක්‍රමයක කොන්දේසි පිළිබඳව යුරෝපා සංගමයේ රටවල් අතර

2024 වසර තුළ සාකච්ඡා අඛණ්ඩව පැවතුණි. මේ අතර, යුරෝපා සංගමය විසින් 2023 වසරේ ජූනි මාසයේ දී වනාන්තර විනාශයෙන් තොර නිෂ්පාදන පිළිබඳ රෙගුලාසි (Regulation on Deforestation-Free Products) සම්මත කරන ලදී. යුරෝපා සංගමයේ ජී.එස්.පී.+ යෝජනා ක්‍රමයේ සහනවල ප්‍රතිලාභියෙකු ලෙස, යුරෝපා සංගමයේ වෙළඳපොළ වෙත ශ්‍රී ලංකාව සිදු කරන රබර් අපනයන සඳහා මෙම රෙගුලාසි බලපැවැත්වෙන අතර, විශාල/මධ්‍යම ප්‍රමාණයේ ක්‍රියාකරුවන් 2025 වසරේ දෙසැම්බර් මස 30 වන දින වන විට සහ ක්ෂුද්‍ර/කුඩා ප්‍රමාණයේ ක්‍රියාකරුවන් 2026 වසරේ ජූනි මස 30 දින වන විට මෙම රෙගුලාසිවලට අනුකූල විය යුතුය. ඊට අමතරව, 2023 වසරේ ජූනි මාසයේ දී බලාත්මක වූ එක්සත් රාජධානියේ නව ජී.එස්.පී යෝජනා ක්‍රමය, එනම් "සංවර්ධනය වෙමින් පවතින රටවල වෙළඳ යෝජනා ක්‍රමය" (DCTS) හි වැඩි දියුණු කළ වරණීය යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාව අඛණ්ඩව ප්‍රතිලාභ ලැබීය. 2020 වසරේ දෙසැම්බර් මාසයේ දී කල් ඉකුත් වූ එක්සත් ජනපද ජී.එස්.පී යෝජනා ක්‍රමය, එක්සත් ජනපද රජය මගින් තවමත් නැවත ස්ථාපිත කර නොමැති නමුත්, එක්සත් ජනපද නව රජය මගින් ඉදිරියේ දී ප්‍රධාන ප්‍රතිපත්තිමය වෙනස්කම් සිදු නොකරන්නේ නම් මෙම ජී.එස්.පී යෝජනා ක්‍රමය සාමාන්‍ය ක්‍රමවේදයන්ට අනුව අතීතයට බලපාන පදනමක් යටතේ ප්‍රතිස්ථාපනය කරනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, අනෙකුත් ජී.එස්.පී. යෝජනා ක්‍රම යටතේ අපනයන 2024 වසර තුළ මිශ්‍ර කාර්යසාධනයක් පෙන්නුම් කළේය. 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී වරණීය සහ නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ මුළු වෙළඳාම වර්ධනය වූ නමුත් මුළු අපනයනවල කොටසක් ලෙස වරණීය වෙළඳාම යටතේ අපනයන 2024 වසරේ දී පහත වැටුණු අතර, එමගින් වරණීය වෙළඳ ගිවිසුම් භාවිතා නොකර සිදු කළ අපනයනවල වැඩිවීමක් පෙන්නුම් කරයි.

### සේවා ගිණුම

**2024 වසරේ දී සේවා ගිණුමේ අතිරික්තය සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.** 2024 වසරේ දී සේවා ගිණුමේ අතිරික්තය, 2023 වසරේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 3.10 සාපේක්ෂව, එ.ජ. ඩොලර් බිලියන 3.4ක් දක්වා වර්ධනය විය. සංචාරක, මුහුදු ප්‍රවාහනය, පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන අංශ ඇතුළු ප්‍රධාන සේවා අංශ වෙත වූ ඉහළ ලැබීම් මෙම වර්ධනයට හේතු විය. 2023 වසරේ දී වාර්තා වූ මිලියන 1.49ක සංචාරක පැමිණීම් හා සසඳන විට, 2024 වසරේ දී සංචාරක පැමිණීම් මිලියන 2.05ක් වාර්තා කරමින් සංචාරක අංශය තවදුරටත් එහි වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පවත්වාගෙන ගියේය. ඒ අනුව, 2023 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 2.1ක් වූ සංචාරක ඉපැයීම්, 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.2ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 53.2%ක වාර්ෂික වර්ධනයකි. සංචාරකයින් මිලියන 2.3ක් මගින් එ.ජ. ඩොලර් බිලියන 4.4ක ආදායමක් උපයා ගනිමින් මෙතෙක් වාර්තා වූ ඉහළම සංචාරක පැමිණීම් ගණන 2018 වසරේ දී වාර්තා විය. මේ අතර, සංචාරක කර්මාන්තය හැර අනෙකුත් සේවාවන් ද ජංගම ගිණුමේ අතිරික්තයට සැලකිය යුතු ලෙස දායක විය. ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ (ITRS) දත්තවලට අනුව, 2024 වසරේ දී සංචාරක ඉපැයීම් හැර සේවා

**1.20 රූප සටහන: සේවා අංශයේ ලැබීම් සහ ගෙවීම්**




සටහන: තද පැහැති ස්ථම්භ 2024 වසරේ අගයන් නිරූපණය කරන අතර ලා පැහැති ස්ථම්භ 2023 වසරේ අගයන් නිරූපණය කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1

අංශයට ලැබුණු මුළු ලැබීම් ඩී.ජ. ඩොලර් බිලියන 3.7ක් වූ අතර, එය 2023 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.3ක් විය. සේවා අංශයට ප්‍රධාන වශයෙන් දායක වූයේ ප්‍රවාහනය සහ පරිගණක හා තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම යන සේවාය. 2024 වසරේ දී වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා, තාක්ෂණික සහ වෙළඳාම ආශ්‍රිත සේවා ද, සේවා අංශයේ ලැබීම් ඉහළ යෑමට දායක විය. තවද, සේවා අංශයේ මුළු ගෙවීම්, 2023 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 2.4ට සාපේක්ෂව, 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 3.5ක් විය. සේවා අංශයෙන් වාර්තා වූ ගෙවීම් සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ විදේශ සංචාර, ප්‍රවාහන සේවා, අනෙකුත් ව්‍යාපාරික සේවාවන්ට අදාළ ගෙවීම් සහ රජයේ ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියට අදාළ නීතිමය හා වෘත්තීය ගාස්තු ලෙස කරන ලද ගෙවීම්ය.

## ප්‍රාථමික ආදායම් ගිණුම

**2024 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය පෙර වසරට සාපේක්ෂව නොවෙනස්ව පැවතුණි.** ප්‍රාථමික ආදායම් ගිණුමේ ගෙවීම්වලින් සැලකිය යුතු කොටසක් ණය ආපසු ගෙවීම තාවකාලිකව අත්හිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස රැස් වූ හිඟ මුදල් ඇතුළුව රජයේ ණය සඳහා වූ පොලී ගෙවීම් මෙන්ම, ජා.මූ. අරමුදල හා ඉන්දියානු සංචිත බැංකුව සමඟ ඇති කරගත් විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකමට අදාළව මහ බැංකුවේ ණය වගකීම් වෙනුවෙන් කළ පොලී ගෙවීම් ද ඊට ඇතුළත් විය. විදේශීය ආයෝජකයින් වෙත ලාභ බෙදාහැරීමේ වැඩිවීම පිළිබිඹු කරමින් සෘජු ආයෝජන ව්‍යාපාර විසින් ගෙවන ලද ලාභාංශ ඉහළ යෑම 2024 වසරේ දී දක්නට ලැබුණු එක් ප්‍රධාන ප්‍රවණතාවක් විය. කෙසේ වෙතත්, ප්‍රතිආයෝජිත ඉපැයීම්වලට අදාළ ගෙවීම් පහත වැටුණි. මෙය මූල්‍ය ගිණුමේ ලැබීමක් ලෙස වාර්තා වන අතර, එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය ගිණුමේ සෘජු ආයෝජන අඩු විය. 2024 වසරේ මුල් කාර්තු තුනේ උපචිත පොලිය සහ 2024 වසරේ අවසාන කාර්තුවේ පොලී ගෙවීම් ද සහිතව ණය සුරැකුම්පත්වලට අදාළ පොලී ගෙවීම් 2023 වසරට සාපේක්ෂව වැඩි වී ඇත. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර සඳහා වන විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය අවසන් වීමත් සමඟ, ඉදිරියේ දී ණය සුරැකුම්පත් සඳහා පොලී ගෙවීම් සැලකිය යුතු ලෙස අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී විදේශීය ණය සඳහා රජයේ පොලී ගෙවීම්වල සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබුණු අතර, රජය විසින් ගෙවිය යුතු බහුපාර්ශ්වික ණය ප්‍රමාණය වැඩිවීම සහ දැනට ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය යටතේ පවතින ණය ද ඇතුළුව ද්විපාර්ශ්වික ණය සඳහා වන උපචිත පොලිය වැඩිවීම මෙයට හේතු විය. මේ අතර, දළ නිල සංචිත සැලකිය යුතු ලෙස වැඩිවීම හේතුවෙන් 2024 වසරේ දී මහ බැංකුව විසින් සංචිත වත්කම්වල සිදුකළ ආයෝජන මගින් ලද ඉපැයීම් වැඩි විය. කෙසේ වෙතත්, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී බැංකු අංශයේ පොලී ආදායම සුළු වශයෙන් අඩු විය. ඒ අනුව, 2024 වසරේ දී ප්‍රාථමික ආදායම් ගිණුමේ හිඟය එ.ජ. ඩොලර් බිලියන 2.6ක් විය.

## ද්විතීයික ආදායම් ගිණුම

**2024 වසරේ දී ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල පැවති අඛණ්ඩ වර්ධනය හේතු විය.** වසර තුළ දී විධිමත් බැංකු ක්‍රම හරහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් ඉහළ යෑමට දායක වෙමින්, ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන් විදේශ රැකියා සොයා අඛණ්ඩව විදේශගත වීම මෙම ධනාත්මක ප්‍රවණතාවයට බොහෝ දුරට සහාය විය. විදේශ රැකියා සඳහා මෙතෙක් වාර්තා වූ ඉහළ ම පිටත්වීම් සංඛ්‍යාව 2024 වසරේ දී වාර්තා විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2023 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 6.0ක් වූ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 6.6ක් දක්වා 10.1%කින් වර්ධනය විය. මෙම ප්‍රේෂණ වැඩිවීම ද්විතීයික ආදායම් ගිණුමේ අතිරික්තය තියුණු ලෙස වැඩිවීමට දායක වූ අතර, එය 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 6.4ක් ලෙස වාර්තා විය.

## ප්‍රාග්ධන ගිණුම

**2024 වසරේ දී ප්‍රාග්ධන ගිණුමේ අතිරික්තය අඩු විය.** රජයට ලැබෙන ප්‍රාග්ධන ප්‍රදාන අඩු වීම හේතුවෙන් 2024 වසරේ දී රජය සහ පෞද්ගලික අංශය යන දෙඅංශය ම වෙත වූ ප්‍රාග්ධන සංක්‍රාම අඩු විය. ඒ අනුව, 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 37ක අතිරික්තයට සාපේක්ෂව, 2024 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 12ක සුළු අතිරික්තයක් ප්‍රාග්ධන ගිණුම වාර්තා කළේය.

## මූල්‍ය ගිණුම

**2024 වසරේ දී, ගෙවුම් තුලනයෙහි මූල්‍ය ගිණුම තුළ වගකීම්වල ශුද්ධ වෙනස්වීම් සහ මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් යන දෙක ම වැඩි වුව ද, එය මන්දගාමී වේගයකින් සිදු විය.** 2023 වසරේ එ.ජ. ඩොලර් බිලියන 2.2ට සාපේක්ෂව වගකීම්වල ශුද්ධ වෙනස්වීම්, එ.ජ ඩොලර් බිලියන 1.0කින් වැඩි විය. වසර තුළ මූල්‍ය ගිණුම වෙත වූ ප්‍රධාන ලැබීම් අතරට ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළින් ලැබුණු තුන්වැනි වාරිකය මෙන්ම, ලෝක බැංකුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු වාරික ද ඇතුළත් විය.

# විශේෂ සටහන 1
# විදේශීය අංශයේ සංඛ්‍යාන දත්ත වැඩිදියුණු කිරීම: සේවා වෙළඳාම පිළිබඳ ප්‍රධාන කරුණු


## හැඳින්වීම

මෑත වසරවල දී වෙළඳ භාණ්ඩ අපනයනයේ ඉහළ යෑම අභිබවා යමින්, ශ්‍රී ලංකාවේ ගෙවුම් තුලනයේ ජංගම ගිණුමේ තීරණාත්මක අංගයක් වන සේවා වෙළඳාම සැලකිය යුතු ලෙස වර්ධනය වී තිබේ. විදේශ විනිමය ඉපැයීම් සඳහා ප්‍රධාන දායකත්වයක් සපයන සේවා අපනයනවල වර්ධනය සඳහා, සංචාරක, පරිගණක සහ තොරතුරු තාක්ෂණය/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම, සහ වරාය හා ගුවන්තොටුපළ සේවා වැනි අංශ හේතු විය. කෙසේ වෙතත්, දේශසීමා හරහා භෞතිකව සිදු කෙරෙන නිෂ්පාදිත භාණ්ඩ වෙළඳාම මෙන් නොව, දේශසීමා හරහා සිදු කරන සේවා වෙළඳාම පිළිබඳ දත්ත නිරවද්‍යතාවයකින් යුතුව ග්‍රහණය කර ගැනීම වඩා අභියෝගාත්මක යැයි සාමාන්‍යයෙන් සැලකේ. වෙළඳ භාණ්ඩ පිළිබඳ සංඛ්‍යාන දත්ත ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රේගුව හරහා වාර්තා කරනු ලැබුව ද, සේවා වෙළඳාම පිළිබඳ සංඛ්‍යාන දත්ත සම්පාදනය කිරීම සඳහා බැංකු පද්ධතිය හරහා සවිස්තරාත්මක හා ඒ ඒ ගනුදෙනු මට්ටමේ වාර්තාකරණයක් අවශ්‍ය වන අතර, ඒ හේතුවෙන් දත්ත රැස් කිරීමේ ක්‍රියාවලි වඩාත් සංකීර්ණ වේ.

2008 ජාතික ගිණුම් පද්ධති (System of National Accounts - SNA 2008),[1] සංඛ්‍යාදත්ත රාමුවෙහි අර්ථ දක්වා ඇති පරිදි, සේවා අංශයේ අන්තර්ජාතික ගනුදෙනුවලට විවිධාකාරයේ ස්පර්ශ කළ නොහැකි නිෂ්පාදන සහ ක්‍රියාකාරකම් රාශියක් අයත් වන අතර, මෙම සේවා 'වෙනස්කම් ඇති කරන සේවා (change effecting services)' සහ 'ආන්තික සේවා (margin services)' වශයෙන් පුළුල් ලෙස ආකාර දෙකකට වර්ග කර ඇත. වෙනස්කම් ඇති කරන සේවා ඉල්ලුම අනුව නිෂ්පාදනය කරනු ලබන අතර, එම සේවා පාරිභෝගිකයාගේ තත්ත්වය සෘජුවම වෙනස් කරයි. මෙම සේවා ඒවායේ නිෂ්පාදනයෙන් වෙන් කළ නොහැකි ය. උදාහරණයක් ලෙස, ශ්‍රී ලාංකික මෘදුකාංග නිපදවන සමාගමක් විසින් මෘදුකාංගයක් ලබා දීම හා සම්බන්ධ සේවාව අවසාන නිමැවුමෙන් වෙන් කර වෙනම අලෙවි කළ නොහැක. අනෙක් අතට, ආන්තික සේවා යනු භාණ්ඩ බෙදා හැරීමේ දී අතරමැදියන් විසින් සිදු කරන අගය එක් කිරීම් වන අතර, ශ්‍රී ලංකා බහාලුම් පර්යන්ත මගින් වෙළඳ භාණ්ඩ ආනයන සහ අපනයන සඳහා සපයනු ලබන ප්‍රවාහන සේවා ආදිය මෙම කාණ්ඩයට අයත් වේ. ගෝලීය වශයෙන්, සේවා අංශයේ අන්තර්ජාතික ගනුදෙනු පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා වඩාත් ම පුළුල් ක්‍රමය වන්නේ බැංකු පද්ධතිය හරහා සිදු වන නේවාසිකයින් සහ අනේවාසිකයින් අතර ගෙවීම් ප්‍රවාහ යොදා ගැනීමය. කෙසේ වෙතත්, එවැනි දියුණු සහ සංකීර්ණ පද්ධතියක් නොමැති විට, ගෙවුම් තුලනයේ සේවා අංශයේ සංඛ්‍යාන දත්ත සම්පාදනය කිරීම, හඳුනාගත් සමාගම් සම්බන්ධ කරගෙන සිදු කරන සෘජු සමීක්ෂණ මත පදනම් වනු ඇත. කෙසේ වෙතත්, සේවා අංශයේ සංඛ්‍යාන දත්ත සම්පාදනය කිරීමේ දී සෘජු සමීක්ෂණ ක්‍රමවේදයේ ඵලදායීතාවය විවාදාත්මක වන්නේ, එවැනි

1 ජාතික ගිණුම් පද්ධතිය යනු ආර්ථික මූලධර්ම මත පදනම් වූ දැඩි ගිණුම්කරණ සම්මුතීන්ට අනුකූලව දළ දේශීය නිෂ්පාදිතය වැනි රටක ආර්ථික ක්‍රියාකාරකම් මැනීම සඳහා ජාත්‍යන්තරව එකඟ වූ රාමුවකි.

වි.ස. 1.1 රූප සටහන: වෙළඳ භාණ්ඩ සහ සේවා අපනයන පිළිබඳ සංඛ්‍යාන දත්ත




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා මහ බැංකුව

සේවා සපයන්නන් හඳුනා ගැනීමේ දුෂ්කරතා, අඩු සමීක්ෂණ ප්‍රතිචාර අනුපාත, ගෙවුම් තුලනය සම්පාදනය කිරීම සඳහා ඇති සීමිත මානව සම්පත් සහ විශේෂයෙන්ම කොවිඩ්-19 වසංගතය සහ ඉන් පසුව ඇති වූ ආර්ථික අර්බුදය අතරතුර සමාගම් සමඟ සම්බන්ධ වීමේ දී පැවති දැඩි ගැටලුකාරී බව ඇතුළු බොහෝ අභියෝග හේතුවෙනි. විදේශීය අංශයේ සංඛ්‍යාන දත්තවල නිරවද්‍යතාවය සහ සවිස්තරාත්මකභාවය වැඩි දියුණු කිරීමේ ප්‍රයත්නයක් ලෙස, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 වසරේ දී ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (International Transactions Reporting System – ITRS) නිර්මාණය කිරීම ආරම්භ කළ අතර, එමගින් බැංකු පද්ධතිය තුළ වාර්තා වන විදේශ විනිමය ලැබීම් සහ ගෙවීම් දත්ත මත පදනම්ව දේශසීමා හරහා සිදුවන ගනුදෙනු එක්රැස් කර වර්ගීකරණය කරනු ලැබේ. කොවිඩ්-19 වසංගතය සහ ආර්ථික අර්බුදය විසින් ඇති කරන ලද බාධා මධ්‍යයේ වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුව සහ බලපත්‍රලාභී බැංකු අතර මාර්ගගතව සිදු වූ  ඉතා ඉහළ සහයෝගීතාවක් තුළින් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධති ව්‍යාපෘතිය සාර්ථකව නිම කරන ලදී. වසර හතරක් මුළුල්ලේ වැඩිදියුණු කිරීමෙන් පසුව ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය හරහා දත්ත රැස් කිරීම 2023 වසරේ ජනවාරි මාසයේ දී ආරම්භ විය. මෙම දත්ත මත පදනම්ව, 2024 වසරේ ජනවාරි මාසයේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව මාසිකව සේවා අංශයේ සංඛ්‍යාන දත්ත නිකුත් කිරීම ආරම්භ කළේය.[1]

**ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම් වූ ශ්‍රී ලංකාවේ සේවා අංශයේ වෙළඳාම පිළිබඳ විශේෂ කරුණු**


ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම තුළින්, මීට පෙර කාර්තුමය ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන නිකුත් කිරීමත් සමඟ කාර්තුමය වශයෙන් පමණක් ලබා ගත හැකි වූ සේවා වෙළෙඳාම පිළිබඳ සංඛ්‍යාන දත්ත මාසිකව වාර්තා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි විය. මීට අමතරව, නව කාණ්ඩ යටතේ වාර්තා කෙරෙන දත්ත සමඟ වඩාත් සවිස්තරාත්මක වර්ගීකරණයක් හඳුන්වා දෙන ලද අතර, පවතින කාණ්ඩවල දත්තවල නිරවද්‍යතාවය වැඩිදියුණු කරමින් ඒ හරහා වඩා හොඳ ආංශික විශ්ලේෂණයක් සඳහා හැකියාව ලැබුණි.

ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට පෙර සහ පසු සේවා අංශයේ දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයේ වෙනස්කම් හේතුවෙන් ගෙවුම් තුලන සංඛ්‍යාන දත්ත මත ඇති වූ බලපෑම වි.ස. 1.2 රූප සටහනෙහි දක්වා ඇත. 2023 සහ 2024 වසරවල දී සංචාරක සේවා ආශ්‍රිත ලැබීම් සහ ගෙවීම් හැර සේවා අංශයේ අනෙකුත් සියලුම දත්ත ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මත පදනම් විය. එබැවින්, 2022 වසරෙන් පසු සේවා අංශයේ දත්ත රැස් කිරීම, නියැදි සමීක්ෂණ දත්ත අනුව සිදු කරන සංඛ්‍යානමය අනුමාන මත රඳා පවතින නියැදි පදනම් කරගත් ප්‍රවේශයක සිට, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය යටතේ සංගණන මත පදනම් වූ ක්‍රමවේදයක් බවට පත් වී ඇත. කෙසේ වෙතත්, සෘජු සමීක්ෂණ නතර කළ බැවින් 2023 වසරේ සිට ක්‍රමවේද දෙක අතිපිහිත වන කාලපරිච්ඡේදයක් නොතිබිණි.

සංචාරක සේවා ආශ්‍රිත ගෙවීම්වලින් කොටසක් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම් වන අතර, සංචාරක සේවා ආශ්‍රිත ලැබීම් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් කරන ලද ඇස්තමේන්තුවක් මත පදනම් වන බැවින්, සංසන්දනාත්මක අරමුණු සඳහා සංචාරක සේවා ආශ්‍රිත ලැබීම් සහ ගෙවීම් මෙම සැසඳීමේ දී නොසලකා හැර ඇත. වි.ස. 1.2 රූප සටහනෙහි

1 මාසික සේවා අංශයේ සංඛ්‍යාන දත්ත පහත සබැඳියෙන් ලබා ගත හැකිය: https://www.cbsl.gov.lk/en/statistics/statistical-tables/external-sector → සේවා අංශය

**වි.ස. 1.2 රූප සටහන: සංචාරක සේවා ආශ්‍රිත ලැබීම් සහ ගෙවීම් හැර සේවා ගිණුම පිළිබඳ සංඛ්‍යාන දත්ත**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1


දක්වා ඇති පරිදි, සංචාරක සේවා ආශ්‍රිත ලැබීම් සහ ගෙවීම් හැර අනෙකුත් සේවා අපනයන යටතේ වාර්තා වී ඇති දළ ලැබීම්, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට පෙර සහ පසු කාලපරිච්ඡේද තුළ සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කරයි. 2023 සහ 2024 වසරවල දී දළ ලැබීම් 2022 වසරට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. මෙම වැඩිවීමට සංඛ්‍යාන දත්ත සම්පාදනයේ වැඩිදියුණු කිරීම් පමණක් නොව, ආර්ථිකය අඛණ්ඩව යථා තත්ත්වයට පත් වීම ද හේතු විය. කෙසේ වෙතත්, 2022 වසරට සාපේක්ෂව ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමෙන් පසුව දළ ලැබීම් සහ ගෙවීම් ඉහළ ප්‍රමාණයක් වාර්තා වුවත්, 2023 සහ 2024 වසර සඳහා ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මගින් වාර්තා කරන ලද ශුද්ධ ලැබීම් 2022 වසරේ ශුද්ධ ලැබීම් ඇස්තමේන්තු සමඟ බොහෝ දුරකට අනුකූල වන බැවින්, දළ ලැබීම්වල වාර්තා වූ මෙම වෙනස ජංගම ගිණුම් ඇස්තමේන්තු කෙරෙහි සැලකිය යුතු ලෙස බලපා නොමැත.

ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම් වූ සේවා අංශය පිළිබඳ විශේෂ කරුණු කිහිපයක් පහත විස්තර කෙරේ.

**i. පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා**


ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීමට පෙර, පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා පිළිබඳ සංඛ්‍යාන දත්ත ඇස්තමේන්තු කරන ලද්දේ සීමිත සමීක්ෂණ ප්‍රතිචාර සංඛ්‍යාවක් හරහා ලැබුණු තොරතුරු සහ නියැදි සමීක්ෂණ දත්ත අනුව සිදු කරන සංඛ්‍යානමය අනුමාන පදනම් කරගෙනය. සමීක්ෂණ පදනම් කරගත් ඇස්තමේන්තුවලට අනුව, පරිගණක සහ තොරතුරු

**වි.ස. 1.3 රූප සටහන: පරිගණක සහ අනෙකුත් ව්‍යාපාර සේවා වෙත වූ ලැබීම්**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**වි.ස. 1.4 රූප සටහන: ඉදිකිරීම් සහ රක්ෂණ සේවා (ලැබීම්)**



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා සඳහා වූ ලැබීම් වාර්ෂිකව එ.ජ. ඩොලර් බිලියනයක් පමණ විය. කෙසේ වෙතත්, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත අනුව, පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා සඳහා වූ ලැබීම් ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් මිලියන 800ක් පමණ වෙතැයි වාර්තා වේ. මෙම ලැබීම්, පරිගණක සහ තොරතුරු තාක්ෂණ/ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා වෙත වූ විදේශ විනිමය ලැබීම් වේ. කෙසේ වෙතත්, පෙර වාර්තා වී නොමැති, වෘත්තීය සහ කළමනාකරණ උපදේශන සේවා සහ තාක්ෂණික සේවා වැනි නැගී එන සේවා උප අංශ කිහිපයක ලැබීම් ගෙවුම් තුලනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති බව ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මගින් හෙළි විය. ඒ අනුව, මෙම කාණ්ඩ දැන් වෙන වෙනම හඳුනාගෙන වාර්තා කෙරෙන අතර, එමගින් සේවා අංශයට අදාළ ලැබීම් සහ ගෙවීම් වර්ගීකරණය වැඩිදියුණු වී ඇත. වි.ස. 1.3 රූප සටහනෙහි දැක්වෙන පරිදි, පරිගණක සහ තොරතුරු තාක්ෂණ / ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවා සහ අනෙකුත් ව්‍යාපාරික සේවාවන්ගේ ඒකාබද්ධ අගය පෙර ඇස්තමේන්තුවලට ආසන්න වශයෙන් සමාන වන අතර, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය හේතුවෙන් සේවා අංශයේ වෙළඳ ගනුදෙනු වඩාත් නිවැරදි සහ සවිස්තරාත්මක වර්ගීකරණයක් යටතේ ලබා දීමට හැකි වී ඇති බව පෙන්නුම් කරයි.

**ii. ඉදිකිරීම් සහ රක්ෂණ සේවා**

මූලිකවම අඩු ප්‍රතිචාර මට්ටමක් පැවතීම හේතුවෙන්, සමීක්ෂණ මත පදනම් වූ ඇස්තමේන්තු මගින් ඉදිකිරීම් සහ රක්ෂණ සේවා වැනි ඇතැම් සේවා අංශවල ඉපැයීම් සැබෑ ප්‍රමාණයට වඩා අඩුවෙන් වාර්තා වී ඇති බව අනාවරණය විය. ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය තුළින් ලද දත්තවලට අනුව, විශේෂයෙන්ම ඉදිකිරීම් සේවා සඳහා වූ ලැබීම් සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතින අතර, ඉදිරි වසරවල දී මෙම සේවා අංශ වර්ධනය වීම සඳහා දැවැන්ත විභවයක් පවතින බව මෙම දත්ත මගින් පිළිබිඹු

1

**වි.ස. 1.5 රූප සටහන: ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් විසින් විදේශ අධ්‍යාපනය සඳහා දරන වියදම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කෙරේ (වි.ස. 1.4 රූප සටහන). දේශීය ඉදිකිරීම් කර්මාන්තය නැවත යථා තත්ත්වයට පත්වීම මන්දගාමී වීම හමුවේ ශ්‍රී ලාංකික ඉදිකිරීම් සමාගම් විසින් විදේශයන්හි පවතින අවස්ථා සොයා යෑම සඳහා මෑත කාලීනව දක්වන ලද උද්‍යෝගය ද මේ සඳහා යම් මට්ටමකට හේතු විය.

### iii. ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් විසින් විදේශ අධ්‍යාපනය සඳහා දරන වියදම්

මෑත වසරවල දී විදේශ අධ්‍යාපනයට අදාළව දේශසීමා හරහා සිදුවන ගෙවීම්, ප්‍රතිපත්ති සාකච්ඡාවල ප්‍රධාන මාතෘකාවක් වී ඇත. කෙසේ වුවත්, එවැනි ගෙවීම් පිළිබඳව වන විශ්වසනීය දත්ත ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ප්‍රතිපත්ති සාකච්ඡා සඳහා බාධා ඇති විය. ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය හඳුන්වාදීමෙන් පසු, අධ්‍යාපන සේවා සඳහා දේශසීමා හරහා සිදුවන ගෙවීම් මාසිකව වාර්තා කරනු ලබන අතර, එමගින් වැඩි විනිවිදභාවයක් සහ දත්ත මත පදනම් වූ ප්‍රතිපත්ති තීරණ ගැනීම ප්‍රවර්ධනය කෙරේ (වි.ස. 1.5 රූප සටහන). කෙසේ වුවත්, එවැනි සේවාවන් සඳහා බැංකු නොවන මාර්ග භාවිතා කරමින් සිදුකරනු ලබන ගෙවීම් හේතුවෙන් ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය මගින් වාර්තා කරනු ලබන අගයයන් අසම්පූර්ණ විය හැකි බව සැලකිල්ලට ගත යුතුය.

### සේවා අංශයේ සංඛ්‍යාන දත්තවල ප්‍රයෝජනවත් බව

ඉහත උදාහරණවලින් ඉස්මතු කර ඇති පරිදි, ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය සඳහා සේවා අංශය පිළිබඳ නිවැරදි දත්ත අත්‍යවශ්‍ය වේ. 2025 වසරේ ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද මාසික ජංගම ගිණුම් දත්තවලට සේවා අංශයේ සංඛ්‍යාන දත්ත දැන් ඇතුළත් කර ඇත. ජංගම ගිණුම් සංඛ්‍යාන දත්ත ප්‍රකාශයට පත් කරන වාර ගණන සහ ඒවායේ නිරවද්‍යතාවය වැඩි කිරීම, මුදල් හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හැඩගැස්වීමේ දී ප්‍රතිපත්ති සම්පාදකයින්ට වටිනා තොරතුරු ලබා දෙයි. මීට අමතරව, සේවා අංශයේ දත්ත ඇතුළුව ජංගම ගිණුම මාසිකව යාවත්කාලීන කිරීම්, අනාගතයේ දී විදේශීය අංශයේ සිදු විය හැකි වෙනස්වීම් පිළිබඳ පෙර ඇඟවීම් සපයයි. මෙම දත්ත අනාගතයේ දී සිදුවිය හැකි ගෙවුම් තුලන අභියෝග පුරෝකථනය කිරීම සඳහා ප්‍රධාන සංඥාවක් ලෙස යොදා ගත හැකිය.

### ඉදිරි දැක්ම

විදේශීය අංශයේ සංඛ්‍යාන දත්ත තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා බැංකු අංශය ඇතුළු ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධති ව්‍යාප්තියට සම්බන්ධ පාර්ශ්වකරුවන් සමඟ සමීපව කටයුතු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. තවද, සේවා අංශයේ සංඛ්‍යාන දත්තවල ආවරණය සහ ගුණාත්මකභාවය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා, සේවා අංශයේ ප්‍රධාන කර්මාන්ත සහ ඒ ආශ්‍රිත වාණිජ සංගම් මගින් සිදු කරන ඇස්තමේන්තු සහ නිල දත්ත අතර පවතින වෙනස්කම් අවම කිරීමට, එම ආයතන සමඟ සාකච්ඡා කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි. මීට අමතරව, නැගී එන සේවා අංශවල වර්ධන විභවය වඩා හොඳින් අවබෝධ කර ගැනීම සඳහා ඒවා කෙරෙහි අවධානය යොමු කරමින්, ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම්ව ගැඹුරු ආංශික ප්‍රතිපත්ති අධ්‍යයනයන් සිදු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව සැලසුම් කරයි. එවැනි විශ්ලේෂණයක් මගින් දැනුම්වත්ව සිදු කෙරෙන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා වටිනා තොරතුරු ලබා දෙනු ඇති අතර, නැගී එන සේවා අංශය වර්ධනය කිරීම සහ එහි විභවය උපරිම කිරීම පිණිස උපාය මාර්ග සැකසීම සඳහා එයින් සහාය ලැබෙනු ඇත.


මූලාශ්‍ර

1. United Nations, European Commission, International Monetary Fund, Organisation for Economic Co-operation and Development and World Bank (2009) *System of National Accounts 2008*, New York: United Nations.

2. Wijayawardhana A (2024) 'Capturing Services Sector Cross Border Transactions: The Central Bank of Sri Lanka's Long Endeavour to Establish an International Transactions Reporting System', Information Series Note, Central Bank of Sri Lanka.

## සෘජු ආයෝජන

**සෘජු ආයෝජන ව්‍යවසායයන් වෙත ලැබුණු විදේශීය ණය ද ඇතුළුව විදේශීය සෘජු ආයෝජන ලැබීම් 2024 වසර තුළ අඩු මට්ටමක පැවතුණි.** හිමිකම් කොටස් ආයෝජන සහ සෘජු ආයෝජන ව්‍යාපාර වෙත ලැබුණු අන්තර් සමාගම් ණයවල වැඩිවීමක් දක්නට ලැබුණ ද, සෘජු ආයෝජන ව්‍යාපාරවලට ලැබුණු ප්‍රතිආයෝජිත ඉපැයීම් සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් සැලකිය යුතු ලෙස අඩු විය. මේ අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත සම්බන්ධයක් නොමැති පාර්ශ්වයන්ගෙන් ලැබුණු විදේශීය ණය ලැබීම් ද 2024 වසරේ දී වැඩි වීමක් වාර්තා කළේය. ඒ අනුව, විදේශීය ණය ද ඇතුළත් විදේශීය සෘජු ආයෝජන, 2023 වසරේ දී වාර්තා වූ එ.ජ. ඩොලර් මිලියන 759ට සාපේක්ෂව, 2024 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 846ක් විය. විදේශීය ණය හැර විදේශීය සෘජු ආයෝජන, පෙර වසරේ එ.ජ. ඩොලර් මිලියන 713ට සාපේක්ෂව, 2024 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 761ක් විය. විදේශීය සෘජු ආයෝජන ප්‍රධාන වශයෙන් යොමු වූයේ විවිධාංගීකරණය වූ ව්‍යාපාර, දුරකථන සහ විදුලි සංදේශ ජාල, හෝටල් හා අවන්හල්, සහ වරාය බහාලුම් පර්යන්ත වැනි අංශ වෙතය. පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම් වෙත වූ සෘජු ආයෝජන සැලකිය යුතු ලෙස අඩු මට්ටමක පැවතුණි. කෙසේ වෙතත්, සිය මව් සමාගම කොළඹ කොටස් වෙළඳපොළ වෙතින් ඉවත් වීම නිසා, කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කර ඇති නමුත්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි ලියාපදිංචි නොවූ ප්‍රධාන සමාගමක කොටස් හිමිකාරිත්වය වෙනස්වීම හා සම්බන්ධව සැලකිය යුතු ලැබීමක් වාර්තා විය.

## විවිධ ආයෝජන

**2024 වසරේ දී, විවිධ ආයෝජනවලට අයත් වගකීම්වල ශුද්ධ වෙනස්වීම් මෙන්ම මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් ද වැඩි විය.** කොළඹ කොටස් වෙළඳපොළෙහි හිමිකම් කොටස් සහ ආයෝජන අරමුදල් කොටස් ආකාරයෙන් පැවති විවිධ ආයෝජනවල  සුළු ශුද්ධ ලැබීමක් වාර්තා වූ අතර, රාජ්‍ය සුරැකුම්පත්වල විදේශීය ආයෝජන ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. එසේම, කොළඹ කොටස් වෙළඳපොළ සහ එහි ලැයිස්තුගත කර ඇති සමාගම් යථා තත්ත්වයට පත්වීම පිළිබිඹු කරමින්, සමහර සමාගම් හිමිකම් නිකුතු සාර්ථකව සම්පූර්ණ කළ අතර, විදේශීය ආයෝජකයින්ගෙන් ද ඇතුළුව නව හිමිකම් කොටස් සමඟ ඔවුන්ගේ ශේෂ පත්‍ර ශක්තිමත් කළේය. මේ අතර, වසර තුළ රාජ්‍ය සුරැකුම්පත්වල අනේවාසික ආයෝජන සැලකිය යුතු ලෙස අඩු විය. විවිධ ආයෝජන යටතේ ණය සුරැකුම්පත්වල ගනුදෙනු සලකා බැලූ විට, විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව නිම කිරීම සහ උපචිත පොලිය සඳහා නිකුත්කරන ලද බැඳුම්කරයේ පළමු වාරිකය ආපසු ගෙවීම හේතුවෙන් රජය විසින් නිකුත් කරන ලද ණය සුරැකුම්පත්වල වගකීම් අඩු විය.

### 1.13 සංඛ්‍යා සටහන: මූල්‍ය ගිණුම

එ.ජ. ඩොලර් මිලියන

| අයිතමය | 2023 (අ) | 2024 (ආ) |
|---|---|---|
| **මූල්‍ය ගිණුම (ශුද්ධ)** | **1,483** | **892** |
| මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් | 3,655 | **1,910** |
| වගකීම්හි ශුද්ධ වෙනස්වීම් | 2,172 | **1,018** |
| | | |
| **සෘජු ආයෝජන: වත්කම්** | **51** | **110** |
| හිමිකම් | 47 | **106** |
| ණය උපකරණ | 5 | **4** |
| **සෘජු ආයෝජන: වගකීම්** | **713** | **761** |
| හිමිකම් | 497 | **499** |
| ණය උපකරණ | 216 | **262** |
| | | |
| **විවිධ ආයෝජන: වත්කම්** | **173** | **180** |
| ණය සුරැකුම්පත් | 173 | **180** |
| **විවිධ ආයෝජන: වගකීම්** | **931** | **301** |
| හිමිකම් | 8 | **2** |
| ණය සුරැකුම්පත් | 923 | **299** |
| රජය | 910 | **286** |
| කෙටිකාලීන (භාණ්ඩාගාර බිල්පත්) | 132 | **-217** |
| දිගුකාලීන | 778 | **504** |
| භාණ්ඩාගාර බැඳුම්කර | 78 | **39** |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | -27 | **-** |
| ස්වෛරීත්ව බැඳුම්කර | 727 | **465** |
| අනෙකුත් අංශ | 13 | **13** |
| දිගුකාලීන | 13 | **13** |
| | | |
| **මූල්‍ය ව්‍යුත්පන්න** | **-** | **-** |
| | | |
| **අනෙකුත් ආයෝජන: වත්කම්** | **972** | **-3** |
| මුදල් සහ තැන්පතු | 114 | **-73** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 136 | **111** |
| අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 721 | **-42** |
| **අනෙකුත් ආයෝජන: වගකීම්** | **528** | **-44** |
| මුදල් සහ තැන්පතු | -134 | **-868** |
| ණය | 751 | **993** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | -260 | **-170** |
| අනෙකුත් ගෙවිය යුතු ගිණුම් | 171 | **-** |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) | - | **-** |
| | | |
| **සංචිත වත්කම්** | **2,458** | **1,622** |
| | | |
| **ශුද්ධ වැරදීම් හා අත්හැරීම්** | **6** | **-325** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## අනෙකුත් ආයෝජන සහ සංචිත වත්කම්

**2024 වසරේ දී අනෙකුත් ආයෝජනවලට අයත් වගකීම්වල ශුද්ධ වෙනස්වීම් සහ මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම් යන දෙවර්ගය ම ඉහළ ගියේය.** ලං.ඛ.නී.සං. විසින් ඉරාන ණය පහසුකම ඇතුළුව එහි පවතින වෙළඳ ණය වගකීම් අඛණ්ඩව අඩු කිරීම හේතුවෙන් වෙළඳ ණය සහ අත්තිකාරම් වගකීම්වල අඩුවීමක් වාර්තා විය. තවද, ලං.ඛ.නී.සං. වසර තුළ දී නව වෙළඳ ණය පහසුකම්වලට ඇතුළත් නොවීය. මේ අතර, බැංකු පද්ධතියේ විදේශීය ණය වගකීම් 2024 වසරේ දී සුළු ශුද්ධ වැඩිවීමක් වාර්තා කළේය. පෞද්ගලික අංශය විසින් ණය ගැනීම් සීමා වූ අතර, එමගින් වසර තුළ දී එම අංශයෙන් සැලකිය යුතු ශුද්ධ ගෙවීමක් සිදුවිය. මූල්‍ය වත්කම්හි ශුද්ධ අත්කර ගැනීම්වල වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ දළ නිල සංචිත වැඩිවීමයි. මහ බැංකුව විසින් දේශීය

1

## 1.4 විශේෂාංග රූප සටහන්
## අර්බුදයට පෙර ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය කිරීම සහ අර්බුදයෙන් පසු මූල්‍ය ගිණුමේ හැසිරීම



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

අර්බුදයට පෙර පැවති ජංගම ගිණුමේ හිඟය මූල්‍යනය පිළිබඳ සුවිශේෂී කරුණු කිහිපයක් හෙළි වේ. 2015-2019 කාලපරිච්ඡේදය තුළ දී නිරීක්ෂණය වූ පරිදි, 2023 වසරට පෙර වසරවල දී ශ්‍රී ලංකාවේ අඛණ්ඩව පැවති ජංගම ගිණුම් හිඟයන් බොහෝ දුරට මූල්‍යනය කර ඇත්තේ අනෙකුත් ආයෝජන (ප්‍රධාන වශයෙන් ශුද්ධ විදේශ ණය), විවිධ ආයෝජන සහ සෘජු ආයෝජන මගිනි. කෙසේ වෙතත්, 2020 වසරේ සිට 2022 වසර දක්වා කාලය තුළ, විවිධ ආයෝජනවල ශුද්ධ ගෙවීමක් සහ සෘජු ආයෝජනවල සැලකිය යුතු ලෙස අඩු වීමක් වාර්තා විය. 2020 වසරේ සිට 2022 වසර දක්වා සංචිත භාවිතා කරමින් මෙය ගෙවීමට සිදු විය. කෙසේ වෙතත්, අර්බුදයෙන් පසු, විදේශීය අංශයේ ස්ථාවරත්වයත් සමඟ, ජංගම ගිණුම 2023 සහ 2024 වසරවල දී අතිරික්තයක් වාර්තා කළ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සංචිත සැලකිය යුතු ලෙස වැඩි විය. තවද, 2022 සහ 2023 වසරවල දී බැංකු අංශයට විදේශීය වත්කම් ගොඩනගා ගැනීමට හැකි විය.

විදේශ විනිමය වෙළඳපොළෙන් සිදු කළ විදේශ විනිමය මිලදී ගැනීම් සහ ජා.මූ. අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ලද ණය ලැබීම් දළ නිල සංචිත වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. මීට අමතරව, 2024 වසරේ දී බැංකු අංශයේ මුදල් හා තැන්පතුවලට අදාළ වත්කම්වල ශුද්ධ අත්කර ගැනීම්වල අඩුවීමක් දක්නට ලැබුණු අතර, වෙළඳ ණය සහ අත්තිකාරම්වල ශුද්ධ වැඩිවීමක් වාර්තා විය.

## 1.4.2 අන්තර්ජාතික ආයෝජන තත්ත්වය, සංචිත වත්කම් සහ සමස්ත ශේෂය

### අන්තර්ජාතික ආයෝජන තත්ත්වය

**2024 වසරේ දී ශ්‍රී ලංකාවේ ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය, පෙර වසරට සාපේක්ෂව ඉහළ ශුද්ධ වගකීම් තත්ත්වයක් පිළිබිඹු කළේය.** 2024 වසර අවසානය වන විට මුළු විදේශීය වගකීම් සහ මුළු විදේශීය වත්කම් යන දෙක ම වැඩි වූ නමුත්, වත්කම්වල සිදු වූ වැඩිවීම ඉක්මවා යමින් වගකීම් ඉහළ ගියේය. 2016 වසරේ දී ලබාගත් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ සිදු කළ ගෙවීම් සහ ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම ක්‍රමයෙන් පියවීම හේතුවෙන්, වසර තුළ දී මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති විදේශීය වගකීම් අඩු විය. ශුද්ධ විදේශීය සෘජු ආයෝජන ලැබීම් අඩු මට්ටමක පැවතුණ ද, වසර අවසානය වන විට සමහර පොදු ලැයිස්තුගත සමාගම්වල වෙළඳපොළ මිල ගණන් සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන්, සෘජු ආයෝජන වගකීම්වල වැඩිවීමක් වාර්තා විය. තවද, 2023 වසර අවසානය වන විට පැවති ණය සුරැකුම්පත්වල සැලකිය යුතු ලෙස අඩු වී තිබූ වෙළඳපොළ මිල ගණන් හා සසඳන විට, ණය ප්‍රතිව්‍යුහගත කිරීමෙන් පසු රජය විසින් නිකුත් කරන ලද නව ණය සුරැකුම්පත්වල ඉහළ වෙළඳපොළ මිල ගණන් හේතුවෙන් විවිධ ආයෝජන වගකීම්වල සැලකිය යුතු වැඩිවීමක් වාර්තා විය. අලුතින් නිකුත් කරන ලද බැඳුම්කරවල මුහුණත වටිනාකම, පෙර නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකමට සාපේක්ෂව සැලකිය යුතු ලෙස අඩු වීමක් තිබියදීත් මෙම තත්ත්වය ඇති විය. මීට අමතරව, රජයේ නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය සඳහා අදාළ උපචිත පොලිය ඉහළ යෑමත් සමඟ ප්‍රධාන වශයෙන් ජා.මූ. අරමුදල, ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව මගින් රජයට ලැබෙන විදේශීය ණය ලැබීම් පිළිබිඹු කරමින් විදේශීය ණය වගකීම් තත්ත්වය ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසර අවසානයේ දී රටෙහි මුළු විදේශීය වගකීම්, 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 63.4ක සිට එ.ජ. ඩොලර් බිලියන 68.0ක් දක්වා ඉහළ ගියේය.

**සංචිත වත්කම් සහ බැංකු අංශයේ විදේශීය වත්කම් යන දෙකෙහි ම වැඩි වීමත් සමඟ 2024 වසර තුළ දී ශ්‍රී ලංකාවේ විදේශීය වත්කම් තත්ත්වය ද ඉහළ ගියේය.** එහි ප්‍රතිඵලයක් ලෙස, රටෙහි මුළු විදේශීය වත්කම්, 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 12.5ක සිට, 2024 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 14.5ක් දක්වා

**1.14 සංඛ්‍යා සටහන: අන්තර්ජාතික ආයෝජන තත්ත්වය (සාරාංශය) (අ)**

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

| අයිතමය | 2023 (ආ) | | 2024 (ඇ) | |
|---|---|---|---|---|
| | වත්කම් | වගකීම් | වත්කම් | වගකීම් |
| **සෘජු ආයෝජන** | **1,589** | **14,833** | **1,699** | **16,556** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | 1,539 | 8,668 | **1,645** | **10,130** |
| ණය උපකරණ | 50 | 6,164 | **54** | **6,427** |
| **විවිධ ආයෝජන** | **174** | **7,744** | **353** | **10,457** |
| හිමිකම් සහ ආයෝජන අරමුදල් කොටස් | - | 484 | - | **762** |
| ණය සුරැකුම්පත් | 174 | 7,260 | **353** | **9,694** |
| **අනෙකුත් ආයෝජන** | **6,370** | **40,832** | **6,367** | **41,012** |
| මුදල් සහ තැන්පතු | 1,770 | 7,941 | **1,697** | **7,051** |
| ණය | - | 30,847 | - | **32,133** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් | 1,629 | 760 | **1,741** | **590** |
| අනෙකුත් ලැබිය යුතු / ගෙවිය යුතු ගිණුම් | 2,971 | - | **2,930** | - |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) | | 1,285 | | **1,239** |
| **සංචිත වත්කම්** | **4,392** | | **6,122** | |
| **මුළු වත්කම් / වගකීම්** | **12,525** | **63,410** | **14,542** | **68,025** |
| **ශුද්ධ අන්තර්ජාතික ආයෝජන තත්ත්වය** | | **-50,885** | | **-53,484** |
| **විශේෂිත අයිතමයන්** | | | | |
| පරිණත කාලය අනුව අන්තර්ජාතික ආයෝජන තත්ත්වය | 12,525 | 63,410 | **14,542** | **68,025** |
| කෙටිකාලීන | 9,280 | 5,811 | **9,075** | **5,915** |
| දිගුකාලීන | 3,244 | 57,599 | **5,467** | **62,110** |

(අ) අන්තර්ජාතික ආයෝජන තත්ත්වයෙහි සවිස්තරාත්මක සංරචක සඳහා සංඛ්‍යාලේඛන පරිශිෂ්ටය වගුව 12 පරිශීලනය කරන්න
(ආ) සංශෝධිත
(ඇ) තාවකාලික

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉහළ ගියේය. විදේශීය වත්කම්වල ඉහළ යෑම ඉක්මවා මුළු වගකීම් ඉහළ ගිය අතර, එමගින් ඉහළ ශුද්ධ වගකීම් තත්ත්වයක් ඇති විය. ඒ අනුව, රටෙහි ශුද්ධ වගකීම් තත්ත්වය, 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 50.9ට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 53.5ක් දක්වා වැඩි විය.

## සංචිත වත්කම් තත්ත්වය

**ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත, 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 4.4ක සිට, 2024 වසර අවසානය වනවිට එ.ජ. ඩොලර් බිලියන 6.1ක් දක්වා සැලකිය යුතු ලෙස වර්ධනය විය.** මෙම වැඩිවීම සඳහා මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මෙතෙක් සිදු කරන ලද ඉහළ ම ශුද්ධ විදේශ විනිමය මිලදී ගැනීම්, දැනට ක්‍රියාත්මක වන ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ වන තෙවන වාරිකය ලැබීම සහ ලෝක බැංකුව සහ ආසියානු සංවර්ධන බැංකුව මගින් ලැබූ මූල්‍ය සහයෝගය හේතු විය. දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් සෘජුව ම විදේශ විනිමය අවශෝෂණය කිරීම හරහා දළ නිල සංචිත ගොඩ නැංවීම හේතුවෙන්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙළ යටතේ 2024 වසර සඳහා වූ ශුද්ධ ජාත්‍යන්තර සංචිත ඉලක්ක ඉක්මවා යාමට මහ බැංකුවට හැකි විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව එක් වරක් පමණක් ගෙවිය යුතුව තිබූ ගාස්තු සහ පොලී ගෙවීම් හේතුවෙන්, 2024 වසරේ නොවැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.5ක් වූ දළ නිල සංචිත, 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.1ක් දක්වා පහළ ගියේය. මීට අමතරව, විදේශීය වත්කම්වල වැඩිවීම විදේශීය වගකීම්වල වැඩිවීම ඉක්මවා යාම හේතුවෙන්, 2024 වසරේ දී බැංකු අංශයේ ශුද්ධ විදේශීය වත්කම් තත්ත්වය වර්ධනය විය. බැංකු අංශයේ විදේශීය වත්කම් තත්ත්වය, 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 5.0ට සාපේක්ෂව, 2024 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 5.1ක් දක්වා ඉහළ ගියේය. එහි ප්‍රතිඵලයක් ලෙස, දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශීය වත්කම්වලින් සමන්විත වන මුළු විදේශීය සංචිත, 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 9.4ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 11.2ක් දක්වා සැලකිය යුතු වැඩිවීමක් වාර්තා කළේය.

**1.15 සංඛ්‍යා සටහන: දළ නිල සංචිත, මුළු විදේශීය වත්කම් සහ සමස්ත ශේෂය**

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

| අයිතමය | 2020 | 2021 | 2022 | 2023 | 2024 (අ) |
|---|---|---|---|---|---|
| 1. රජයේ විදේශීය වත්කම් | 155 | 177 | 39 | 875 | **368** |
| 2. මහ බැංකුවේ විදේශීය වත්කම් | 5,510 | 2,962 | 1,858 | 3,517 | **5,754** |
| **3. දළ නිල සංචිත (1+2)** | **5,664** | **3,139** | **1,898** | **4,392** | **6,122** |
| 4. තැන්පතු භාර ගන්නා ආයතනවල විදේශීය වත්කම් | 2,856 | 2,983 | 3,976 | 4,981 | **5,108** |
| **5. මුළු විදේශීය වත්කම් (3+4) (ආ)** | **8,521** | **6,122** | **5,874** | **9,373** | **11,230** |
| 6. සංචිතවලට අදාළ වගකීම් (ඇ) | 2,121 | 3,562 | 5,127 | 4,796 | **3,635** |
| **7. ශුද්ධ ජාත්‍යන්තර සංචිත (3-6)** | **3,543** | **-423** | **-3,229** | **-404** | **2,487** |
| **8. සමස්ත ශේෂය (ඈ)** | **-2,328** | **-3,967** | **-2,806** | **2,826** | **2,890** |
| 9. දළ නිල සංචිත මගින් වෙළඳ භාණ්ඩ ආනයන ආවරණය කළ හැකි මාස ගණන | 4.2 | 1.8 | 1.2 | 3.1 | **3.9** |
| 10. මුළු විදේශීය වත්කම් මගින් වෙළඳ භාණ්ඩ ආනයන ආවරණය කළ හැකි මාස ගණන | 6.4 | 3.6 | 3.9 | 6.7 | **7.2** |

(අ) තාවකාලික
(ආ) 'විදේශයන්හි සිදු කරන ලද සෘජු ආයෝජන' සහ 'ලබා දුන් වෙළඳ ණය සහ අත්තිකාරම්' යන විදේශීය වත්කම් ඇතුළත් නොවේ.
(ඇ) මහ බැංකුවේ නොපියවා ඉතිරිව ඇති ණය (විශේෂ ගැනුම් හිමිකම් හැර)
(ඈ) කාලපරිච්ඡේදය තුළ දී ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වයේ වෙනස්වීම

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


1

## 1.5 විශේෂාංග රූප සටහන්
## ශ්‍රී ලංකාවේ සංචිත ප්‍රමාණාත්මකතා දර්ශක වර්ධනය වීම

ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත 2021 සහ 2022 වසරවල දී තියුණු ලෙස අඩුවීමෙන් පසු ක්‍රමයෙන් ඉහළ ගොස් ඇති අතර, කෙටිකාලීන ණය අඩු වී ඇත. කෙටිකාලීන වගකීම්වල ප්‍රතිශතයක් ලෙස දළ නිල සංචිත අනුපාතය ඉහළ යාමට මෙය බලපා ඇති අතර, එයින් අදහස් වන්නේ කෙටි කාලීනව තම මූල්‍ය වගකීම් සපුරාලීමට රට වඩා හොඳින් සූදානම් බවයි.


මේ අතර, දළ නිල සංචිත මගින් ආවරණය කළ හැකි ආනයනික මාස ප්‍රමාණය අනුව ප්‍රකාශ කෙරෙන ආනයන ආවරණය ද ක්‍රමයෙන් වර්ධනය වී ඇති අතර, එය විදේශීය අංශය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමක් පෙන්නුම් කරයි. මෙම සංචිත ප්‍රමාණාත්මකතා දර්ශකවල වර්ධනයන් මගින් පෙන්නුම් කරන්නේ බාහිර ස්වාරක්ෂක ශක්තිමත් වීම සහ රටෙහි සාර්ව ආර්ථික ස්ථාවරත්වය හා ණය ලබා ගැනීමට ඇති යෝග්‍යතාව මෙන්ම ආයෝජකයින්ගේ විශ්වාසයෙහි සිදු වූ වර්ධනයයි.

සංචිත ප්‍රමාණාත්මකතාවය: ආනයනික මාස




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

සංචිත ප්‍රමාණාත්මකතාවය: කෙටිකාලීන ණයවල % ලෙස




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### සමස්ත ශේෂය

**ශුද්ධ ජාත්‍යන්තර සංචිතවල වෙනස්වීම නිරූපණය කරන ගෙවුම් තුලනයෙහි සමස්ත ශේෂය 2024 වසර අවසානයේ දී ඉහළ අතිරික්තයක් වාර්තා කළේය.** 2023 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 4.4ක් වූ දළ නිල සංචිත, 2024 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.1ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ගිවිසුම් කාලය තවත් වසර තුනකින් දීර්ඝ කරන ලද සහ භාවිතා කිරීමේ කොන්දේසි අදාල වන, චීන මහජන බැංකුව සමඟ ඇති කරගත් විදේශ විනිමය හුවමාරු පහසුකම මෙයට ඇතුළත් වේ. මේ අතර, සංචිතවලට අදාළ වගකීම් අඩු වූ අතර, එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ වසර තුළ දී ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකමට අදාළ ආපසු ගෙවීම් සහ 2016 වසරේ දී ජා.මූ. අරමුදලෙන් ලබාගත් විස්තීර්ණ ණය පහසුකමට අදාළ ගෙවීම්ය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2024 වසර අවසානය වන විට ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වය පෙර වසරට සාපේක්ෂව වර්ධනය වූ අතර, එමගින් සමස්ත ශේෂය 2023 වසරේ දී පැවති එ.ජ. ඩොලර් බිලියන 2.8ක අතිරික්තයට සාපේක්ෂව එ.ජ. ඩොලර් බිලියන 2.9ක පමණ අතිරික්තයක් වාර්තා විය.


## 1.4.3 විදේශීය ණය සහ ණය සේවාකරණ ගෙවීම්

### විදේශීය ණය

**විදේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලියෙන් අනතුරුව, 2024 වසරේ දී මුහුණත වටිනාකමට අනුව ශ්‍රී ලංකාවේ විදේශීය ණය අඩු විය.** 2023 වසරේ දී විදේශීය ණයෙහි වෙළඳපොළ වටිනාකම සහ මුහුණත වටිනාකම අතර විශාල වෙනසක් දක්නට ලැබුණි. කෙසේ වුවත්, ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් අනතුරුව මෙම වෙනස සැලකිය යුතු ලෙස අඩු විය. විදේශීය ණයවල වෙළඳපොළ වටිනාකම සහ මුහුණත වටිනාකම අතර වෙනස 2023 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 5,374ක් වූ අතර, එය 2024 වසරේ දී එ.ජ. ඩොලර් මිලියන 62ක් දක්වා අඩු වී ඇත. ඒ අනුව, 2023 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 59.6ක් වූ මුහුණත වටිනාකමට අනුව ශ්‍රී ලංකාවේ මුළු විදේශීය ණය, 2024 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 57.2ක් විය. මුළු විදේශීය ණයවල මෙම

## 1.6 විශේෂාංග රූප සටහන්
## ආර්ථික අර්බුදයෙන් පසු ජාත්‍යන්තර සංචිත නැවත යථා තත්ත්වයට පත් වීම

**දළ නිල සංචිත සහ ශුද්ධ ජාත්‍යන්තර සංචිත**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත සහ ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වය කැපී පෙනෙන ලෙස නැවත යථා තත්ත්වයට පත් වීමක් වාර්තා කළේය. 2021 වසරේ සිට චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළත් වූ රටෙහි දළ නිල සංචිත තත්ත්වය, 2022 වසරේ දී අවම මට්ටමකට පත් වූ අතර, ඒ හේතුවෙන් රජය විසින් ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීමක් ප්‍රකාශයට පත් කරන ලදී. සංචිත ආශ්‍රිත වගකීම් ද සැලකිල්ලට ගනු ලබන රටෙහි ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වය 2022 වසරේ දී සෘණ තත්ත්වයක පැවති අතර, එය ඉතිහාසයේ වූ අවම මට්ටම වේ. කෙසේ වුවත්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වන නිර්ණායක සැපිරිය යුතු මට්ටම ද ඉක්මවමින් වත්කම් ඉහළ නංවා ගැනීමට මහ බැංකුවට හැකි වූ අතර, සෘජු මිලදී ගැනීම් සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම ආශ්‍රිත බහුපාර්ශ්වික අරමුදල් ද මෙම ක්‍රියාවලියට සහාය විය. ඉන්දියානු සංචිත බැංකුව සමඟ පවතින විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම සම්බන්ධ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම හමුවේ සංචිත ආශ්‍රිත වගකීම් ද අඩු විය. එබැවින්, අර්බුදයෙන් පසුව සංචිතවලට අදාළ V-හැඩැති නැවත යථා තත්ත්වයට පත් වීම, දළ නිල සංචිතවල සැලකිය යුතු වැඩි වීමෙහි මෙන්ම මහ බැංකුවේ වගකීම්වල අඛණ්ඩ අඩු වීමෙහි ද ඒකාබද්ධ ප්‍රතිඵලයකි. ▲

අඩු වීම, නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල සහ රජය සතු ද්විපාර්ශ්වික ණයවල විශාල කොටසක් ප්‍රතිව්‍යුහගත කිරීමේ සෘජු ප්‍රතිඵලයකි. මෙම පසුබිම තුළ, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙන් අනතුරුව, අනේවාසිකයන් සතු ශ්‍රී ලංකාවේ නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකම, 2023 වසර අවසානයේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 10.8ක සිට 2024 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 9.3ක් දක්වා අඩු විය. සමස්තයක් ලෙස, 2023 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 38.4ක් වූ මුහුණත වටිනාකමට අනුව රජයේ විදේශීය ණය ප්‍රමාණය, 2024 වසර අවසානයේ දී ආසන්න වශයෙන් එ.ජ. ඩොලර් බිලියන 37.6ක් විය. මෙය, රජය විසින් අලුතින් නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකම සැලකිය යුතු ලෙස අඩු වීම සහ ජා.මූ. අරමුදලෙන්[21] හා අනෙකුත් බහු පාර්ශ්වික ණය ලබාදෙන ආයතන සමඟ ඇති නොපියවා ඉතිරිව ඇති ණය තත්ත්වයෙහි සිදු වූ ඉහළ යෑමෙහි ඒකාබද්ධ ප්‍රතිඵලයකි. සමස්තයක් ලෙස, 2023 වසර අවසානයේ දී රටේ විදේශීය ණය (මුහුණත වටිනාකමට අනුව) ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 71.2%ක් වූ අතර, එය 2024 වසර අවසානයේ දී 57.8%ක් දක්වා පහත වැටුණි.

**මේ අතර, වෙළඳපොළ වටිනාකම අනුව රජයේ විදේශීය ණය 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ඉහළ ගියේය.** මෙහි ප්‍රතිඵලයක් ලෙස, ගනුදෙනු කළ හැකි ණය උපකරණ සඳහා වෙළඳපොළ වටිනාකම අනුව ප්‍රකාශයට පත් කෙරෙන රජයේ නොපියවා ඉතිරිව ඇති ණය තත්ත්වය, 2023 වසර අවසානයේ දී එ.ජ. ඩොලර් බිලියන 33.1ක් වූ අතර, එය 2024 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 37.6ක් වීම සඳහා මූලිකව ම හේතු වූයේ 2023 වසරට සාපේක්ෂව නොපියවා ඉතිරිව ඇති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල[22] වෙළඳපොළ වටිනාකම ඉහළ යෑමයි. ඉන්දියානු සංචිත බැංකුව සමඟ වූ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම ක්‍රමයෙන් ආපසු ගෙවීම සහ 2016 වසරේ දී ලබා ගත් ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහනට අදාළ ආපසු ගෙවීම් හේතුවෙන් මහ බැංකුවේ විදේශීය ණය සැලකිය යුතු ලෙස පහත වැටුණි. නොපියවා ඉතිරිව ඇති කෙටිකාලීන ණය ප්‍රමාණය ඉහළ යෑම හේතුවෙන් බැංකු අංශයේ විදේශීය ණය සුළු වශයෙන් වැඩි විය.

21 දැනට පවතින ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම මූලිකව ම අයවැයට සහාය වීමේ අරමුණින් ලබා ගත් බැවින් එය ශ්‍රී ලංකා රජයේ වගකීමක් ලෙස සැලකේ. මින් පෙර පැවති ජා.මූ. අරමුදලේ පහසුකම් මූලිකව ම ගෙවුම් තුලනයට සහාය වීම සඳහා ලබා ගත් බැවින් ඒවා මහ බැංකුවේ වගකීම් ලෙස සැලකේ.

22 නොගෙවූ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල උපචිත පොලිය, අදාළ කාලපරිච්ඡේදය අවසානයේ දී පැවති ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරි වූ වගකීම්වලට වෙළඳපොළ වටිනාකම සහ මුහුණත වටිනාකම යන ආකාර දෙකට ම අනුව ඇතුළත් කර ඇත.

1

## 1.16 සංඛ්‍යා සටහන: නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය තත්ත්වය

එ.ජ. ඩොලර් මිලියන
(කාලපරිච්ඡේදය අවසානයේ දී තත්ත්වය)

| අයිතමය | 2023 (අ) | 2024 (ආ) |
|---|---|---|
| **වෙළඳපොළ වටිනාකම මත පදනම්ව** | | |
| **රජය** | **33,117** | **37,599** |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (පොත් අගය මත පදනම්ව) | 334 | 223 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (උපචිත පොලිය ඇතුළුව වෙළඳපොළ මිල මත පදනම්ව) | 6,794 | 9,315 |
| නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය (උපචිත පොලිය ඇතුළුව) | 25,988 | 28,061 |
| **මහ බැංකුව** | **6,081** | **4,874** |
| මුදල් සහ තැන්පතු (කෙටිකාලීන) | 0.3 | 0.1 |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 1,285 | 1,239 |
| ඉන්දියානු සංචිත බැංකුවේ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම | 2,471 | 1,563 |
| චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම | 1,420 | 1,406 |
| ජා.මූ. අරමුදලේ ණය | 904 | 667 |
| **තැන්පතු භාර ගන්නා ආයතන** | **4,933** | **4,980** |
| මුදල් සහ තැන්පතු (ඇ) | 4,050 | 4,082 |
| ණය | 883 | 897 |
| **අනෙකුත් අංශ (ඈ)** | **3,963** | **3,254** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (ඉ) | 760 | 590 |
| ණය සුරැකුම්පත් (උපචිත පොලිය ඇතුළුව වෙළඳපොළ මිල මත පදනම්ව) | 132 | 156 |
| පෞද්ගලික අංශයේ සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි ණය | 3,071 | 2,508 |
| **සෘජු ආයෝජන: අන්තර් සමාගම් ණය (ඊ)** | **6,164** | **6,427** |
| | | |
| **දළ විදේශීය ණය තත්ත්වය - වෙළඳපොළ වටිනාකම අනුව** | **54,257** | **57,133** |
| **දළ විදේශීය ණය තත්ත්වය - වෙළඳපොළ වටිනාකම අනුව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස** | **64.8** | **57.7** |
| | | |
| **මුහුණත වටිනාකම මත පදනම්ව** | | |
| **රජය** | **38,428** | **37,610** |
| භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර (මුහුණත වටිනාකම මත පදනම්ව) | 363 | 234 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර (උපචිත පොලිය ඇතුළුව මුහුණත වටිනාකම මත පදනම්ව) | 12,078 | 9,315 |
| නොපියවා ඉතිරිව ඇති විදේශීය ණය (උපචිත පොලිය ඇතුළුව) | 25,988 | 28,061 |
| **මහ බැංකුව** | **6,081** | **4,874** |
| මුදල් සහ තැන්පතු (කෙටිකාලීන) | 0.3 | 0.1 |
| විශේෂ ගැනුම් හිමිකම් වෙන් කිරීම් | 1,285 | 1,239 |
| ඉන්දියානු සංචිත බැංකුවේ විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම | 2,471 | 1,563 |
| චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම | 1,420 | 1,406 |
| ජා.මූ. අරමුදලේ ණය | 904 | 667 |
| **තැන්පතු භාර ගන්නා ආයතන** | **4,933** | **4,980** |
| මුදල් සහ තැන්පතු (ඇ) | 4,050 | 4,082 |
| ණය | 883 | 897 |
| **අනෙකුත් අංශ (ඈ)** | **4,024** | **3,304** |
| වෙළඳ ණය සහ අත්තිකාරම් (ඉ) | 760 | 590 |
| ණය සුරැකුම්පත් (උපචිත පොලිය ඇතුළුව මුහුණත වටිනාකම මත පදනම්ව) | 194 | 207 |
| පෞද්ගලික අංශයේ සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්හි ණය | 3,071 | 2,508 |
| **සෘජු ආයෝජන: අන්තර් සමාගම් ණය (ඊ)** | **6,164** | **6,427** |
| | | |
| **දළ විදේශීය ණය තත්ත්වය - මුහුණත වටිනාකම අනුව** | **59,631** | **57,195** |
| **දළ විදේශීය ණය තත්ත්වය - මුහුණත වටිනාකම අනුව ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස** | **71.2** | **57.8** |
| | | |
| **විශේෂිත අයිතමයන්** | | |
| **නොපියවා ඉතිරිව ඇති මුළු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල මුහුණත වටිනාකම** | **12,550** | **10,585** |
| අනේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය | 10,800 | 9,315 |
| නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවල නොපියවා ඉතිරිව ඇති තත්ත්වය (උ) | 1,750 | 1,270 |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) පෞද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හිමියන්ගේ තැන්පතු ඇතුළත් වේ.
(ඈ) පෞද්ගලික අංශය සහ රජය සතු වාණිජ ව්‍යවසායයන් ඇතුළත් වේ.
(ඉ) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ පෞද්ගලික අංශයේ සමාගම්හි නොපියවා ඉතිරිව ඇති වෙළඳ ණය ඇතුළත් වේ.
(ඊ) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි සමාගම්වල අන්තර් සමාගම් ණය සහ කොටස් හිමියන්ගේ අත්තිකාරම් ඇතුළත් වේ.
(උ) 2019 දෙසැම්බර් සිට විදේශීය ණය සංඛ්‍යානවල ඇතුළත් නොවේ.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විදේශීය ණය සේවාකරණ ගෙවීම්

**ණය ආපසු ගෙවීම අත්හිටුවා තිබූ රජයේ ණය බොහොමයක් 2024 අග භාගය වන විට ණය ආපසු ගෙවීම නැවත ආරම්භ කිරීමත් සමඟ, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී ශ්‍රී ලංකාවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් වැඩි විය.** 2023 වසරේ දී වූ එ.ජ. ඩොලර් බිලියන 2.8ක් වූ විදේශීය ණය සේවාකරණ ගෙවීම්, 2024 වසරේ දී එ.ජ. ඩොලර් බිලියන 4.2ක් දක්වා ඉහළ ගියේය. රජයේ විදේශීය ණය ආපසු ගෙවීම් පෙර පැවති මට්ටම්වල ම පැවතුණ ද, 2024 වසරේ මෙම ඉහළ යෑමට මහ බැංකුව සහ පෞද්ගලික අංශය විසින් සිදු කළ ඉහළ ණය සේවාකරණය මූලිකව

1

**1.17 සංඛ්‍යා සටහන: විදේශීය ණය සේවාකරණ ගෙවීම්**

එ.ජ. ඩොලර් මිලියන

| අයිතමය | 2023 (අ) | 2024 (ආ) |
|---|---|---|
| **1. ණය සේවාකරණ ගෙවීම්** | **2,751** | **4,152** |
| **1.1 ණය ආපසු ගෙවීම්** | **2,125** | **3,020** |
| රජය | 1,043 | **693** |
| ව්‍යාපෘති ණය | 1,041 | **589** |
| ණය සුරැකුම්පත් | 2 | **104** |
| මහ බැංකුව | 522 | **1,110** |
| ජා.මූ. අරමුදල | 172 | **210** |
| ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම් | 350 | **900** |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාරගන්නා ආයතන | 560 | **1,217** |
| විදේශීය ණය | 560 | **1,217** |
| **1.2 පොලී ගෙවීම්** | **627** | **1,132** |
| රජය | 405 | **749** |
| ව්‍යාපෘති ණය | 377 | **532** |
| ණය සුරැකුම්පත් | 28 | **217** |
| මහ බැංකුව | 118 | **276** |
| ජා.මූ. අරමුදල | 57 | **83** |
| ජාත්‍යන්තර විදේශ විනිමය හුවමාරු පහසුකම් | 60 | **192** |
| පෞද්ගලික අංශය සහ තැන්පතු භාරගන්නා ආයතන | 92 | **107** |
| විදේශීය ණය | 92 | **107** |
| සෘජු ආයෝජන ව්‍යාපාරයන්හි අන්තර් සමාගම් ණය | 12 | **-** |
| **2. වෙළඳ භාණ්ඩ හා සේවාවන්ගේ අපනයන ඉපැයුම්** | **17,327** | **19,682** |
| **3. වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයුම්, ආදායම් හා ජංගම සංක්‍රාම** | **23,776** | **26,877** |
| **4. ණය සේවාකරණ අනුපාතය** | | |
| **4.1 ඉහත 2හි % වශයෙන්** | | |
| සමස්ත අනුපාතය | 15.9 | **21.1** |
| ජා.මූ. අරමුදලේ ගනුදෙනු හැර | 14.6 | **19.6** |
| **4.2 ඉහත 3හි % වශයෙන්** | | |
| සමස්ත අනුපාතය | 11.6 | **15.4** |
| ජා.මූ. අරමුදලේ ගනුදෙනු හැර | 10.6 | **14.4** |
| **5. රජයේ ණය සේවාකරණ ගෙවීම්** | | |
| 5.1 රජයේ ණය සේවාකරණ ගෙවීම් (ඇ) | 1,448 | **1,443** |
| 5.2 ඉහත 1හි % වශයෙන් | 52.6 | **34.7** |

(අ) සංශෝධිත
(ආ) තාවකාලික
(ඇ) ජා.මූ. අරමුදලේ ගනුදෙනු හැර

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව


ම හේතු විය. ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලට අදාළ ගෙවීම් ආරම්භ කිරීම රජයේ විදේශීය ණය ආපසු ගෙවීමට අදාළ ප්‍රධාන ප්‍රවණතාවයක් විය. මෙයට උපචිත පොලිය සඳහා නිකුත්කරන ලද බැඳුම්කරයේ පළමුවන වාරිකය ආපසු ගෙවීම සහ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලට අදාළ පොලී ගෙවීම් ඇතුළත් වේ. 2023 වසරට සාපේක්ෂව රජයේ විදේශීය ණය සේවාකරණය සමාන මට්ටමක පැවතුණ ද, පොලී ගෙවීම්වල සැලකිය යුතු වැඩිවීමක් සහ ණය ආපසු ගෙවීම්වල අඩුවීමක් වාර්තා විය. එනමුත්, 2024 වසරේ දී මහ බැංකුවේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. තවද, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී පෞද්ගලික අංශයේ විදේශීය ණය සේවාකරණ ගෙවීම්වල කැපී පෙනෙන ඉහළ යෑමක් වාර්තා වූ අතර, එය රටෙහි විදේශීය ණය සේවාකරණ ගෙවීම් ඉහළ යෑමට දායක විය.

## 1.4.4 විනිමය අනුපාතිකයේ හැසිරීම

**2024 වසරේ දී ශ්‍රී ලංකා රුපියල අතිප්‍රමාණය විය.** අඛණ්ඩව වසර දෙකක් පුරාවට සිදු වූ අතිප්‍රමාණය වීමට හේතු වූයේ, එම වසරවල ජංගම ගිණුමේ අතිරික්තයන් වාර්තා වීම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත අඛණ්ඩව ශුද්ධ විදේශ විනිමය ලැබීමත් සමඟ විදේශ විනිමය ද්‍රවශීලතාවය වැඩි වීමයි. මෙම ලැබීම් ප්‍රධාන වශයෙන් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, සංචාරක ඉපැයීම්, සේවා අංශයේ අනෙකුත් සේවා ආශ්‍රිත ලැබීම් සහ වෙළඳ භාණ්ඩ අපනයනවලින් සමන්විත වේ. මේ අතර, වෙළඳ භාණ්ඩ ආනයන, සේවා අංශයේ ගෙවීම් සහ ජංගම ගිණුමේ අනෙකුත් ගෙවීම් අඩු මට්ටමක පැවතුණි. රටේ නිල සංචිත ශක්තිමත් කිරීම සඳහා 2024 වසරේ දී මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙතින් ශුද්ධ පදනම මත (වෙළඳ දිනය මත පදනම්ව) එ.ජ. ඩොලර් මිලියන 2,846ක් මිල දී ගන්නා ලදී. මෙය, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් මෙතෙක් වාර්තා වූ ඉහළම වාර්ෂික ශුද්ධ මිලදී ගැනීම විය. මහ බැංකුව විසින් මිලදී ගැනීම් සිදු නොකළේ නම් රුපියල තවදුරටත් අතිප්‍රමාණය වීමට ඉඩ තිබුණි.

**සමස්තයක් වශයෙන් 2024 වසරේ දී අතිප්‍රමාණය වුවද, වසරේ ඇතැම් කාලපරිච්ඡේදවල දී ශ්‍රී ලංකා රුපියලෙහි විචලනයන් දක්නට ලැබුණි.** සමස්තයක් ලෙස වසර අවසානයේ දී ශ්‍රී ලංකා රුපියල, එ.ජ. ඩොලරයට සාපේක්ෂව 10.7%ක වාර්ෂික අතිප්‍රමාණය වීමක් වාර්තා කරමින් රු. 292.58ක අගයක පැවතුණි. 2024 වසරේ දී එ.ජ. ඩොලරයට සාපේක්ෂව අනෙකුත් ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල් අවප්‍රමාණය වුවද, ශ්‍රී ලංකා රුපියල එම මුදල්වලට සාපේක්ෂව අඛණ්ඩව අතිප්‍රමාණය විය. ඒ අනුව, 2024 වසරේ දී ශ්‍රී ලංකා රුපියල යූරෝ (17.8%), ස්ටර්ලින් පවුම (12.3%), ජපන් යෙන් (22.5%), චීන යුවාන් (13.9%), ඉන්දියානු රුපියල (13.9%) හා ඕස්ට්‍රේලියානු ඩොලරයට (21.7%)ට සාපේක්ෂව අතිප්‍රමාණය විය. මහ බැංකුව වෙළඳපොළ මත පදනම් වූ විනිමය අනුපාතික

**1.21 රූප සටහන: දෛනික විනිමය අනුපාතිකයේ වෙනස්වීම්**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1

### 1.18 සංඛ්‍යා සටහන: විනිමය අනුපාතික වෙනස්වීම්

| මුදල් වර්ගය | විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකට රුපියල් අගය | | | | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශත වෙනස්වීම (අ) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | වර්ෂය අග අනුපාතිකය | | | වාර්ෂික සාමාන්‍ය අනුපාතිකය | | | වර්ෂය අග | | වාර්ෂික සාමාන්‍යය | |
| | 2022 | 2023 | 2024 | 2022 | 2023 | 2024 | 2023 | 2024 | 2023 | 2024 |
| යූරෝ | 386.93 | 358.75 | **304.56** | 339.04 | 354.11 | **327.05** | 7.86 | **17.79** | -4.26 | **8.28** |
| ඉන්දියානු රුපියල් | 4.39 | 3.90 | **3.42** | 4.11 | 3.97 | **3.61** | 12.57 | **13.94** | 3.63 | **9.82** |
| ජපන් යෙන් | 2.74 | 2.29 | **1.87** | 2.44 | 2.34 | **2.00** | 19.53 | **22.51** | 4.54 | **17.01** |
| බ්‍රිතාන්‍ය පවුම් | 437.35 | 412.61 | **367.38** | 396.89 | 407.07 | **386.25** | 5.99 | **12.31** | -2.50 | **5.39** |
| එක්සත් ජනපද ඩොලර් | 363.11 | 323.92 | **292.58** | 324.55 | 327.53 | **302.12** | 12.10 | **10.71** | -0.91 | **8.41** |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) | 483.24 | 434.60 | **381.57** | 431.91 | 436.88 | **401.07** | 11.19 | **13.90** | -1.14 | **8.93** |

(අ) වෙනස්වීම ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදාළ විදේශීය ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කරගෙනය. සෘණ ලකුණින් ශ්‍රී ලංකා රුපියලෙහි අගය විදේශීය ව්‍යවහාර මුදල් ඒකකයට සාපේක්ෂව අවප්‍රමාණය වීමක් පෙන්නුම් කරයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ප්‍රතිපත්තියක් අඛණ්ඩව අනුගමනය කළ අතර, දිනයක් තුළ දී අධික විචලනයක් ඇති වූ අවස්ථාවල දී පමණක් දේශීය විදේශ විනිමය වෙළඳපොළට විදේශ විනිමය විකිණීම තුළින් මැදිහත් වීම් සිදු කළේය. නිල සංචිත ගොඩනගා ගැනීමේ අරමුණ සහිතව විදේශ විනිමය මිල දී ගැනීම සඳහා මැදිහත්වීම් නිතිපතා සිදු විය.


### නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

**2024 වසර තුළ දී නාමික සඵල විනිමය අනුපාතිකය සහ මූර්ත සඵල විනිමය අනුපාතිකය ඉහළ යමින් අතිප්‍රමාණය වීමක් පිළිබිඹු කළේය.** තෝරාගත් ප්‍රධාන මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ නාමික අතිප්‍රමාණය වීම සහ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු

### 1.7 විශේෂාංග රූප සටහන්
### නම්‍යශීලී විනිමය අනුපාතිකයක් යටතේ වන විනිමය අනුපාතික ප්‍රවණතා


පසුගිය වසර දෙක තුළ දී වාර්තා වූ ශ්‍රී ලංකා රුපියලෙහි අතිප්‍රමාණය වීම, සීමිත විදේශ විනිමය ගෙවීම් මධ්‍යයේ වාර්තා වූ විදේශීය ජංගම ගිණුමේ අතිරික්තය මගින් පිළිබිඹු වන වැඩි දියුණු වූ ආර්ථික මූලිකාංගවල ඒකාබද්ධ ප්‍රතිඵලයකි. මහ බැංකුව විසින් දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මැදිහත් වී වාර්තාගත මට්ටමක විදේශ විනිමය ප්‍රමාණයක් මිල දී නොගත්තේ නම් මෙම අතිප්‍රමාණය වීම වඩාත් තීව්‍ර වීමට ඉඩ තිබුණි. මුදලේ අගය අතිප්‍රමාණය වීමක් යනු මනා ආර්ථික ක්‍රියාකාරීත්වයක පිළිබිඹුවක් බවට ඇති පොදු මතය මිථ්‍යාවකි. යම් මුදලක් අවප්‍රමාණය වීම මෙන්ම අතිප්‍රමාණය වීමෙහි ද එයට ම ආවේණික වූ වාසි මෙන්ම අවාසි ද ඇති අතර, දිගින් දිගටම අතිප්‍රමාණය වීම රටෙහි විදේශීය තරගකාරීත්වයට අහිතකර විය හැක. එම නිසා, මහ බැංකු පනතෙන් නියම කර ඇති නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමය යටතේ, විනිමය අනුපාතිකයේ හැසිරීම බොහෝ දුරට විදේශ විනිමය වෙළඳපොළෙහි ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් මත තීරණය වේ. ආර්ථිකයේ මූලිකාංග මගින් එවැනි ප්‍රවණතා මෙහෙයවන්නේ නම් මිස, මෙම ක්‍රමවේදය යටතේ විනිමය අනුපාතිකය අඛණ්ඩව අවප්‍රමාණය වීම හෝ අතිප්‍රමාණය වීමට ඇති ඉඩ ප්‍රස්ථාව අඩුය.

#### විනිමය අනුපාතිකය අතිප්‍රමාණය වීම / අවප්‍රමාණය වීම




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

#### දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත මහ බැංකුවේ මැදිහත්වීම




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

1

## 1.19 සංඛ්‍යා සටහන: නාමික සහ මූර්ත සඵල විනිමය අනුපාතික

| සඵල විනිමය අනුපාතික දර්ශක (අ) (ආ) (2017=100) | වර්ෂය අග දර්ශකය | | | වාර්ෂික සාමාන්‍ය දර්ශකය | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශත වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | වර්ෂය අග දර්ශකය | | වාර්ෂික සාමාන්‍ය දර්ශකය | |
| | 2022 | 2023 | 2024 | 2022 | 2023 | 2024 | 2023 | 2024 | 2023 | 2024 |
| නා.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 47.32 | 53.66 | **61.63** | 53.99 | 53.30 | **58.56** | 13.39 | **14.86** | -1.28 | **9.87** |
| මූ.ස.වි.අ.-මුදල් වර්ග 24 පැස අනුව | 79.74 | 70.24 | **76.98** | 77.49 | 71.73 | **74.77** | -11.91 | **9.59** | -7.44 | **4.25** |

(අ) නාමික සඵල විනිමය අනුපාතිකය (නා.ස.වි.අ.) යනු වෙළඳ හවුල්කරුවන් සහ තරඟකාරී රටවල් 24ක නාමික විනිමය අනුපාතිකයන්ගේ බර තැබූ සාමාන්‍යයයි. බර ප්‍රමාණය, මුදල් පැසට ඇතුළත් එක් එක් රට සමඟ සිදු කරන වෙළඳාමෙහි වැදගත්කම මත පදනම් වේ. මූර්ත සඵල විනිමය අනුපාතිකය (මූ.ස.වි.අ.) ගණනය කරනුයේ පැසට ඇතුළත් මුදල් වර්ග අයත් රටවල උද්ධමන වෙනස නා.ස.වි.අ.ට ගැළපීම මගිනි. සෘණ ලකුණින් දර්ශකය අවප්‍රමාණය වීම පෙන්වයි. මූ.ස.වි.අ. කොළඹ පාරිභෝගික මිල දර්ශකය පදනම් කරගෙන ගණනය කර ඇත.

(ආ) විනිමය අනුපාතික දර්ශකයන් අනුව අර්ථ දක්වා ඇති අතර, ඒ අනුව අනෙකුත් ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව රුපියලෙහි අගය අතිප්‍රමාණය වීම/අවප්‍රමාණය වීම සඵල විනිමය අනුපාතිකයන්හි අගය ඉහළ යාම/පහළ යාම මගින් පිළිවෙළින් පිළිබිඹු කෙරෙයි.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

### 1.22 රූප සටහන: සඵල විනිමය අනුපාතික දර්ශක (2017=100) - මුදල් වර්ග 24 පැස අනුව




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

කරමින් නාමික සඵල විනිමය අනුපාතික දර්ශකයන් ඉහළ ගියේය. ඒ අනුව, 2024 වසර තුළ දී මුදල් වර්ග 5කින් සහ 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ නාමික සඵල විනිමය අනුපාතික දර්ශකයන්, පිළිවෙළින්, 14.6%කින් සහ 14.9%කින් ඉහළ ගියේය. පැස තුළ වූ විනිමය අනුපාතිකයන්හි නාමික වෙනස්වීම සහ අදාළ රටවල්වල උද්ධමන වෙනස සැලකිල්ලට ගනු ලබන මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් ද ඉහළ ගියේය. ඒ අනුව, මුදල් වර්ග 5කින් සහ 24කින් සැදුම්ලත් පැස මත පදනම් වූ මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන්, පිළිවෙළින්, 8.9%කින් සහ 9.6%කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, පදනම් වර්ෂයට සාපේක්ෂව විදේශීය තරඟකාරීත්වයේ ඉහළ* යෑමක් පිළිබිඹු කරමින් මූර්ත සඵල විනිමය අනුපාතික දර්ශකයන් පදනම් වර්ෂයේ (2017=100) මට්ටමට වඩා බෙහෙවින් පහළ මට්ටමක පැවතුණි.

## 1.5 රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රවණතා

### 1.5.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්

**ආදායම් වැඩිදියුණු කිරීම සහ වියදම් තාර්කීකරණය සඳහා වන දැඩි ක්‍රියාමාර්ග එලෙස ම පවත්වාගෙන යෑම, 2024 වසර තුළ දී ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් කැපී පෙනෙන අයුරින් වර්ධනය වීමට හේතු විය.** ඒ අනුව, සමස්ත අයවැය හිඟයෙන් පොලී ගෙවීම් ඉවත් කිරීම මගින් ගණනය කෙරෙන ප්‍රාථමික ශේෂය, තවදුරටත් වර්ධනය වෙමින් 2023 වසරේ දී වාර්තා කරන ලද ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 0.6%ක (රුපියල් බිලියන 173ක) අතිරික්තයට සාපේක්ෂව 2024 වසරේ දී ද.දේ.නි.යෙන් 2.2%ක (රුපියල් බිලියන 650ක) කැපී පෙනෙන අතිරික්තයක් වාර්තා කළේය. එය ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ 2024 වසර සඳහා ඉලක්කකර තිබූ රුපියල් බිලියන 300ක ප්‍රාථමික ශේෂ ඉලක්කය අභිබවා යෑමකි. අභියෝගාත්මක සමාජ දේශපාලන වාතාවරණයක් මධ්‍යයේ අඛණ්ඩව වසර දෙකක් ප්‍රාථමික අතිරික්තයන් වාර්තා කිරීම ප්‍රශංසනාත්මක තත්ත්වයකි. රාජ්‍ය මූල්‍ය සහ ණය තිරසාරභාවය ප්‍රවර්ධනය කිරීම සහ ඉතා වෙහෙස වී ළඟා කර ගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය ආරක්ෂා කිරීම සඳහා ධනාත්මක ප්‍රාථමික ශේෂයක් පවත්වා ගැනීම ඉතා වැදගත් වේ. මේ අතර, 2023 වසරේ දී ද.දේ.නි.යෙන් 6.0%ක් (රුපියල් බිලියන 1,651ක්) වූ ජංගම ගිණුමේ හිඟය 2024 වසරේ දී ද.දේ.නි.යෙන් 4.4%ක් (රුපියල් බිලියන 1,309ක්) දක්වා අඩු වී ඇති අතර 2023 වසරේ දී ද.දේ.නි.යෙන් 8.3%ක් (රුපියල් බිලියන 2,282ක්) සහ 2024 සඳහා කරන ලද අයවැය ඇස්තමේන්තුවෙහි ද.දේ.නි.යෙන් 9.1%ක් (රුපියල් බිලියන 2,851ක්) වූ හිඟයට සාපේක්ෂව, සමස්ත අයවැය හිඟය 2024 වසරේ දී ද.දේ.නි.යෙන් 6.8%ක් (රුපියල් බිලියන 2,040ක්) දක්වා අඩු විය.[23]

### 1.5.2 රජයේ ආදායම, වියදම සහ ශුද්ධ ණය

#### රජයේ ආදායම

**ආදායම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම සමඟ 2024 වසරේ දී රජයේ ආදායම පෙර වසරට සාපේක්ෂව නාමික වශයෙන් සහ ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සැලකිය යුතු වර්ධනයක් වාර්තා කළේය.** ඒ අනුව, නාමික වශයෙන් රජයේ ආදායම 32.2%ක වාර්ෂික වර්ධනයක් 2024 වසරේ දී වාර්තා කළේය. 2023 සහ 2024 වසර දෙක තුළ දී අඛණ්ඩව ප්‍රතිශතාංක 2කට වඩා වැඩි වාර්ෂික වර්ධනයක් සහිත ව, 2024 වසරේ දී රජයේ ආදායම

* මෙය මාර්ගගත ප්‍රකාශනයේ නිවැරදි කර ඇත.

23 බැංකු නැවත ප්‍රාග්ධනීකරණය සඳහා රුපියල් බිලියන 450ක ප්‍රතිපාදන, 2024 සඳහා වන අයවැය හිඟ ඇස්තමේන්තුව තුළ ඇතුළත් වේ.

**1.20 සංඛ්‍යා සටහන: රාජ්‍ය මූල්‍ය කටයුතු පිළිබඳ සම්පිණ්ඩනය**

| ශීර්ෂය | 2023 | 2024 (අ) | 2023/2024 නිරපේක්ෂ වෙනස | 2023/2024 (%) වෙනස |
|---|---|---|---|---|
| රුපියල් බිලියන | | | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | **3,074.3** | **4,090.8** | **1,016.5** | **33.1** |
| මුළු ආදායම | 3,048.8 | **4,030.8** | 982.0 | 32.2 |
| බදු ආදායම | 2,720.6 | **3,704.6** | 984.0 | 36.2 |
| බදු නොවන ආදායම | 328.3 | **326.3** | -2.0 | -0.6 |
| ප්‍රදාන | 25.5 | **60.0** | 34.5 | 135.2 |
| **වියදම් සහ ශුද්ධ ණය දීම්** | **5,356.6** | **6,130.7** | **774.1** | **14.5** |
| පුනරාවර්තන | 4,699.7 | **5,339.9** | 640.3 | 13.6 |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් | 656.9 | **790.8** | 133.9 | 20.4 |
| එයින් රාජ්‍ය ආයෝජන | 932.7 | **817.1** | -115.7 | -12.4 |
| **වර්තන ගිණුමේ ශේෂය** | **-1,650.9** | **-1,309.1** | | |
| **ප්‍රාථමික ශේෂය** | **173.3** | **649.6** | | |
| **සමස්ත අයවැය ශේෂය** | **-2,282.3** | **-2,039.9** | | |
| **මූල්‍යනය** | **2,282.3** | **2,039.9** | **-242.3** | **-10.6** |
| විදේශීය මූල්‍යනය | 494.7 | **333.2** | -161.4 | -32.6 |
| දේශීය මූල්‍යනය | 1,787.6 | **1,706.7** | -80.9 | -4.5 |
| ද.දේ.නි.යෙහි (%) ලෙස (ආ) (ඇ) | | | | |
| **මුළු ආදායම සහ ප්‍රදාන** | 11.2 | **13.7** | | |
| මුළු ආදායම | 11.1 | **13.5** | | |
| බදු ආදායම | 9.9 | **12.4** | | |
| බදු නොවන ආදායම | 1.2 | **1.1** | | |
| ප්‍රදාන | 0.1 | **0.2** | | |
| **වියදම් සහ ශුද්ධ ණය දීම්** | 19.5 | **20.5** | | |
| පුනරාවර්තන | 17.1 | **17.9** | | |
| ප්‍රාග්ධන සහ ශුද්ධ ණය දීම් | 2.4 | **2.6** | | |
| එයින් රාජ්‍ය ආයෝජන | 3.4 | **2.7** | | |
| **වර්තන ගිණුමේ ශේෂය** | -6.0 | **-4.4** | | |
| **ප්‍රාථමික ශේෂය** | 0.6 | **2.2** | | |
| **සමස්ත අයවැය ශේෂය** | -8.3 | **-6.8** | | |
| **මූල්‍යනය** | 8.3 | **6.8** | | |
| විදේශීය මූල්‍යනය | 1.8 | **1.1** | | |
| දේශීය මූල්‍යනය | 6.5 | **5.7** | | |

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු 18 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) උපයෝගී කොටගෙන ඇත.


මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 13.5%ක් දක්වා වැඩි විය. ආදායම් බදු, එකතු කළ අගය මත බද්ද (VAT), නිෂ්පාදන /සුරා බදු (Excise duty), ආනයන බදු, විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (SCL) සහ සමාජ ආරක්ෂණ දායක බද්ද (SSCL) යන බදුවලින් එකතු වූ බදු ආදායම් වැඩි වීම, 2024 වසරේ දී රජයේ ආදායමේ මෙම සැලකිය යුතු වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය. 2023 වසරේ දී පුද්ගලික ආදායම් බදු සහ සංස්ථාපිත ආදායම් බදු සඳහා ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය වෙනස්කම්හි පූර්ණ බලපෑම සහ ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම 2024 වසරේ දී ආදායම් බදු ආදායම ඉහළ යෑමට හේතු විය.

**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය ආදායම් පරිපාලනය වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග 2024 වසරේ බදු ආදායම් ඉහළ නැංවීමට හේතු විය.** එවැනි ප්‍රධාන ක්‍රියාමාර්ග අතරට ඉහළ වත්කම් සහිත පුද්ගල අංශය (High Wealth Individual Unit) සහ ආදායම් බදු අත්තිකාරම් අධීක්ෂණ ඒකකය (Advance Income Tax Monitoring Unit) පිහිටුවීම මෙන්ම බදු අනුකූලතාව ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් බදු ලියාපදිංචිය අනිවාර්ය කිරීම යනාදිය ඇතුළත් වේ. මීට අමතරව, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරන බැංකු සහ බැංකු නොවන මූල්‍ය ආයතන ඇතුළු සියලු මූල්‍ය ආයතන, සහ කොළඹ කොටස් හුවමාරුව යන ආයතන මේ වන විට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ බදු පදනම පුළුල් කිරීම සඳහා පහසුකම් සැලසීම උදෙසා තොරතුරු හුවමාරු කර ගැනීමට බැඳී සිටී. සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන කාණ්ඩ දෙකෙහි ම, 2023 වසරේ 879,778ක් වූ ලියාපදිංචි ආදායම් බදු ගෙවන්නන්ගේ සංඛ්‍යාව 2024 වසරේ 1,485,777ක් දක්වා ඉහළ යාම මගින් මෙම ප්‍රයත්න වල බලපෑම පිළිබිඹු වේ. ඒ අනුව, 2023 වසරට සාපේක්ෂව 2024 වසරේ දී ආදායම් බදු එක්රැස් කිරීම 12.6%කින් (රුපියල් බිලියන 114.8කින්) ඉහළ ගොස් ඇත. මේ අතර, එකතු කළ අගය මත බදු සඳහා පැවති බදු නිදහස් කිරීම් බහුතරයක් ඉවත් කිරීම, එකතු කළ අගය මත බදු සඳහා වන ලියාපදිංචි සීමාව වසරකට රුපියල් මිලියන 80 සිට රුපියල් මිලියන 60ක් දක්වා අඩු කිරීම, එකතු කළ අගය මත බදු අනුපාතය 18%ක් දක්වා ඉහළ නැංවීම සමඟ ආනයන සීමා ලිහිල් කිරීම සහ ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම 2024 වසරේ දී එකතු කළ අගය මත බදු ආදායමේ කැපී පෙනෙන වර්ධනයට දායක විය. මේ හේතුවෙන්, එකතු කළ අගය මත බදු ආදායම පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී, 88.6%ක වර්ධනයක් (රුපියල් බිලියන 615.2කින්) වාර්තා කරන ලදී. එකතු කළ අගය මත බදු එක්රැස් කිරීම ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් දියත් කළ එකතු කළ අගය මත බදු අනුකූලතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (VAT Compliance Improvement Project) ආරම්භ කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දරන ලද ප්‍රයත්නය මගින් මෙම ප්‍රතිසංස්කරණ තවදුරටත් ශක්තිමත් විය.

**මේ අතර, පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී නිෂ්පාදන/සුරා බදුවලින් ලද ආදායම 27.4%ක (රුපියල් බිලියන 128.9ක) වර්ධනයක් වාර්තා කළේය.** 2023 වසරේ ජූනි මාසයේ සිට හඳුන්වා දුන් වාර්ෂික උද්ධමන ගැළපුම් දර්ශක මත පදනම්ව මෙම වසර ආරම්භයේ දී මද්‍යසාර මත නිෂ්පාදන/සුරා බද්ද 14%කින් ඉහළ නැංවීම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2024 වසර තුළ සියලු වර්ගවල ශුද්ධ ඛනිජ තෙල් නිෂ්පාදන ආනයනය ඉහළ යාම හේතුවෙන් ඛනිජ තෙල් මත නිෂ්පාදන බදු එක්රැස් කිරීම ඉහළ යාම ද මෙම වැඩි වීමට දායක විය. ආනයන බදු (CID) සහ විශේෂ වෙළඳ භාණ්ඩ බදුවලින් ඇතුළුව 2024 වසරේ දී ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධව එකතු වූ බදු ආදායම, පිළිවෙළින්, 5.7%කින් සහ 124.4%කින් වර්ධනය විය. ආනයන පරිමාව ඉහළ යාම, සීනි සහ අර්තාපල් සඳහා පැවති විශේෂ

**1.23 රූප සටහන: රාජ්‍ය ආදායමේ සංයුතිය - 2024**




මූලය: මුදල්, ක්‍රමසම්පාදන හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය


වෙළඳ භාණ්ඩ බදු අනුපාත ඉහළ නැංවීම සහ 2023 වසරේ මාර්තු මාසයේ සිදු කළ ආනයන බදු ඉහළ නැංවීමේ සංශෝධනයෙහි බලපෑම මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මේ අතර, ආනයන ඉහළ යාම සහ තෝරා ගත් ආනයනික භාණ්ඩ ආනයනය මත සෙස් බදු (CESS) අනුපාත ඉහළ යාම හේතුවෙන් සෙස් බද්දෙන් ලද ආදායම ද සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර, එය 41.9%ක වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, තීරු බදු නොවන බදු වර්ග ක්‍රමයෙන් ඉවත් කිරීමට 2023 වසර තුළ දී ගත් ප්‍රතිපත්තිමය තීරණයෙහි බලපෑම හේතුවෙන් වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්දෙන් ලද ආදායම 3.1% කින් පහළ ගියේය. තවද, 2022 වසරේ අග භාගයේ දී, ආදායම් වැඩිදියුණු කිරීමේ ක්‍රියාමාර්ග යටතේ හඳුන්වා දුන් නව බද්ද වන සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද පෙර වසරට සාපේක්ෂව 2024 වසරේ දී 16.0%ක වර්ධනයක් වාර්තා කළේය. 2024 වසරේ ජනවාරි මාසයේ සිට බල පැවැත්වෙන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත හෙළීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. සැලකිය යුතු ඉහළ යාමක් වාර්තා වුවත්, 2024 වසරේ බදු ආදායම් එකතුව 2024 ජාතික අයවැයේ ආදායම් ඇස්තමේන්තුවට (රුපියල් බිලියන 3,820) වඩා රුපියල් බිලියන 115කින් (3%කින්) අඩු වී ඇත. කෙසේ වෙතත්, 2024 වසරේ මධ්‍යම රජයේ බදු ආදායම ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ පැවති රුපියල් බිලියන 3,700ක් වූ බදු ආදායම් ඉලක්කය ඉක්මවා ගියේය. 2023 වසරේ දී ක්‍රියාත්මක කරන ලද ආදායම් බදු ප්‍රතිසංස්කරණවලින් පසුව සෘජු හා වක්‍ර බදු අනුපාතය 2023 වසරේ දී 33:67 අනුපාතයක් ලෙස සෘජු බදු වෙත නැඹුරු වී තිබුණ ද, 2024 වසරේ දී හඳුන්වා දුන් එකතු කළ අගය මත බදු ප්‍රතිසංස්කරණ සමග, එම අනුපාතය 28:72ක් ලෙස වාර්තා කරමින් නැවත වරක් වක්‍ර බදු දෙසට නැඹුරු විය. බදු පදනම සහ බදු අනුකූලතාව පුළුල් කිරීම සඳහා දැනට සලකා බලනු ලබන ක්‍රියාමාර්ග හේතුවෙන් මෙම අනුපාතය ඉදිරි කාල වකවානුව තුළ දී ක්‍රමයෙන් වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**මේ අතර, ප්‍රධාන වශයෙන් රජය සතු ව්‍යවසායයන්ගෙන් ලද ලාභ සහ ලාභාංශ පැවරුම් අඩු වීම හේතුවෙන් 2024 වසරේ දී බදු නොවන ආදායම නාමික වශයෙන් මෙන්ම ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ද සුළු වශයෙන් අඩු විය.** කෙසේ වෙතත්, 2024 වසර තුළ දී පොලී ආදායම්, දඩ මුදල්, ගාස්තු හා අයකිරීම් සහ සමාජ ආරක්ෂණ දායකත්ව අරමුදල් වැනි ප්‍රභවයන්ගෙන් රජය ලද බදු නොවන ආදායමෙහි වාර්තා වූ වාර්ෂික ලක්ෂ්‍යමය වර්ධනය හේතුවෙන් මෙම අඩු වීමෙහි බලපෑම අවම කෙරිණි.

## වියදම් සහ ශුද්ධ ණය දීම්

**2024 වසරේ ඇස්තමේන්තුගත අයවැය වියදමට සාපේක්ෂව සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම් නාමික වශයෙන් සහ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සැලකිය යුතු අඩුවීමක් වාර්තා කළේය.** 2024 වසරේ සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම් අයවැය ඇස්තමේන්තුවෙන් 88% ක් පමණක් වූ අතර, පෙර වසරට සාපේක්ෂව නාමික වශයෙන් සමස්ත වියදම් සහ ශුද්ධ ණය දීම් 14.5%කින් ඉහළ ගියේය. මේ අතර, 2024 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස වියදම් 20.5%ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගියේය. 2024 වසරේ සමස්ත පුනරාවර්තන වියදමෙන් 50.4%ක් ලෙස 2024 වසරේ දී ද පොලී වියදම ඉහළ මට්ටමක පැවතුණි. මෙය පසුගිය වසරේ වාර්තා වූ 52.3%ක අගයට සාපේක්ෂව සුළු වැඩිදියුණු වීමකි. 2024 වසරේ දී රජයේ සුරැකුම්පත් වෙළඳපොළෙහි පැවති අඩු පොලී අනුපාතවලට සමගාමීව 2024 වසරේ දේශීය පොලී වියදම 1.8%කින් (රුපියල් බිලියන 43.1කින්) සුළු වශයෙන් අඩු වූ අතර, විදේශීය පොලී වියදම රුපියල් බිලියන 277.0කින් ඉහළ ගියේය. විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම සම්පූර්ණයෙන් ම පාහේ අවසන් කිරීම හේතුවෙන් වසරේ අවසාන භාගයේ දී විදේශීය පොලී ගෙවීම්වල වැඩිවීමක් වාර්තා විය. මේ අතර, ආර්ථික දුෂ්කරතා පවතින අවස්ථාවල දී ආර්ථිකයේ අවදානමට ලක්විය හැකි කොටස් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, විශ්‍රාම වැටුප් ගෙවීම්, සමාජ ආරක්ෂණ ජාල සහ නොමිලේ ඖෂධ ලබාදීම සඳහා

**1.24 රූප සටහන: රාජ්‍ය පුනරාවර්තන වියදමේ සංයුතිය - 2024**





මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

1


## 1.8 විශේෂාංග රූප සටහන්
## රාජ්‍ය ආදායම, වියදම සහ ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන්

**රාජ්‍ය ආදායම**





මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**රාජ්‍ය වියදම**





මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් (ද.දේ.නි.යෙහි % ලෙස)**




මූලය: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

**මධ්‍යම රජයේ නොපියවූ ණය***




මූලයන්: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

*2024 වාර්ෂික ආර්ථික විවරණයෙහි 1.21 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පාද සටහන බලන්න

අඛණ්ඩව පැවති අයවැය හිඟයන් ඇතුළුව දශක ගණනාවක් තිස්සේ පැවති රාජ්‍ය මූල්‍ය අංශයේ අසමතුලිතතාවයන් 2022 දී තීරණාත්මක ස්ථානයකට ළඟා විය. රාජ්‍ය මූල්‍ය අංශයේ අඛණ්ඩව පැවති ගැටලුකාරී තත්ත්වයන්, නොගැලපෙන ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ ආර්ථික බිඳවැටීම හේතුවෙන් මෙම අර්බුදය ඇති විය. ඊට ප්‍රතිචාර වශයෙන්, 2022 මැද භාගයේ සිට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන (IMF-EFF) යටතේ, ආදායම් මත පාදක වූ රාජ්‍ය මූල්‍ය ගැළපීම් කෙරෙහි අවධානය යොමුකරමින් රජය රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය දියත් කළේය. මෙම ක්‍රියාමාර්ග, රාජ්‍ය ආදායම් ශක්තිමත් ලෙස වර්ධනය වීම, වියදම් පාලනය කර ගැනීම, සහ ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ශේෂයන් කැපී පෙනෙන ලෙස වැඩිදියුණු වීම මගින් පෙන්නුම් කරන සැලකිය යුතු පරිවර්තනයකට තුඩු දී ඇත.

2024 වන විට, අඛණ්ඩව දෙවන වසරටත් ධනාත්මක ප්‍රාථමික ශේෂයක් රාජ්‍ය මූල්‍ය අංශය අත්කර ගත්තේය.

මෙම ප්‍රවණතාව, ප්‍රතිපත්තිමය වෙනස්කම් නොමැතිව පවත්වා ගැනීම ඉතා වැදගත් වන අතර, අපේක්ෂිත රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය සහ ණය අඩු කර ගැනීම සඳහා ගනු ලබන උත්සාහයන්ගෙන් සිදුවන ඕනෑම අනපේක්ෂිත වෙනස්වීමකින්, ඉතා අපහසුවෙන් උපයාගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය අඩපණ විය හැක.

දරන ලද වියදම් ඉහළ යෑම හේතුවෙන් 2024 වසරේ දී රජය විසින් ලබා දෙන සහනාධාර සහ පැවරුම් 22.8% කින් (රුපියල් බිලියන 228.6කින්) ඉහළ ගියේය. 2024 වසරේ දී, අස්වැසුම සුබසාධන ප්‍රතිලාභ යෝජනා ක්‍රමය සඳහා රුපියල් බිලියන 186.4ක් වැය කර ඇති අතර, එය සමස්ත සහනාධාර සහ පැවරුම් වියදමෙන් 15.1% ක් විය. තෝරාගත් අඩු ආදායම්ලාභී පවුල් 1,717,262ක් වෙත කරනු ලැබූ මුදල් පැවරුම් සහ වැඩිහිටි, ආබාධිත

ප්‍රජාව සහ වකුගඩු රෝගීන් සඳහා කරන ලද ගෙවීම් මෙයට ඇතුළත් විය. 2024 වසර තුළ දී ජීවන වියදම් දීමනාව ඉහළ දැමීම හේතුවෙන්, 2024 වසරේ දී වැටුප් හා වේතන සඳහා වන වියදම පසුගිය වසරට සාපේක්ෂව 13.5%කින් (රුපියල් බිලියන 126.6කින්) ඉහළ ගියේය. 2024 වසරේ දී ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් 20.4% ක වාර්ෂික ඉහළ යෑමක් වාර්තා කළ ද, පසුගිය වසරට සාපේක්ෂව ප්‍රාග්ධන වියදම් 15.0%කින් (රුපියල් බිලියන 137.0) පහළ ගියේය. 2024 වසරේ යම් අපේක්ෂිත විදේශ මූල්‍යනයන් නොලැබීම හේතුවෙන් ප්‍රාග්ධන වියදම් අයවැය ප්‍රතිපාදනවලින් 61.6%කට පමණක් සීමා වූ අතර, එය අයවැය ඇස්තමේන්තුවෙහි ප්‍රාග්ධන වියදම් වන රුපියල් බිලියන 1,260ට වඩා සැලකිය යුතු ලෙස අඩු අගයකි. ඒ අනුව, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස ප්‍රාග්ධන වියදම් 2.6%ක් පමණක් විය. රාජ්‍ය මූල්‍ය අංශයේ වියදම් කිරීමේ හැකියාව සීමාසහිත වීම හේතුවෙන් ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා වියදම් කිරීම අඛණ්ඩව අඩු වීම රටේ ආර්ථික වර්ධන හැකියාවට සහ සමාජ සංවර්ධනයට දිගුකාලීන අහිතකර බලපෑම් ඇති කිරීමට හැකියාව පවතී.

### 1.5.3 අයවැය හිඟය මූල්‍යනය

**විදේශීය මූල්‍යන මූලාශ්‍ර වෙත ප්‍රවේශ වීම සඳහා පවතින සීමා හේතුවෙන්, 2024 වසරේ දී අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා රජය මූලිකවම දේශීය මූලාශ්‍ර මත තවදුරටත් රඳා පැවතුණි.** සමස්ත ශුද්ධ දේශීය මූල්‍යනය ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත් මගින් සිදු කෙරිණි. ඒ අනුව, භාණ්ඩාගාර බිල්පත් මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2023 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 2,058.6ක[24] සිට 2024 වසරේ දී රුපියල් බිලියන 266.1ක් දක්වා කැපී පෙනෙන අඩුවීමක් වාර්තා කළේය. ඒ අතරම, භාණ්ඩාගාර බැඳුම්කර මගින් සිදු කළ ශුද්ධ මූල්‍යනය, 2023 වසරේ දී වාර්තා වූ රුපියල් බිලියන 692.3ක[24] සිට 2024 වසරේ දී රුපියල් බිලියන 1,544.3ක් දක්වා ඉහළ ගියේය. මේ අතර, ආසියානු සංවර්ධන බැංකුව, ප්‍රතිසංස්කරණය සහ සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව, ජපාන රජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය වෙතින් හිමි වූ අරමුදල් ඇතුළුව ද්විපාර්ශ්වික සහ බහුපාර්ශ්වික ණයහිමියන්ගෙන් ණය වශයෙන් ලැබුණු රුපියල් බිලියන 465.4ට (ආසන්න වශයෙන් එ. ජ. ඩො. බිලියන 1.5ට) අමතරව, අයවැයට සහාය ලබා දීම සඳහා ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම යටතේ රුපියල් බිලියන 101.5ක් (ආසන්න වශයෙන් එ. ජ. ඩො. මිලියන 336ක්), විදේශ මූල්‍යනය සඳහා රජයට හිමි විය. මෙම අරමුදල් රජයේ ආර්ථික ස්ථායීකරණ වැඩසටහනට සහාය වීම, සමාජ ආරක්ෂණ ජාල ශක්තිමත් කිරීමට සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා ලබා දී ඇත.

24 2023 සඳහා රජයේ සුරැකුම්පත්වලට අදාළ සංඛ්‍යාලේඛන තුළ දේශීය ණය ප්‍රශස්තකරණ ක්‍රියාවලියට අදාළ ගනුදෙනුවල බලපෑම ඉවත් කර සලකා බලා ඇත.

### 1.5.4 මධ්‍යම රජයේ ණය[25]

**ප්‍රධාන වශයෙන් නාමික දළ දේශීය නිෂ්පාදිතයේ ශක්තිමත් වර්ධනය සහ ශ්‍රී ලංකා රුපියලෙහි අගය ඉහළ යෑමෙන් විදේශ මුදල්වලින් නාමනය කරන ලද ණය මත ඇති වූ බලපෑම හේතුවෙන්, මධ්‍යම රජයේ නොපියවූ ණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2023 වසර අවසානයට පැවති 104.7% සිට 2024 අවසානය වන විට 96.1%ක් දක්වා පහත වැටුණි.** ඒ අනුව, දේශීය ණය සහ විදේශ ණය, ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස, 2023 අවසානය වන විට, පිළිවෙළින්, 62.2%ක් සහ 42.5%ක් වූ අතර 2024 අවසානය වන විට, පිළිවෙළින්, 61.2%ක් සහ 34.9%ක් දක්වා අඩු විය. කෙසේ වෙතත්, වසර තුළ දේශීය ණය වැඩිවීම විදේශ ණය පහත වැටීම සමඟ ගැළපුම් ගත වීම නිසා නාමික වශයෙන්, සමස්තයක් ලෙස මුළු ණය නොවෙනස්ව 2024 අවසානයට රුපියල් ට්‍රිලියන 28.7ක ප්‍රමාණයක පැවතිණි. විදේශ මූල්‍යනය සඳහා ඇති සීමිත ප්‍රවේශය මධ්‍යයේ රජය තම අයවැය හිඟය මූල්‍යනය කිරීම සඳහා දේශීය වෙළඳපොළ මත යැපීම ඉහළ යාම මුළු දේශීය ණයෙහි නාමික වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. දේශපාලනික සහ රාජ්‍ය මූල්‍ය අංශවල අවිනිශ්චිතතාවන් පහව යාමත් සමඟ, දිගු කාලීන රාජ්‍ය සුරැකුම්පත් ආයෝජනය වෙත වෙළඳපොළේ ඇති ප්‍රවණතාවය ඉහළ ගියේය. 2024 වසර තුළ වෙළඳපොළ පොලී අනුපාත පහත වැටීමත් සමඟ දිගු කාලීන කල්පිරීම් සහිත උපකරණ හරහා ණය ගැනීමට රජය දැක්වූ කැමැත්තට මෙය අනුකූල විය. කල්පිරීම් දීර්ඝ වීම හේතුවෙන්, මුළු දේශීය ණයෙහි ප්‍රතිශතයක් ලෙස මැදි කාලීන සහ දිගු කාලීන දේශීය ණය කොටස 2023 දෙසැම්බර් අවසානයේ පැවති 74.2%ට සාපේක්ෂව 2024 වසර අවසන් වන විට 78.9%ක් දක්වා වැඩි විය. ප්‍රධාන විදේශ මුදල් වර්ගවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය ඉහළ යාම 2023 අවසානයට සාපේක්ෂව 2024 අවසානය වන විට නාමික වශයෙන් විදේශ ණය අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, මුළු මධ්‍යම රජයේ ණයෙහි නොපියවූ විදේශ ණය කොටස, 2023 වසර අවසානයේ පැවති 40.6% සිට 2024 වසර අවසානය වන විට 36.3% ක් දක්වා අඩු වෙමින් වඩාත් සමබර ණය සංයුතියකට මාරුවීමක් සහ බාහිර අවදානම අඩු කිරීමක් පිළිබිඹු කරයි.

**ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය බොහෝ දුරට සම්පූර්ණ කරමින්, ණය සේවාකරණ ගෙවීම් තාවකාලිකව අත්හිටුවන ලද තත්ත්වයෙන් මිදීම හේතුවෙන්, 2024 වර්ෂය, ශ්‍රී ලංකාවට වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කළේය.** වසර දෙකකට ආසන්න කාලයක් තුළ සිදු කළ සාකච්ඡා අවසන් කරමින්

25 බැංකුවල ඇති රජය සතු තැන්පතු ගැළපුම් කළ පසු ශේෂය රජයේ ණය සංඛ්‍යාලේඛන ලෙස ඉදිරිපත් කර ඇති අතර, මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ අතුරු ප්‍රතිපත්තියට අනුව 2022 අප්‍රේල් 12 වන දිනෙන් පසු කල් ඉකුත් වූ ණය සේවාකරණ ගෙවීම් කිහිපයක් මධ්‍යම රජයේ ණය ඇස්තමේන්තුවෙහි ඇතුළත් නොවේ. මෙම ණය සේවා ගෙවීම් අතුරු ප්‍රතිපත්තියට අනුව ප්‍රාග්ධනීකරණය කර ඇති බවට සැලකෙන බලපෑමට ලක් වූ ණය සඳහා කල් ඉකුත් වූ පොලී ගෙවීම්වලින් සමන්විත වේ.

1

## 1.21 සංඛ්‍යා සටහන: මධ්‍යම රජයේ නොපියවූ ණය (වසර අවසානයේ දී) (අ) (ආ)

| ශීර්ෂය | 2023 | 2024 (ඇ) |
|---|---|---|
| රුපියල් බිලියන | | |
| **දේශීය ණය (ඈ)** | **17,051.9** | **18,309.7** |
| කල්පිරීමේ කාලය අනුව | | |
| කෙටි කාලීන (ඉ) | 3,616.2 | **3,220.1** |
| මැදි හා දිගු කාලීන (ඊ)(උ) | 13,435.6 | **15,089.6** |
| ආයතන අනුව | | |
| බැංකු | 9,102.8 | **9,411.2** |
| බැංකු නොවන | 7,506.3 | **8,158.5** |
| ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු වෙන් කිරීම් (ඌ)(එ) | 442.7 | **739.9** |
| **විදේශීය ණය (ඒ)(ඔ)(ඕ)** | **11,644.1** | **10,429.0** |
| බහුපාර්ශ්වීය | 3,817.0 | **3,773.5** |
| ද්විපාර්ශ්වීය සහ වාණිජ ණය | 7,827.1 | **6,655.6** |
| ව්‍යවහාර මුදල් අනුව | | |
| වි.ගැ.හි. | 1,737.1 | **1,651.1** |
| එ.ජ. ඩොලර් | 7,943.9 | **7,133.4** |
| ජපාන යෙන් | 819.4 | **678.6** |
| යූරෝ | 396.6 | **334.2** |
| වෙනත් | 747.1 | **631.7** |
| **මධ්‍යම රජයේ නොපියවූ මුළු ණය** | **28,695.9** | **28,738.7** |
| ද.දේ.නි.යෙහි (ප්‍රතිශතයක්) ලෙස (ක) | | |
| **මධ්‍යම රජයේ නොපියවූ මුළු ණය** | **104.7** | **96.1** |
| දේශීය ණය | 62.2 | **61.2** |
| විදේශීය ණය | 42.5 | **34.9** |

මූලයන්:මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
ශ්‍රී ලංකා මහ බැංකුව

සටහන: මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (මුදල් අමාත්‍යාංශය) යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවීමත් සමඟ, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනතේ විධිවිධාන මගින් නියම කර ඇති පරිදි, ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය වාර්තා කිරීම සහ ප්‍රකාශයට පත් කිරීමේ වගකීම රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය සතු වේ. ඒ අනුව, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් ප්‍රකාශයට පත් කරනු ලබන කාර්තුමය ණය සංඛ්‍යාලේඛන ප්‍රකාශනය, ණය සංඛ්‍යාලේඛන සඳහා නිල මූලාශ්‍රය ලෙස සලකනු ලැබේ. දත්ත අඛණ්ඩතාව සහතික කිරීම සඳහා මුදල් අමාත්‍යාංශය වෙතින් ලැබෙන දත්ත මත පදනම්ව මෙම ණය දත්ත සංඛ්‍යාලේඛන සම්පාදනය කර ඇත.

(අ) 2014 වසරේ දී ජා.මූ. අරමුදල විසින් ප්‍රකාශයට පත් කරන ලද රාජ්‍ය මූල්‍ය සංඛ්‍යාලේඛන සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශවලට අනුව, නේවාසිකයන් සතු ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ආයෝජන දේශීය ණය යටතේ වර්ගීකරණය කර ඇත. තවද, ණය සංඛ්‍යාලේඛන ශුද්ධ පදනම මත (තැන්පතු ගැළපුම් කළ පසු) ඉදිරිපත් කර ඇත.
(ආ) මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 12 වැනි දින ශ්‍රී ලංකාවේ විදේශ ණය සේවාකරණ පිළිබඳ අන්තර්කාලීන ප්‍රතිපත්තිය ඉදිරිපත් කිරීමෙන් පසුව රජය විසින් ගෙවීමට නියමිතව තිබූ සමහර විදේශ ණය සේවාකරණ ගෙවීම් මධ්‍යම රජයේ නොගෙවූ ණය ඇස්තමේන්තුව තුළ ඇතුළත් නොවේ. අන්තර්කාලීන ප්‍රතිපත්තියට අනුව බලපෑමකට ලක් වූ විදේශ ණය කාණ්ඩවල ප්‍රාග්ධනයට එකතු කළ යුතු, ගෙවීමට නියමිත පොලී ගෙවීම් මෙම නොගෙවූ ණය සේවාකරණ ගෙවීම්වලට අයත් වේ.
(ඇ) තාවකාලික
(ඈ) 2023 සිට දේශීය ණය සංඛ්‍යාලේඛන සැකසීමේ ක්‍රමය වෙනස් කර ඇති අතර, එය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් සනාථ කරන ලද දත්ත මත පදනම්ව සිදු කෙරේ.
(ඉ) අනේවාසික ආයෝජකයන් සතු භාණ්ඩාගාර බිල්පත් වටිනාකම් ඇතුළත් නොවේ.
(ඊ) අනේවාසික ආයෝජකයන් සතු භාණ්ඩාගාර බැඳුම්කර වටිනාකම් ඇතුළත් නොවේ.
(උ) 2023 වසරේ සිට මධ්‍යම රජයේ නොපියවූ ණය යටතට අවශෝෂණය කරන ලද ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව යටතේ පැවැති භාණ්ඩාගාරය විසින් ලබා දී ඇති ඇපකර යටතේ ලබාගත් නොපියවූ ණය ඇතුළත් වන අතර, මුදල්, ක්‍රමසම්පාදන සහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද 2024 කාර්තුව සඳහා වන කාර්තුමය ණය සංඛ්‍යාලේඛන ප්‍රකාශනය අනුව 2024 වසර අවසානයේ දත්ත තුළ සංවර්ධන ව්‍යාපෘති ණය ලෙස වර්ගීකරණය කර ඇති රුපියල් මිලියන 16,267ක නොපියවූ ණය ශේෂය ද ඇතුළත් වේ.
(ඌ) පරම අයිතිකරු සොයා ගැනීමට අපහසු ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ කළ ආයෝජනයන් සඳහා වෙන් කරන ලද සුරැකුම්පත් ඇතුළත් වේ.
(එ) විවට වෙළඳ කටයුතු යටතේ සිදු කරන ලද ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවලට අදාළ ආයෝජන, අදාළ බලපත්‍රලාභී වාණිජ බැංකු හෝ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් යටතේ වෙන් කර ඇත.
(ඒ) මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යංශය මගින් පවත්වාගෙන යන පොදු රාජ්‍ය මණ්ඩලීය මහ ලේකම්-ණය වාර්තාකරණ හා කළමනාකරණ පද්ධතියෙන් පිළිවෙළින් 2024 වසරේ පෙබරවාරි 26 සහ 2025 වසරේ පෙබරවාරි 27 දින ලබා ගත් දත්ත මත පදනම්ව 2023 සහ 2024 වසරවලට අදාළ විදේශීය ණය දත්ත සහ විදේශීය ණය වර්ගීකරණය සකස් කර ඇත.
(ඔ) 2022 දෙසැම්බර් මස සිට, ලංකා විදුලිබල මණ්ඩලය, සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ පැවති ව්‍යාපෘති ණය කිහිපයකට අදාළ නොපියවූ ණය ශේෂයන්, මධ්‍යම රජයේ ණය වෙත ඇතුළත් කර ඇත.
(ඕ) 2024 වසරට අදාළවන දත්ත විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ බලපෑම පිළිබිඹු කරයි.
(ක) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් 2025 මාර්තු 18 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) භාවිත කර ඇති අතර, 2023 වසරට අදාළ දත්ත 2025 මාර්තු 18 වන දින නිකුත් කරන ලද ද.දේ.නි. ඇස්තමේන්තු (2015 පදනම් වර්ෂය) මත පදනම්ව සංශෝධනය කර ඇත.

ශ්‍රී ලංකාව නිල ණයහිමියන්ගේ කමිටුව (Official Creditor Committee) සමඟ අවබෝධතා ගිවිසුමක් (MoU) අත්සන් කිරීම සහ චීනයේ අපනයන-ආනයන බැංකුව සමඟ ණය සඳහා කටයුතු කරන ක්‍රියාමාර්ග පිළිබඳ ගිවිසුමක් අවසන් කිරීමත් සමඟ මෙම ක්‍රියාවලියේ ප්‍රධාන සන්ධිස්ථානයක් 2024 වසරේ ජූනි මාසයේ දී සටහන් විය. එතැන් සිට, ණය සේවාකරණ ගෙවීම් ආරම්භ කිරීම සඳහා රටවල් අනුව ගිවිසුම් සම්පූර්ණ කිරීම සඳහා ද්විපාර්ශ්වික පදනමක් මත සාකච්ඡා පවත්වන ලදී. නිල ණයහිමියන් සමඟ ඇති කරගත් ගිවිසුමට කල්පිරීම දීර්ඝ කිරීම්, 2028 වසර දක්වා ප්‍රාග්ධන සහන කාලයන්, අඩු කළ පොලී අනුපාත සහ 2043 වසරේ දී අවසන් වන ආපසු ගෙවීමේ පහසුකම් සහිත ණය ආපසු ගෙවීම ක්‍රමයෙන් වැඩිවන ආකාරයේ ව්‍යුහයක් සහිත ණය ගෙවීමේ සහන පියවර ඇතුළත් වේ. 2024 දෙසැම්බර් මාසයේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හුවමාරුව සාර්ථකව නිම කිරීම සහ චීන සංවර්ධන බැංකුවේ වගකීම් ප්‍රතිව්‍යුහගත කිරීම සමඟ බාහිර ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ තවදුරටත් ප්‍රගතියක් ඇති විය. එ. ජ. ඩො. බිලියන 3.0ක මූලික ණය තොග අඩු කිරීමක් ඇතුළුව ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම ශ්‍රී ලංකාවට සැලකිය යුතු මූල්‍ය සහනයක්[26] ලැබුණු අතර, මෙම මූලික ණය තොග අඩු කිරීම, ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරවල[27] කොන්දේසි අනුව, ජා.මූ. අරමුදල මගින් නිර්ණය කර ඇති මූලික මට්ටමට සාපේක්ෂව ආර්ථික පසුබෑමක දී එ. ජ. ඩො. බිලියන 4.3ක් දක්වා ඉහළ යා හැකි අතර ආර්ථික අධි ක්‍රියාකාරීත්වයක දී එ. ජ. ඩො. බිලියන 1.8ක් දක්වා අඩු විය හැකිය. ඊට අමතරව, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම ශ්‍රී ලංකාවට, සිව් අවුරුදු ජා.මූ. අරමුදලේ වැඩසටහන් කාලය තුළ ණය සේවාකරණ ගෙවීම් එ. ජ. ඩො. බිලියන 9.6කින් අඩු කිරීමටත්, ශ්‍රී ලංකාවේ බැඳුම්කරවල කූපන් අනුපාතය 4.3%ක් දක්වා 33%කින් අඩු කිරීමටත්, සාමාන්‍ය කල්පිරීමේ කාලය ආසන්න වශයෙන් වසර හයකින් දීර්ඝ කිරීමටත් හේතු විය. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීමෙන් පසුව සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ළඟා කර ගැනීමෙහිලා ශ්‍රී ලංකාවේ ප්‍රගතිය සැලකිල්ලට ගැනීමෙන් පසුව, ප්‍රමුඛ ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් 2024 දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශ මුදල් ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් ඉහළ නංවන ලදී.

26 2025 ජනවාරි 02 දිනැති, මුදල් අමාත්‍යාංශයෙහි ලේකම් විසින් ඉදිරිපත් කරන ලද "ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීම: මූල්‍ය හා ණය තිරසාරභාවය සහතික කිරීම සඳහා අවශ්‍යතාවය, සමස්ත ප්‍රතිඵලය සහ අනාගත ප්‍රතිපත්ති මඟ පෙන්වීම" (Sri Lanka's Public Debt Restructuring : The Need, Overall Outcome and Future Policy Direction to Ensure Fiscal and Debt Sustainability) යන ඉදිරිපත් කිරීම අනුව.

27 ආර්ථික කාර්යසාධනය හා බැඳුණු බැඳුම්කරයක් යනු නිකුත් කරන්නාගේ ආර්ථික ක්‍රියාකාරිත්වය සමඟ බැඳී ඇති ණය උපකරණයකි. මේ පිළිබඳ වැඩි විස්තර 2024 වසරේ ඔක්තෝබර් 4 දිනැති "ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම - නිතර අසනු ලබන ප්‍රශ්න" (International Sovereign Bonds Restructuring - Frequently Asked Questions) පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ මාධ්‍ය නිවේදනයෙන් ලබා ගත හැකිය.

ඒ අනුව, ෆිච් ශ්‍රේණිගත කිරීමේ ආයතනය ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම RD සිට CCC+ දක්වා ඉහළ නැංවූ අතර, මූඩීස් ශ්‍රේණිගත කිරීමේ ආයතනය ඔවුන්ගේ ශ්‍රේණිගත කිරීම Caa1 සිට Ca දක්වා ඉහළ නැංවීය. මෙම ධනාත්මක වර්ධනයන් සහ ජා.මූ. අරමුදලෙහි විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන (IMF-EFF) යටතේ සිදු කෙරෙන ආර්ථික ප්‍රතිසංස්කරණ සඳහා රජයේ අඛණ්ඩ කැපවීමත් සමඟ, ශ්‍රී ලංකාව එම වැඩසටහනේ දක්වා ඇති ණය තිරසාරභාවය පිළිබඳ ඉලක්ක කරා ළඟා වෙමින් සිටී.